# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2018 ඔක්තෝබර්
24 වෙළුම 06 කලාපය

ආධාරය රු 40/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


"ධනපතීන්ට එදිරිව තම විමුක්තිය සඳහා කම්කරු පංතිය ගෙනයන අරගලයේදී ප්‍රජාතන්ත්‍රවාදය අති විශාල තේරුමක් ගෙන දෙයි. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය වූ කලී පසුබා යා නොහැකි සීමාවක් නොවේ. රදලවාදයේ සිට ධනපතිවාදය දක්වා යන මාර්ගයේ සහ ධනපතිවාදයේ සිට කොමියුනිස්ට්වාදය දක්වා යන මාර්ගයේත් අවධිවලින් එකක් පමණකි ප්‍රජාතන්ත්‍රවාදය."

**ලෙනින්**
*රජය හා විප්ලවය,*
*110 පිටුව*

# බඩු මිලට, බදු බරට එරෙහිව
# ජ.වි.පෙ.න් දැවැන්ත විරෝධතාවක්

ජනතාවට දරාගත නොහැකි ලෙසට රට තුළ වේගයෙන් බඩු මිල ඉහළ යාමටත් ආණ්ඩුවේ නාස්තිකාර වියදම් පියවා ගැනීම සඳහා ජනතාව මත අධික බදු බරක් පැටවීමටත් එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ විසින් දැවැන්ත ජනතා විරෝධතාවක් සංවිධානය කිරීමට පියවර ගෙන තිබේ.

රටේ නිෂ්පාදන ආර්ථිකය වර්ධනය නොවීම හමුවේ ආනයන වියදම් ඉහළ යාමත් අපනයන ආදායම් වේගයෙන් කඩා වැටීමත් ගෙවිය යුතු ණය හා පොලී වාරික විශාල වීමත් හමුවේ ලංකාව දැවැන්ත මූල්‍ය අර්බුදයකට මුහුණ දී සිටින අතර රුපියලේ අගය වේගයෙන් පිරිහෙමින් පවතී. මේ තත්වය හමුවේ අලුත් වටයකින් බඩු මිල ඉහළ යමින් ඇති අතර ඛනිජ තෙල්, ගෑස්, බස් හා දුම්රිය ගාස්තු දැනටමත් ඉහළ ගොස් ඇත. ජීවන වියදමට සාපේක්ෂ ලෙස වැටුප් ඉහළ නොයෑම හේතුවෙන් වැඩකරන ජනතාව දැඩි පීඩනයකට ලක්වී සිටින අතර ඉන්ධන මිල වැඩිවීම හේතුවෙන් ධීවර ජනතාවද නිෂ්පාදන වියදම ඉහළයාම හා අස්වනු සඳහා සාධාරණ මිලක් නොමැති වීම හේතුවෙන් ගොවි ජනතාවද ජීවත් වනුයේ අතිශය අසීරු අඩියකය.

රටේ ආර්ථිකය දිනෙන් දින අර්බුදයට යමින් තිබියෙදී ආර්ථික දැක්මක් නොමැති රනිල් - මෛත්‍රී හවුල් ආණ්ඩුව, ඊට මුහුණදීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් නොමැතිව විවිධාකාර පැලැස්තර විසඳුම්වල පිහිට පතමින් සිටී. මේ අතර කිසිදු විකල්ප ආර්ථික දැක්මක් නොමැති පැවති රාජපක්ෂ පාලනය, හුදු ආණ්ඩු විරෝධී සටන්පාඨ පුනරුච්චාරණය කරමින් සිටියද මාධ්‍ය හමුවේත් ජනතාව හමුවේත්

**02වැනි පිටුවට**



රට හදන රට රකින ජනතාවාදී පාලනයක් වෙනුවෙන්...
2018 සැප්තැම්බර් 22 කළුතර නගර ශාලාවේදී

## නව ආර්ථික ප්‍රතිපත්තියක් වෙනුවෙන් පෙළගැසීමට රුපියල කඩා වැටීම හොඳ සංඥාවක්...



ජනතා විමුක්ති පෙරමුණේ නායක
අනුර දිසානායක සහෝදරයා

රුපියල කඩා වැටීම මගින් ජනතාවට මෙතෙක් පැවති පාලනයන්ගේ ආර්ථික ක්‍රමයේ අසාර්ථකත්වය වුවමනාවටත් වඩා පෙන්නුම් කර ඇති බව ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, විනාශකාරී ආර්ථික ප්‍රතිපත්තිවලට එරෙහිව නව ආර්ථික ප්‍රතිපත්තියක් අවශ්‍ය වී ඇති බවත් ජනතාවට ඒ වෙනුවෙන් පෙළගැසීමට රුපියල කඩා වැටීම හොඳ සංඥාවක් ලබාදී ඇති බවත් පෙන්වාදුන්නේය.

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 25වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද කීය.

"ලෝක වෙළඳපොළේ වෙනස්වන ඉල්ලුමට අනුව අප වෙනස් විය යුතුව තිබුණා. අපේ මුළු අපනයන වෙළඳපොළෙම හැකිළුණා. මෙතෙක් රට පාලනය කරපු සියලු නායකයින් මෙයට වගකිව යුතුව තිබෙනවා. නිෂ්පාදනයකින් තොරව වෙළඳපොළ සංසරණවලින් පමණක් ආර්ථිකය ඉදිරියට යනු ඇතැයි සිතීම මිත්‍යාවක්."

## 20වැනි සංශෝධනයේ වාසිය රටේ ජනතාවටයි



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම්
විජිත හේරත් සහෝදරයා

පටු පෞද්ගලික දේශපාලන අරමුණු පසෙකලා 20වැනි සංශෝධනය සම්මත කරගැනීම සඳහා සහාය ලබාදෙන ලෙස දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා ජනතා විමුක්ති පෙරමුණ කිසිදා රට බෙදීමට සහාය නොදෙන බවත් '20' සම්බන්ධයෙන් ජනමත විචාරණයක් අවශ්‍ය වන්නේ නම් වටිනා ඡන්දය රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට පාවිච්චි කරන්නැයි ජනතාවගෙන් ඉල්ලා සිටින බවත් කියා සිටියේය.

ඔහු මේ බව පැවසුවේ පසුගිය 06වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකට සහභාගි වෙමිනි. විජිත හේරත් සහෝදරයා වැඩිදුරටත් මෙසේද පැවසීය.

"20වැනි සංශෝධනයෙන් වාසි ලැබෙන්නේ රටේ ජනතාවටයි. රටට ආදරය කරන කිසිවෙක් මේ සම්බන්ධයෙන් බිය යුතු වන්නේ නැහැ. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ අපි ජනතාවට සහතික වෙනවා රටට අහිතකර කිසිවක් මෙම සංශෝධනයෙන් සිදුවෙන්නේ නැහැ කියලා."


**05 ධනවාදයේ පිරිහීම...**





මේ තත්වය සරල සිනහවකින් බැහැර කළ යුතු තත්වයක් නොවේ. මේ අය මේ විහිළු කරන්නේ රටක...

**07 රුපියල කඩා-වැටීම...**



රුපියල අවප්‍රමාණය වීමෙන් අපනයන ආදායම ඉහළ යන බවත් ඒ නිසා ඩොලරය ශක්තිමත් වන තරමට...

**09 සෝවියට් දේශය...**





අවසාන දිනට පෙර දින තුනෙහි හා රාත්‍රී තුනෙහි වැඩපොළේ එක් කම්කරුවකුදු කම්හලෙන්...

**11 ඉතිහාසය ඇඹුණු...**



ඉතිහාසය හැදෑරිය යුත්තේ විඥානවාදී හෝ පාරභෞතිකවාදී දැක්මක සිට නොව විද්‍යාත්මක...

සංවාදය................ 03
තරුණ................ 04
ආවර්ජනා................ 06
ජාත්‍යන්තර................ 08
කාන්තා................ 10
කාලීන................ 12
වේදිකාව................ 13
විශේෂාංග................ 14


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# සටන් බිම

## වරායේ සේවක මර්දනයට එරෙහි පෙත්සමක්



ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක නිලධාරීන්ට පමණක් අගෝස්තු මස වැටුප් වැඩිකිරීම මගින් ඇතිව තිබෙන වැටුප් විෂමතා හේතුවෙන් පෙළගැසුණු සේවක විරෝධතාවය මර්දනය කිරීම සඳහා වෘත්තීය සමිති නායකයින් රැසක් පිටත වරායන් සඳහා ස්ථාන මාරු කිරීම් සිදු කිරීමට එරෙහිව පෙත්සමක් අත්සන් තැබීම පසුගියදා සිදුවිය. මෙහිදී වරාය අපනයන දොරටුව ඉදිරිපිටින් පෙත්සම අත්සන් කිරීම ආරම්භ වූ අතර වරාය පොදු සේවක සමිතියේ ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයා මෙහිදී පැවසුවේ ආණ්ඩුවත් වරායේ පාලකයිනුත් වෘත්තීය සමිති මර්දනය කරමින් ගෙන යන ක්‍රියාමාර්ගවලට එරෙහිව රට පුරා සිටින සියලු වරායවල සේවකයින් පෙළගැස්වීමට කටයුතු කරන බවය.

## මහාචාර්ය සේනක බිබිලේ 41වැනි ගුණ සමරුව බිබිලේදී




මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ සංවිධානය විසින් සංවිධානය කරන ලද මහාචාර්ය සේනක බිබිලේ 41වැනි ගුණ සමරුව පසුගිය 29වැනි දිනට යෙදී තිබූ අතර ඒ වෙනුවෙන් වන ගුණ සැමරුම් වැඩසටහනක් පසුගිය 30වැනි දින බිබිල බෝධිරුක්ඛාරාම විහාරස්ථානයේදී පැවැත්විණි. මේ සම්බන්ධයෙන් පැහැදිලි කරමින් සංවිධානය මගින් පසුගියදා පැවැත්වූ මාධ්‍ය හමුවකදී එහි කැඳවුම්කරු වෛද්‍ය ජයන්ත බණ්ඩාර පැවසුවේ අප රට මුහුණ දී සිටින ඖෂධ මාෆියාවෙන් ජනතාව මුදාගැනීමට නම් බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගිය යුතු බවය. දනට ආණ්ඩුව මගින් ගෙන එන ලද ඖෂධ පනත මගින් අඩු මිලට ඇති බොහෝ ඖෂධවල මිල කිහිප ගුණයකින් ඉහළ ගොස් ඇති බවත් මේ වන විට රෝහල් තුළ ඉතා බරපතළ ඖෂධ හිඟයක් ඇති බවත්ය.

මේ සම්බන්ධයෙන් දිගින් දිගටම තම සංවිධානය ආණ්ඩුවට බලකර ඇති බවත් මෙවර 41 වැනි ගුණ සමරු වැඩසටහන මගින්ද මේ පිළිබඳව ජනතාව දනුවත් කිරීම සිදුකරන බවය. ඒ අනුව මෙවර බිබිලේදී පැවැත්වූ සමරු වැඩසටහනේදී වෛද්‍ය සායනයක් හා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහනක්ද, සෞඛ්‍ය අර්බුදය පිළිබඳ සයිකෝ චිත්‍රපටය ප්‍රදර්ශනය හා විචාරයක්ද පැවැත්විණි.

## අධ්‍යාපන සමුපකාර පොදු සේවක වාර්ෂික සමුළුව මුළුදෙයි



අධ්‍යාපන සමූපකාර පොදු සේවක සංගමයේ 07වැනි වාර්ෂික සමුළුව පසුගිය 25වැනි දින කොළඹ මහවැලි කේන්ද්‍රයේදී පැවැත්විණි. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සමුළුව සඳහා ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ, සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි මහගමගේ, අධ්‍යාපන සමුපකාර පොදු සේවක සංගමයේ ලේකම් මොනිකා කණ්ඩම්බි යන වෘත්තීය සමිති නියෝජිතයන් ඇතුළු දිස්ත්‍රික් ගණනාවක සාමාජික සාමාජිකාවෝ විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

## වතු කම්කරුවන්ගේ අවම වැටුප රු. 1281ක් කළ යුතුයි

### සමස්ත ලංකා වතු කම්කරු සංගමය



වසර 200ක් තිස්සේ අන්ත දරිද්‍රතාවයෙන් දිවි ගෙවන වතු කම්කරුවන්ට අලුත් ජීවිතයක් ලබාදිය යුතු බවත් ඒ වෙනුවෙන් වූ එක් පියවරක් ලෙස අවම වැටුප රු. 1281/ක් කළ යුතු බවත් සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති ජේ.එම්. ප්‍රේමරත්න සහෝදරයා පසුගියදා පැවති මාධ්‍ය හමුවකදී පැවසීය. වතු කම්කරුවන් සිටින ප්‍රදේශවල දරුවන්ගේ මන්ද පෝෂණය 22%ක් බවද ඔවුන්ගේ ජීවිත නගා සිටුවීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීමට තම සංගමය මැදිහත්වෙමින් සිටින බවද මෙහිදී ජේ.එම්. ප්‍රේමරත්න සහෝදරයා පැවසීය. වතු කම්කරු වැටුප් වැඩිකර ගැනීමේ සාමූහික ගිවිසුම් කාලය අවසන් වී ඇති බවත් නව සාමූහික ගිවිසුමක් සඳහා සාකච්ඡා පවත්වන ලෙස සියලු පාර්ශවයන්ගෙන් ඉල්ලා ඇති බවද මෙහිදී ඔහු පැවසීය. මෙම මාධ්‍ය හමුව සඳහා සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති කේ. සෙල්වරාජ්, උප ලේකම් කේ. කලයිචෙල්වි සහෝදරිය ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ සහභාගි වූහ.

## ලෝක ගුරු සම්මේලනයේ ආසියානු කලාපීය සමුළුව රැස්වේ




ලෝක වෘත්තීය සමිති සමුළුවට (WFTU) අනුබද්ධ ලෝක ගුරු වෘත්තීය සමුළුව පසුගිය සැප්. 14 දින කොළඹ පදනම් ආයතනයේදී පැවැත්විණි. මෙම සමුළුව ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ ප්‍රධාන ලේකම් ජෝර්ජ් මව්රිකෝස් සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අතර ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාද මේ සඳහා සහභාගි විය.

ලෝක ගුරු වෘත්තීය සමිති සම්මේලනයේ ආසියානු කලාපිය උප සභාපති හා ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයින් මේ සඳහා සහභාගි විය. එමෙන්ම මේ සඳහා ඉන්දියාව, නේපාලය, කාම්බෝජය ඇතුළු රටවල් ගණනාවක විදෙස් නියෝජිතයෝ රැසක් සහභාගි වී සිටියහ.

# එතෙරින්...

## 'එතෙර අපි' ප්‍රථම වතාවට මාලදිවයිනට



'එතෙර අපි' සංවිධානයේ මාලදිවයින ශාඛාව පිහිටුවීම 'එතෙර අපි' සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පසුගිය අගෝස්තු මාසයේ 28 දින මාලේ නගරයේදී සිදු කෙරිණි. එතෙර අපි සංවිධානයේ ශාඛාවක් මාලදිවයිනේ ආරම්භ කළ පළමු අවස්ථාව මෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙකු මාලදිවයිනේ සංචාරය කළ පළමු අවස්ථාවද මෙය වේ. මෙහිදී මාලදිවයිනේ සේවය කරන ශ්‍රී ලාංකිකයින්ගේ සුහද හමුවක්ද පැවති අතර සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා විසින් මාලදිවයිනේ ශ්‍රී ලංකා තානාපතිවරයා හමුවී ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ ගැටලු පිළිබඳව සාකච්ඡා කර ඇත.

## විජිත හේරත් කොරියාවේ 'එතෙර අපි' සංචාරයක



පාර්ලිමේන්තුවේ නිල සංචාරයකට එක්වූ ජ.වි.පෙ. පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා කොරියාවේ සෝල් නුවර ශ්‍රී ලාංකිකයින්ගේ හමුවීමකටද පසුගියදා සහභාගි විය. කොරියාවේ එතෙර අපි ශාඛාව සංවිධානය කළ මෙම හමුවේදී කොරියාවේ සේවය කරන ශ්‍රී ලාංකිකයින් මුහුණ දෙන ගැටලු පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කර ඇත. වීසා ගැටලු හා ධීවර රැකියාවන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයින්ගේ ගැටලු පිළිබඳව මූලික වශයෙන් අවධානය යොමුකර ඇති අතර ඉදිරියේදී ශ්‍රී ලංකා රජයට හා කොරියානු කම්කරු ආයතනවල අවධානය සඳහා පෙත්සම් අත්සන් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමටද මෙහිදී යෝජනා ඉදිරිපත්වී ඇත. කොරියාවේ ප්‍රධාන සමාගම් කිහිපයක ශ්‍රී ලාංකිකයින් සේවය කරන ස්ථාන පරික්ෂාවකටද විජිත හේරත් සහෝදරයා 'එතෙර අපි' නියෝජිතයින් සමග සහභාගි වී තිබේ.

## සයිප්‍රසයේ 'එතෙර අපි' වැඩ අරඹයි



සයිප්‍රස්හි 'එතෙර අපි' ශාඛාව විසින් පසුගියදා එහි ශ්‍රී ලංකිකයින් දැනුවත් කිරීමේ අත් පත්‍රිකා බෙදීමේ වැඩසටහනක් පවත්වනු ලැබීය. එහි මූලික අරමුණ සයිප්‍රස්හි 'එතෙර අපි' සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම විය. මෙම අවස්ථාව 'එතෙර අපි' සයිප්‍රස් සභාපති රෝහිත පෙරේරා ඇතුළු පිරිසක් එක්වී සිටි අතර සයිප්‍රස්හි ප්‍රධාන නගරය වන නිකෝෂියාහිදී මෙම වැඩසටහන පැවැත්විණි.

## ඕමානයේදී මුළු දුන් ජාතික විද්වත් කතිකාව




රට රකින රට හදන ජනතාවාදී පාලනයක් උදෙසා රටට ආදරය කරන විද්වතුන්ගේ එකමුතුවෙන් නිර්මාණය වූ ජාතික විද්වත් සංවිධානයේ දිස්ත්‍රික් සමුළුවලට සමගාමීව එතෙර පැවැත්වූ පළමු ජාතික විද්වත් කතිකාව 2018 සැප්තැම්බර් මස 15 දින ඕමානයේ මස්කට්හි අල් මසා ශාලාවේදී 'එතෙර අපි' ඕමාන් ශාඛාවේ මෙහෙයවීමෙන් හා ජාතික විද්වත් සංවිධානයේ සහභාගිත්වයෙන් පැවැත්විණි. මේ සඳහා ජාතික විද්වත් සංවිධානයේ ජාතික කමිටු සාමාජික වෛද්‍ය එච්.පී. ධම්මික සහෝදරයා සහ ඕමානයේ අල් සාදි පුද්ගලික රෝහලේ සේවය කරනු ලබන වෛද්‍ය ප්‍රගීත් අතාවුද මහතා සහභාගි විය. මෙහිදී පැමිණ සිටි ඕමානයේ ලාංකිකයන් විසින් අදහස් සහ යෝජනා ඉදිරිපත් කරන ලදී. එසේම මෙහිදී අදහස් දක්වූ වෛද්‍ය එච්.පී. ධම්මික සහෝදරයා විද්‍යුත් තැපැල් මගින් අදහස් හා යෝජනා ජාතික විද්වත් සභාවේ කමිටු වෙත ලබාදිය හැකි බව දන්වා සිටියේය.

මීට අමතරව සැප්තැම්බර් 15 දිනට පෙර ඕමානයේ ප්‍රදේශ කිහිපයකදීම ශ්‍රී ලාංකික ප්‍රජාව සමග ජාතික විද්වත් සංවිධානයේ සුහද හමු පැවැත්වුණු අතර අදහස් හා යෝජනා ලබාගැනීම සිදු කරන ලදී.

## බඩු මිලට, බදු බරට... පළමු පිටුවෙන්

දැනටමත් ප්‍රදර්ශනය කර ඇත්තේ නව ලිබරල් ආර්ථික ක්‍රමයේ අර්බුදයට තමන් සතුව විසඳුම් නොමැති බවය.

මේ තත්වය තුළ ජනතාව පෙළන ආර්ථික පීඩාවන්ට එරෙහිවීමත් නිෂ්පාදනය දිරිගන්වන හා එහි ප්‍රතිලාභ සියලු දෙනාට ලැබෙන සැබෑ විකල්ප ආර්ථික වැඩපිළිවෙළකට රට අවතීර්ණ කරවීමේ අවශ්‍යතාව ජනතාවට ඒත්තු ගැන්වීමත් අරමුණු කරගනිමින් ජනතා විරෝධතා මාලාවක් සංවිධානය කිරීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කර තිබේ. එහි පළමු විරෝධතාව ඔක්තෝබර් 23වැනි දින කොළඹදී විශාල ජනතා සහභාගිත්වයක් සහිතව පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇතැයි නියමුවා වෙත පැවසූ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා බඩු මිලට, බදු බරට එරෙහි ජනතා විරෝධතාව සඳහා එක්වන ලෙස සියලු ජන කණ්ඩායම්වලින් ඉල්ලා සිටි අතර පැවති හා පවතින ධනේශ්වර ආණ්ඩුවල නොහැකියාව ඉතා හොඳින් ප්‍රකට වී ඇති මේ මොහොත ජනතාවට විකල්ප වැඩපිළිවෙළක් සමග පෙළගැසීමට ඇති හොඳම අවස්ථාව බවද පෙන්වා දුන්නේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## 20වැනි සංශෝධනය හා ජනමත විචාරණය

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා ජ.වි.පෙ. විසින් ඉදිරිපත් කළ 20වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පසුගිය සැප්තැම්බර් 05 දා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් විය. එය '20' සම්මත කරගැනීමේ ක්‍රියාවලියේ වැදගත් සංධිස්ථානයකි. එසේම ජ.වි.පෙ. ලද ජයග්‍රහණයකි. එහෙත් 20වැනි සංශෝධනය තම පටු දේශපාලන අභිලාෂයන්ට බාධාවක් බවට පත්කරගත් දේශපාලන අවස්ථාවාදීහු කිහිපදෙනා ඉන් මහා කලබලයකට පත්වූහ. ඒ '20' පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුල්වීම ඔවුන් ලැබූ දේශපාලන පරාජයක් නිසාත් 20 සම්මත වුවහොත් ඔවුන්ගේ දේශපාලන බල සූදුව අවුල් වන නිසාත්ය. මෙහි ප්‍රතිඵලය වුණේ ඉන් කිහිපදෙනෙකු '20'ට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට යාමය. මේ වනවිට '20' පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය කථානායකවරයාට දන්වා තිබේ. '20' සම්මත කිරීමට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක කැමැත්තට අමතරව ජනමත විචාරණයකින්ද එය සම්මත විය යුතු බව අධිකරණයේ නිගමනය වේ.

පවතින ව්‍යවස්ථාවේ ජනතා පරමාධිපත්‍යට සම්බන්ධ කරුණක් සංශෝධනය වන විට එය ජනමත විචාරණයකට ලක්කිරීමට සිදුවීම පැහැදිලි කරුණකි. ජ.වි.පෙ. '20' ඉදිරිපත් කළේ ඒ පිළිබඳ දැනුවත්කමක සිට ඊටද මුහුණදීමේ සූදානම සහිතවය. එබැවින් අධිකරණ තීරණය බලාපොරොත්තු නොවූ තීරණයක් නොවේ. ඒ නිසාම එය අමතර ගැටලුවක්ද නොවේ.

20වැනි සංශෝධනය සම්මත වුවහොත් 'රට බෙදෙන' බවටත් 'රනිල්ට වාසි සැලසෙන' බවටත් කියමින් 20ට විරුද්ධව බොරු බිල්ලන් මැවූ කිහිපදෙනා මේ වනවිට දේශපාලන වශයෙන් නිරුත්තර වී සිටිති. ආරම්භයේදී '20'ට එරෙහිව ඔවුන් නැගූ හඬ දැන් සිහින් කෙඳිරිල්ලක් බවට පත්ව තිබෙන්නේත් ඔවුනට අධිකරණයට යාමට සිදුවන්නේත් ඒ නිසාය. මහින්ද රාජපක්ෂ වටා සිටින එහෙත් මහින්ද වෙනුවට වෙනත් කෙනෙක් ජනාධිපති කොට ඊට හිලව් ලෙස ඔහුගේ සෙවණේ වරප්‍රසාද වරදාන ලැබීමට සිහින මවන අයට ඒ සඳහා ඇති එකම අවස්ථාව ජනාධිපතිවරණයක් පමණි. එය නැතිවීම තම අනාගතය විනාශවීමක් ලෙස ඔවුහු සිතති. ඔවුන් මේ බොරු බිල්ලන් මවන්නේ එම සැබෑ තක්කඩි අරමුණ වසන් කිරීම සඳහාය. එහෙත් සමාජය එය ගණන් ගෙන නැත.

20වැනි සංශෝධනය යනු මෙරට ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය සවිමත් කිරීමේ අර්ථයෙන් ගත් කළ ඉතා වැදගත් වන්නකි. ප්‍රජාතන්ත්‍රවාදය ගරුකරන කිසිවකුට ඊට එරෙහි විය නොහැක. අනෙක් අතට චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ හා වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන යන සියලුම දෙනා තම ජනාධිපතිවරණ ව්‍යාපාර සෑම එකකදීම ප්‍රධාන පොරොන්දුවක් ලෙස ඉදිරිපත් කළේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවය. එම පොරොන්දු ජනාධිපතිවරණ වේදිකාවල පුනරුච්චාරණය කළ, ඒවා අගය කළ, ඒ වෙනුවෙන් පෙනී සිටි අයම දැන් "රට බෙදෙන" බව පවසා ඊට විරුද්ධවීම දේශපාලන තක්කඩිකමක් මිස අන් යමක් නොවේ. මේ සමහර දෙනා තවම '20' සංශෝධනය කියවා අධ්‍යයනය කරවත් නැත. ඒ ඔවුන්ගේ දේශපාලන බංකොලොත්කමය.

කෙසේ වෙතත් '20'ට එරෙහි වූවන් විසින්ම 20 සම්මත කර ගත යුතු ආකාරය පිළිබඳ නව දේශපාලන තර්කයකට පදනම දමා තිබේ. ඒ, අධිකරණයට ගොස් '20'ට ජනමතවිචාරණයක් ඉල්ලීම නිසාය.

ඔවුන් අධිකරණයට ගියේ ඇයි? '20' නතර කිරීමට අධිකරණයට බලයක් නැත. එයට කළ හැකි උපරිම දෙය මෙය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකට අමතරව ජනමත විචාරණයකට ලක් කොට සෘජු ජනතා කැමැත්තද විමසා බැලිය යුතු බව නිර්දේශ කිරීමය. මෙවැනි වැදගත් සංශෝධනයක් ජනතාව අතර සංවාදයට ලක්ව සෘජු ලෙසම ජනතාවගේ කැමැත්තෙන් සම්මතවීම ඉතාම හොඳය. '20' ගැන අධිකරණයට ගිය අයගේ ඉල්ලීම වූයේද '20' සම්මත කිරීමේ අයිතිය පාර්ලිමේන්තුවට නොදෙන ලෙසය. එය එසේ නම් දැන් ඔවුන් ඔවුන්ගේ තර්කයකටම අනුව කළ යුත්තේ '20' සම්මත කරනවාද නැද්ද යන තීරණය පාර්ලිමේන්තුවට සීමා නොකොට ජනතාව වෙත ඉදිරිපත් කිරීමට ඉඩ සැලසීමය. '20' ජනමත විචාරණයකට ලක්කිරීමේ අවස්ථාව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු විසින් ඇහිරිය යුතු නැත. '20' පිළිබඳ අවසන් තීරණය ජනතාවට බාර කළ යුතු අතර ඒ සඳහා ඔවුන් කළ යුත්තේ පාර්ලිමේන්තුව තුළ '20'ට බාධා නොකර සිටීමය.

'20' සම්මත කිරීමේ අයිතිය පාර්ලිමේන්තුවට නොදිය යුතු නම් '20' පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතියද පාර්ලිමේන්තුව නොගත යුතුය. එය ජනතාවට ලබාදිය යුතුය. එසේ නම් '20'ට විරුද්ධව අධිකරණයට ගිය අය ඇතුළු සියලු දෙනා කළ යුත්තේ '20'ට පාර්ලිමේන්තුවේදී බාධා නොකොට එය ජනමත විචාරණයකට ඉදිරිපත් කිරීමට ඉඩදීමය. එම අභියෝගය ඔවුන් බාර ගත යුතුයයි අපි සිතමු. ඔවුන් ඔවුන්ගේම තර්කයට අනුව කටයුතු කරනු ඇද්දැයි අපි බලා සිටිමු.

අවසාන වශයෙන් කිව යුත්තේ, දශක ගණනාවක් තිස්සේ ජනතාවගේ අපේක්ෂාවක් වූ හා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අත්‍යාවශ්‍ය වූ 20වැනි සංශෝධනය සම්මත කර ගැනීම ජනතාවගේ වගකීමක් ලෙස මෙරට ප්‍රජාතන්ත්‍රවාදී ජනතාව බාරගන්නා දිනෙක ඊට එරෙහි වන සියලු දේශපාලන තක්කඩීන් දේශපාලන කුණු කූඩයට වැටෙන බවය.

# ආණ්ඩුව පෙරළා දැමිය යුත්තේ විකල්ප වැඩපිළිවෙළක් බලයට පත් කිරීමටයි



**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම්**
**විජිත හේරත් සහෝදරයා**

***නියමුවා:- පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ඔබ නමින් ඉදිරිපත් කළ 20වැනි සංශෝධනය පාර්ලිමේන්තුවේ න්‍යායපත්‍රයට ඇතුල්වීමත් සමඟ නැවතත් දේශපාලන කරළියේ සංවාදයට ලක්වෙමින් තිබෙනවා. මේ දක්වා ක්‍රියාවලිය සහ එහි ඉදිරි පියවර ගැන කතා කළොත්.***

***විජිත හේරත් සහෝදරයා:-*** අපි 20වැනි සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට භාරදුන්නා. කථානායකවරයා විසින් එය නීතිපතිවරයාට යොමු කිරීමෙන් අනතුරුව නීතිපතිවරයාගේ නිර්දේශ සහිතව 2018 ජූලි මාසයේ 06වැනිදා ගැසට් පත්‍රයක් ලෙස නිකුත් කළා. ඉන් පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා එය න්‍යාය පුස්තකයට ඇතුළත් කරන ලෙසත් සුදුසු දිනයක් ලබාදෙන ලෙසත් අපි කථානායකවරයාගෙන් ඉල්ලුවා. පසුව පසුගිය 05වැනිදා එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබුණා. එලෙස පූර්ව දැනුම්දීමකින් පසුව අපි මෙය පාර්ලිමේන්තුවට නිල වශයෙන් ඉදිරිපත් කළා. දැන් පාර්ලිමේන්තුවට 20වැනි සංශෝධනය දැන් ඉදිරිපත් කරලා තියෙන්නෙ. මීළඟට තියෙන්නේ අදාළ විෂය භාර ඇමතිවරයාට එය යොමුකිරීමයි. ව්‍යවස්ථා කටයුතු පිළිබඳ වෙනම ඇමතිවරයෙක් නැහැ. ඒ නිසා කථානායකවරයා විසින් අගමැතිවරයාට මෙය යොමුකර තියෙනවා. ඔහුට උපරිම වශයෙන් මාස 06ක කාලයක් තියෙනවා, මේ පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය දැනුම් දෙන්න. ආණ්ඩුවේ ස්ථාවරය අනුව මෙය ඉදිරියට ක්‍රියාත්මකවීම තීරණය වෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයට මේ පිළිබඳව නඩුවක් යොමුකර තිබුණා. ඒ නඩුව දැන් අහලා ඉවරයි. නමුත් එහි තීන්දුව තවම ලැබුණේ නැහැ. ඉදිරි පාර්ලිමේන්තුවේදී එය කථානායකවරයාට ලැබේවි.

මෙය පාර්ලිමේන්තුව තුළ තුනෙන් දෙකේ වැඩි ඡන්දයකින් සම්මත කර රටේ ජනතාව ඉස්සරහට යනවා නම් වඩාත් හොඳයි. ජනමත විචාරණයකදී සියලු ජනතාවට අවස්ථාවක් ලැබෙනවා, ඒකාධිපති බලතල සහිත විධායකයට එරෙහිව තමන්ගේ ඡන්දය පාවිච්චි කරන්න. එහෙම නැතිව 20 පාර්ලිමේන්තුවෙන් පමණක් සම්මත වුවොත් අනාගතේ දවසක පාර්ලිමේන්තුවේ සංයුතිය වෙනස්වූ මොහොතකදී තවත් අයෙකුට පුළුවන් මේ 20 අහෝසි කරලා විධායකය නැවත ගේන්න. පසුගිය කාලේ 17 අහෝසි කරලා 18 ගෙනාවා. 18 වෙනුවට 19 ගෙනාවා. ඊටත් වඩා ඉස්සරහට ගිහිනුයි 20 ගෙනත් තිබෙන්නේ. මෙය සම්මත වෙන්නේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකෙන් පමණක් නම් තවත් කෙනෙකුට පුළුවන් 20ත් අහෝසි කරලා 21 ගේන්න.

> රටේ නිෂ්පාදනය වැඩිකර ජනතාවගේ ආදායම ඉහළ නංවනවායින් මෙහා මේකට උත්තර හොයන්න බැහැ. ඒනිසා අපි රටට ගැලපෙන ආනයන අපනයන ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න ඕනැ. අපේ විනිමය පාලන නීති රීති පසුගිය කාලේ වක්කඩ අරින්නා වගේ සංශෝධනය කරලා දැම්මා. ඒවායේ ප්‍රතිඵල තමා දැන් අපි මේ දකින්නේ. ඒ නිසා ජනතාව තව තවත් අමාරුවේ වැටීම තමා මේ රුපියල කඩා වැටීමත් එක්ක සිදුවී තිබෙන්නේ. ඇත්තටම රුපියල බාල්දුවෙන තත්වෙට ආණ්ඩුවත් බාල්දුවෙලා තිබෙන්නේ.

ඒ නිසා වඩාත් හොඳයි ජනමත විචාරණයකට යන එක. අපි සූදානම් ජනමත විචාරණයකට යන්න. දේශපාලන වශයෙන් 20 ස්ථාවර වෙන්නේ ජනමත විචාරණයකින් මෙය සම්මත වුවොත් පමණයි. ඒ නිසා එය ජනතාව ඉදිරියට යන එක වඩාත් හොඳයි.

***නියමුවා:- 1978 ජේ.ආර්.ගේ ව්‍යවස්ථාව ඒකාධිපති වියරුවක් බව තහවුරු කරවීමට වැඩිම දායකත්වයක් දැක්වූ විධායක ජනාධිපති ධූරය කරපින්නාගෙන යාමට ඇතැමුන් තවමත් උත්සාහ දරනවා. ඇයි ඒ?***

***විජිත හේරත් සහෝදරයා:-*** විධායක ක්‍රමය අහෝසි කරන්න 1994දි චන්ද්‍රිකා බණ්ඩාරනායක පොරොන්දු වුණා. මහින්ද රාජපක්ෂ පොරොන්දු වුණා අවස්ථා දෙක තුනක්ම. මෛත්‍රීපාල සිරිසේන පොදු අපේක්ෂකයා හැටියට පොරොන්දු වුණා. හැබැයි ඒ කිසිකෙනෙක් ඒක කළේ නැහැ. ජනතාව මේ හැමෝටම ඡන්දය දුන්නේ මෙය අහෝසි කරන්න. ජේ.ආර්.ජයවර්ධනගේ සිට මේ ගෙවීගිය කාලය තුළ මේ විධායක බලය නිසා රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති කළා. එපමණක් නොව රටේ ආර්ථිකය විනාශ කළා. ඇත්තෙන්ම ලංකාව ඇවිදින කැරකොප්පුවක් බවට පත්කළේ මේ විධායක ඒකාධිපති බලතලයි. අන්න ඒ නිසායි ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මේ විධායක බලතල අහෝසි කරන්න ඕනැ.

ඒ අතරතුරේ වැලේ වැල් නැති අනාථවෙච්ච තුන්හතර දෙනෙක් ඉන්නවා, මේ පාර්ලිමේන්තුවේ. ඒ අයට තනිවම තරඟ වැදිලා මේ පාර්ලිමේන්තුවට එන්න බැහැ. ඔවුන්ට හාම්පුතෙක් ඕනැ. ඔවුන්ට එහෙයි කියන්න තමන්ගේම ස්වාමියෙක් ඕනැ. එහෙම නැත්නම් ඔවුන්ට පැවැත්මක් නැහැ. එහෙම තුන්හතර දෙනෙක් ඉන්නවා මේ විධායක ක්‍රමය තවම කරපින්නාගෙන යන්න. ඒ තුන්හතර දෙනා තමයි මේ උත්සාහ කරන්නේ මේක කරපින්නාගෙන යන්න. එහෙම නැතිව බහුතරයක් මේකට විරුද්ධ නැහැ.

***නියමුවා:- රුපියල ශීඝ්‍රයෙන් අවප්‍රමාණ වීමත් සමග රටේ ආර්ථික අර්බුදය මතුපිට පැමිණ තිබෙනවා. බඩු මිලෙන් හා ආණ්ඩුවේ බදුවලින් හෙම්බත් වී සිටින ජනතාවට නව තත්වය කවරාකාරයෙන් බලපායිද?***

***විජිත හේරත් සහෝදරයා:-*** ආණ්ඩුව බදු බර වැඩි කළා. බඩු මිල වැඩි කළා. මාසෙන් මාසෙ තෙල් මිල වැඩිකරනවා. ඒ විතරක් නොවෙයි, ඒකත් සමග සියලුම භාණ්ඩවල මිල වැඩිවෙනවා. දත් බුරුසුවෙ, ටූත්පේස්ට් එකේ ඉඳලා මිල වැඩිවෙනවා. එපමණක් නොවෙයි බස්

15 වැනි පිටුවට







# චේ ඔබ එන්න... අපේ හදවතට කියා දෙන්න...

සමාජයක් ලෙස අපගේ අරමුණ කුමක්ද? අප ගමන් කරන්නේ කොයිබටද? අප බලාපොරොත්තු වන සමාජය කෙබඳුද? සමාජයක් ලෙස අපට ලැබී ඇත්තේ කුමක්ද? අප සමාජීය මිනිසුන්ද? යන්න පිළිබඳව මනස තුළ ගොඩනැගෙන විරෝධාකල්ප සිතුවිලි සමුදායකි. එකම සිතුවිල්ලකටවත් පිළිතුරක් ජේනමානයේ නැත. හිස මත ප්‍රශ්න පුරවාගත් රොබෝවරුන් මෙන් ඇවිදින මිනිසුන් හැමතැනය. ගරාවැටීම, බිඳවැටීම, අපේක්ෂාභංගත්වය, එකිනෙක නුරුස්සන, තම සුඛ විවරණය පමණක් පතන මිනිසුන් හැමතැනය. තරුණ අපටත් වෙනම පාරක් වැටී ඇත්ද? කොයිබ හෝ තැනක අපට වැරදී ඇත. අපද පෙර පරපුරෙන් අන්ධානුකරණයෙන් ඇහිදගත් අත්දැකීම් හිසමත ගොඩගසාගෙන පැරණි පාරෙම ගමන් අරඹා ඇත.

මොහොතක් සිතමු. අලුතින් සිතමු. අලුත් පාරක් තනන්නට වෙර දරමු. සාම්ප්‍රදායික ගමන් මඟෙන් වෙනස්ව ගමන් කළ මිනිසුන් ගැන සිතමු. ඔවුන්ට පැමිණි අභියෝගවලට මුහුණදුන් අයුරු ඉගෙන ගනිමු. තනිව සිතන මිනිසෙකු වෙනුවට පොදුවේ හිතන තරුණයෙකු ගොඩනගමු. එවිට උපාධිධාරියා ප්‍රශ්න හමුවේ ජීවිතයෙන් පලා නොයනු ඇත. තරුණයා තරුණියව භාණ්ඩයක් ලෙස නොදකිනු ඇත. විද්‍යාවට පිටුපා මිත්‍යාව වැළඳගත් මිනිසුන් හමු නොවෙනු ඇත. ජාතිවාදය නැමැති මඩ වගුරේ නොගිලෙනු ඇත. ප්‍රේමයෙන් ආත්මාර්ථයෙන් මිරිකී මිරිකී පීඩා විදිනවුන් විරල වනු ඇත. තම සැප පහසුව වෙනුවෙන් අනෙකාව ගොදුරට ගන්නන් බිහි නොවෙනු ඇත. සම්පත් පොදිගසාගත් මිනිසුන්ගේ රූකඩ මෙන් නැටවෙන මිනිසුන් හමු නොවෙනු ඇත. අලුත් සමාජයක් වෙනුවෙන් උරෙනුර ගැටී වැඩකරන ධෛර්ය සම්පන්න තරුණයින් හමුවෙනු ඇත.

නමුත්! අපිට මඟ පෙන්වන්නේ කවුරුන්ද? අප ආදර්ශය ගන්නේ කාගෙන්ද? චේ අපට මඟ පෙන්වීමට සිටියි. අපි ඔබේ ආදර්ශය ගනිමුද? නැත. අප ඔබෙන් ගන්නේ බාහිර පෙනුම පමණය. අපේ සිත ගැටී ඇත්තේ ඔබේ විලාසිතාව පමණය. අපේ කැප් තොප්පියට ඔබ රුව යොදාගත්තේ ඒ නිසාය. කරවට මාලයට චේ රුව වැටුණේ ඒ නිසාය. ඇගේ ඒ රුව ටැටූ කෙටුවේ ඒ නිසාය. රැවුල, කොණ්ඩය වැව්වේ ඒ නිසාය. අප ඔබ වැන්නෙකු වීමට සිතුවේ එසේය. නමුත් විය යුතුම දෙය සිදුවූයේ නැත. අපේ හදවතේ ඔබ නැත.

චේ ඔබ එන්න... අපේ හදවතට කියා දෙන්න... සෑම මිනිසෙකුටම මිනිසෙකු ලෙස ආදරය කරන්නේ කෙසේද යන්න. බිදවැටී දුර්වල වන විට ධෛර්යෙන් නැගී සිටින සැටි අපට කියා දෙන්න. තමන්ගේ පෞද්ගලික ජීවිතයේ ජයග්‍රහණයන්ට වඩා සමාජ ජයග්‍රහණයකින් සතුටුවන හැටි අපට කියාදෙන්න. හොඳ සමාජයක් ගොඩනගන්නට කැපකිරීම් කළ යුතු ආකාරය කියා දෙන්න. වරප්‍රසාදවලින් ආත්මය පාවා නොදී ජීවත්වන හැටි අපට කියාදෙන්න. ප්‍රතිලාභ වෙනුවෙන් නායකයින් ළඟ දණින් නොවැටී සිටින්නට කියා දෙන්න. සමාජ ආසාධාරණය, අයුක්තිය හමුවේ නිවට නොවී නැගී සිටින්නට කියා දෙන්න. චේ අපට කියා දෙන්න, හොඳ විප්ලවාදියෙක් ,හොඳ මානවවාදියෙක් විය හැක්කේ කෙසේදැයි අපට කියන්න.

තරුණ අපි සුදානම් අලුතින් පටන් ගන්න. පෙනුමෙන් වගේම භාවිතයෙනුත් චේ වගේ වෙන්න. ඔබ පැතු ලෝකය ගොඩනගන්නට අපි සුදානම්. අප මංමුලා වූ යුගය අවසන් කිරීමට කාලය එළඹ ඇත. මේ ඔක්තොම්බර් 08වැනිදාට ඔබේ බලාපොරොත්තු සඵල කරන්නට නොහැකි වීම ගැන අපට කණගාටුය. එහෙත් අපි අද සිට පටන් ගන්නෙමු ඔබ පැතු ලෝකය ගොඩනගන්නට. ඔබේ ආදර්ශය ඔබේ ශක්තිය අප ගන්නවා සත්තයි... හෙට ඒ විසල් ලොව ගොඩනගනවා නියතයි...

# බාහිර උපාධිය අනතුරේ!

වත්මන් යහපාලන ආණ්ඩුව අධ්‍යාපනය පෞද්ගලීකරණය කරමින් සහ අධ්‍යාපනයට යොදවන මුදල් කප්පාදු කරමින් සිටී. ඉතා අපහසුවෙන් සොයාගත් මුදලින් බාහිර උපාධිය ලබාගත් උපාධිධාරීන්ටද වත්මන් ආණ්ඩුව කෙනෙහෙලිකම් කරමින් සිටි. දැනට වසර එකහාමාරකට පමණ පෙර බාහිර උපාධි ශිෂ්‍යයින්ට ඉගෙනගැනීමට තිබූ අවස්ථා චක්‍රලේඛන මගින් අහිමි කරන්නට උත්සාහ දැරිණි. ඒ, බාහිර උපාධි අපේක්ෂා කරන ශිෂ්‍යයින් විශ්වවිද්‍යාලවල ලියාපදිංචි කිරීම සීමා කරමිනි. එය ව්‍යර්ථ වූයේ එම ශිෂ්‍යයින්ගේ අරගල හා රටේ ප්‍රගතිශීලි සංවිධාන මෙන්ම බුද්ධිමතුන්ගේ මැදිහත්වීමෙනි. නමුත් ආණ්ඩුව යළිත් වරක් එය වෙනත් වේෂයකින් ගෙනඑන්නට උත්සාහ කරමින් සිටි. පසුගියදා රැකියා විරහිත උපාධිධාරීන් 4035කට රාජ්‍ය ආයතනවල අභ්‍යාසලාභී පුහුණුව සඳහා පත්වීම් ලබා දුන්නේය. පසුව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශ ලේකම් විසින් එම 4035 තුළ සිටින බාහිර උපාධිධාරීන්ගේ පත්වීම් අවලංගු කරමින් ලිපියක් මගින් දැනුම් දෙන ලදී.

මෙසේ බාහිර උපාධිධාරීන් ඉවත් කිරීමට ගත් තීන්දුවට කිසිම සාධාරණ හේතුවක් නොමැත. එයින් හැගෙන්නේ බාහිර උපාධියට කුඩම්මාගේ සැලකිල්ල බවයි. එයට වටිනාකමක් නොමැතිද? බාහිර උපාධිය උපාධියක් නොවේද? මේ ආණ්ඩුව සැරසෙන්නේ කුමක් සඳහාද යන්න පැහැදිලිය. ඉහත සඳහන් කළ ආකාරයට මීට ඉහතදී චක්‍රලේඛන මගින් බාහිර උපාධි කප්පාදුව සිදු කරගන්නට නොහැකි වීම යළිත් වරක් වෙනත් ආකාරයකින් සිදුකරන්නට යන බවය. මෙය බාහිර උපාධිය ලබාගත්තත් එයින් රැකියාවක් ලබා ගැනීමට නොහැකිය යන මානසිකත්වයකට එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් පත්කරන්නට යන උත්සාහයකි. එයින් බාහිර උපාධිය ස්වභාවිකව මරණයට පත් කරන්නට යන බව පැහැදිලිය. මෙරට වසරකට 120,000ක් පමණ උසස් පෙළ සමත් එහෙත් විශ්වවිද්‍යාලයට ඇතුළත් විය නොහැකි තරුණ තරුණියන්ගේ එකම සිහිනය වන්නේ බාහිර උපාධියයි. වැඩි වශයෙන් බාහිර උපාධිය කිරීමට යොමු වන්නේ මෙරට දුප්පත් අම්මා තාත්තගේ දූ දරුවන්ය. මේ අහිමි වෙමින් යන්නේ ඔවුන්ගේ සිහිනයයි.

මෙම බාහිර උපාධිධාරීන්ගේ ගැටලුව සඳහා බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුව විසින් රට පුරා ක්‍රියාකාරී මැදිහත් වීමක් කරමින් සිටි. සෑම දිස්ත්‍රික්කයක් තුළම එම අසාධාරණයට ලක්වූ උපාධිධාරීන් දැනුවත් කිරීම් හා සංවිධානය කරමින් සිටී. එහි එක් ප්‍රතිඵලයක් ලෙස ඔවුහු පසුගිය 26වැනි දින මානව හිමිකම් කාර්යාලය වෙත පෙත්සමක් බාරදුන්හ. පසුව එහි ඉදිරිපිටදී නිහඬ විරෝධතාවයක් සිදු කරනු ලැබිණි. මේ සඳහා බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුවේ කැඳවුම්කරු මහේෂ් අබේපිටිය සහෝදරයා, උපාධිධාරී ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු චන්දන සූරියආරච්චි සහෝදරයා හා සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංගමයේ කැඳවුම්කරු විමුක්ති සහෝදරයා ඇතුළ විශාල පිරිසක් සහභාගි වූහ.











## ඩොලරයට තටු ඇවිත්



කොන්ක්‍රීට් වගා කළ මුත්
නව දෑ නොතැනූ උන්
දුන්නා පියාපත්
ඩොලරයට...
රුපියලට ඇප නෑ
යයි කොන්ක්‍රීට් අස්සෙන්
පාවී පාවී
කෙළවගෙන අපිට
අපේ හෙටට..
ගෑස් පෙට්‍රල්වලින්
තරු ජේන කොට
තඹයකට නොවටින
අපේ ජීවිත
ඩෝසර් කරගෙන
රුපියලට...
ඇපත් නෑ අපිට..
දෙකට නැමීගෙන
ලෝකෙ වටේ යන
රුපියල් මහත්තුරු...
හිඟා කන අපූරුව
ලෝන් ගෙන සීරුවෙන්
ඩොලර් කන මහත්තුරු...




## යුරෝපය තුළ හැලජන් විදුලි බල්බ තහනමක්



යුරෝපය තුළ ඉදිරි මාසයේ සිට හැලජන් විදුලි බල්බ තහනම් කිරීමට තීරණයක් ගෙන ඇත. මෙම හැලජන් විදුලි බල්බ නිසා සිදුවන අධික කාබන් විමෝචනය මේ තීරණය සඳහා හේතු වී තිබේ. ඉදිරියේ දී මෙම බල්බ වෙනුවට එල්.ඊ.ඩී බල්බ භාවිතය සඳහා යොමු කිරීමට යුරෝපය සූදානම් වී තිබේ. එල්.ඊ.ඩී බල්බයක විදුලි පාරිභෝජනය සාමාන්‍ය හැලජන් බල්බයක මෙන් පහෙන් පංගුවකි. එසේම එල්.ඊ.ඩී බල්බයක් සාමාන්‍ය හැලජන් බල්බයකට වඩා ටොන් මිලියන 15කින් කාබන් විමෝචනය අවම කරන බව ඔවුහු පවසති.

## පැරිස් හා බ්‍රසල්ස් නගරවල මෝටර් රථ නොමැති දිනයක්



ප්‍රංශයේ පැරිස් නුවර සහ බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර පසුගිය දිනෙක මෝටර් රථවලින් තොර දිනයක් ප්‍රකාශයට පත් කිරීමට එරට බලධාරීහු පියවර ගත්හ. ඒ අනුව යුරෝපා සංගමයට අයත් සෑම රටකම මෙය ක්‍රියාත්මක කළ යුතු යැයි ඔවුහු පවසති. වායු දූෂණය නිසා වන සෞඛ්‍ය හානිය සම්බන්ධයෙන් ඉක්මන් තීරණයක් ගත යුතු බව පවසමින් පැරිස් හා බ්‍රසල්ස් නගරාධිපතිවරුන් තමන්ගේ නගරයන්හි ස්ථාන 06කට සෑම මසකම පළමු ඉරිදා දින මෙලෙස වාහන ඇතුල් කිරීම තහනම් කර ඇත. මෙය ඔක්තෝම්බර් මස 07 වන දින සිට ක්‍රියාත්මක වේ.

## පැළඳිය හැකි සූට්බොට්



ජර්මනියේ පැවති අයි එෆ් තාක්ෂණික සමුළුවේ දී එල්.ජී සමාගම විසින් නවතම රොබෝ තාක්ෂණික ඇඳුමක් එළිදක්වා ඇත. ඉඟටියේ සිට පාදාන්තය තෙක් ආවරණය කරන මෙය සී.එල්.ඕ.අයි. සූට්බොට් ලෙස හඳුන්වයි. මෙය මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා වූ නවෝත්පාදනයකි. අංශභාග රෝගීන් වෙනුවෙන් වටිනා නිර්මාණයක් වූ මෙය ගබඩා කම්කරුවන් සඳහාද ප්‍රයෝජනවත් වන ලෙස සකසා ඇතැයි එල්.ජී. සමාගමේ සභාපති සොන්ග් ඩේයි හං සඳහන් කරයි.

## පාපැදියෙන් දරු ප්‍රසූතියට ගිය ඇමතිනිය



සිය ප්‍රථම දරු ප්‍රසූතිය සඳහා පාපැදියෙන් ගොස් රෝහල් ගතවූයේ නවසීලන්තයේ කාන්තා කටයුතු පිළිබඳ ඇමතිවරියයි. ඇය එරට හරිත පක්ෂය නියෝජනය කළ අතර නිවසේ සිට රෝහල දක්වා වන කිලෝමීටරයක දුර ඇය ගොස් ඇත්තේ පාපැදියෙනි.

# ධනවාදයේ පිරිහීම හා දේශපාලන විගඩම්

මේ වන විට ලංකාවේ ධනවාදී සමාජය මුළුමනින්ම කඩා වැටී පිරිහීමට ලක්ව තිබේ. දැන් ලංකාවේ ආර්ථිකය පතුලටම කඩා වැටී පිරිහී ඇත. දේශපාලනය ඊට දෙවැනි නැත. එයද පිරිහී ඇත. සමාජය හා එහි සාරධර්ම සියල්ල පිරිහී ඇත. සියලු මහජන සේවා පිරිහී තිබේ. මහමග විනය පිරිහී ඇත. එහි ප්‍රතිඵලය වී ඇත්තේ සෑම දිනකම රිය අනතුරුවලින් දළ වශයෙන් 8 දෙනෙකු මිය යාමය. වෙළඳාම හා නිෂ්පාදනයේ සාරධර්ම පිරිහී තිබේ. මිනිස්සු ආහාරවලට වස විස කලවම් කරති. අවසානයේ ආගමික සංස්ථාවන්ද පිරිහී තිබේ. එය යකඩ ගිනිගත් ගෙදර පුළුන් සෙවීමෙන් පලක් නැති සේය. මින් පෙන්වන්නේ කුමක්ද? ඒ ලංකාවේ ධනවාදයට තවදුරටත් දශමයක්වත් පෙරට යා නොහැකි බවය. ධනවාදයේ මෙම පිරිහීමේ තරම පෙන්වන හොඳම උදාහරණය දේශපාලනයේ සිදුවන විහිළු හා විගඩම්ය.

පොදුවේ ගත්කල මිනිස්සු විහිළුවලට කැමතිය. ඒ, ඉන් සිනහසීමට හා සතුටු වීමට හැකි නිසාය. ලංකාව ඉන්දියාව වැනි රටවල චිත්‍රපට කර්මාන්තයේදී ප්‍රධාන නළු නිළියන්ට අමතරව විහිළු කරන හාස්‍යෝත්පාදක නළුවන් සිටින්නේ ඒ නිසාය. එහෙත් ප්‍රධාන නළුවා විහිළුකාරයෙකු වූයේ නැත. එසේම අතීත රජවාසල්වලද විකටයෙකු සිට ඇත. ඒ, රජු සතුටු කිරීමටය. අන්දරේ එවන් චරිතයකි. එහෙත් එකල රජු අන්දරේට ඇන්දේ නැත. නමුත් ලාංකේය දේශපාලනයේ දැන් තත්වය ඊට වෙනස්ය.

දැන් රජා අන්දරේගේ භූමිකාවට පණ පොවන තත්වයට නැතිනම් ප්‍රධාන නළුවා, විකටයෙක් වීමේ තත්වයට පත්ව තිබේ. එසේ වන්නේ රජා රාජ්‍ය පාලනය නොදන්නා විටය. ප්‍රධාන නළුවා චරිතාංග නළුවෙකු නොවූ විටය. ලංකාවේ රාජ්‍ය පාලනය තුළ සිදුවී තිබෙන්නේද එයමය. රාජ්‍ය පාලකයෝත්, හිටපු පාලකයෝත්, සමහර ඉහළ නිලධාරීනුත් විහිළුකාරයන්ගේ තත්වයට පත්ව ජනතාවට විහිළු සපයමින් සිටිති. විහිළු හොඳය. එහෙත් රාජ්‍ය නායකයන් රටක් සමග, ජනතාවත් සමග විහිළු කරන්නේ නම් ඒවා ඉල ඇදෙන විහිළු නොව "මිනීමැරෙන" විහිළුය.

ලංකාවේ ප්‍රභූ ධනපති පංතිය අත කලක් තිබූ රාජ්‍ය පාලනය ඉන් වෙනස් මඟකට ගැනීම ආරම්භ වූයේ 1978 විවෘත ආර්ථිකයත් සමගය. ඒ නිසා ධනවාදී දේශපාලනයට කළු සල්ලිකාරයෝ, මැරයෝ, සූදුකාරයෝ හා දේශපාලන වාචාලයෝ ඇතුළත් වූහ.




මෙලෙස ක්‍රමයෙන් වෙනස් වූ දේශපාලන සංස්කෘතිය පාදඩකරණයට ලක්කළේත් රාජ්‍ය පාලකයන් මරණීය විහිළුකාරයන් බවට පත් කළේත් ඡන්දදායකයා ඊට ගැලපෙන කෙනෙක් බවට පත් කළේත් මහින්ද රාජපක්ෂ පාලනය තුළය. එය ධනවාදයේ පිරිහීමට සමාන්තරව සිදුවිය. දැන් සියල්ල උඩුයටිකුරු වී තිබේ. රාජ්‍ය නායකයෝ හා සමහර නිලධාරීහු නවීන ජනමාධ්‍යවලට විහිළු සපයන අය බවට රූපාන්තරණය වී සිටිති.

1978 ජයවර්ධනගේ ව්‍යවස්ථාව මගින් නිර්මාණය කළ විධායක ජනාධිපති ක්‍රමය මෙන්ම සමානුපාතික මැතිවරණ ක්‍රමයද මීට හේතුවී තිබෙන බව පෙනේ. සමානුපාතික මැතිවරණ ක්‍රමය තුළ පාලක පංතියේ පක්ෂ පරාජය වුවද එහි ඉහළම පිරිසක් නොපැරදී දිගටම දේශපාලනයේ රැඳී සිටිති. ඔවුන් වරෙක ආණ්ඩු පක්ෂයේය. තවත් වරෙක විපක්ෂයේය. දිගටම පාර්ලිමේන්තුවේය. ඔවුන් වෙනස් වන්නේ නැත. අලුත් පිරිසකට ඉඩ ලැබෙන්නේද නැත. මේ නිසාද දේශපාලනයේ සල්ලි තිබෙන, බලය තිබෙන සීමිත වරප්‍රසාද පිරිසක් ධනපති පක්ෂවල ඉහළ තලයේ වැජඹෙමින් සිටිති. එයද මේ විහිළු සහගත පිරිහීම වැඩි කිරීමට හේතු වී තිබේ.

අනෙක් අතට ලංකාවේ ජනමාධ්‍යවල ස්වභාවයද මීට හේතුවී තිබේ. ලංකාවේ ජනමාධ්‍ය මෑතකාලීනව සමාජයට ප්‍රයෝජනවත් හරයක් සහිත දේ වාර්තා කරනවා වෙනුවට බාල විහිළු ප්‍රකාශ, සමාජගත කිරීමේ ජනප්‍රිය ප්‍රවෘත්ති කලාවක් ආරම්භ කළේය. 'කියන කථා', 'රට වටකර' වැනි නම් යොදා ගෙනගිය එම ප්‍රවෘත්ති රටාවට අනුගත වූ දේශපාලකයෝ එම ප්‍රවෘත්තිවලට ජනප්‍රිය ප්‍රකාශ සපයා තමන්ගේ රුව රූපවාහිනියේ පෙන්වා ගැනීමට හුරු පුරුදු වූහ. දේශපාලකයා විකට නළුවෙකු කිරීමට මෙම මාධ්‍ය භාවිතය සමත් විය. දැන් අපේ රටේ ජනාධිපති හා පොලිස්පතිද ගොදුරුවී තිබෙන්නේ එම රටාවටය.

මේ පිළිබඳ හොඳම උදාහරණය ඇත්තේ පාර්ලිමේන්තුවේය. කලක සිට රූපවාහිනිය මඟින් පාර්ලිමේන්තුවේ සැසිවාරවල මුල් පැයක් දෙකක් සජීවී ලෙස පෙන්වීම ආරම්භ කළේය. එය නරක දෙයක් නොවේ. එහෙත් පාර්ලිමේන්තුවේ ධනවාදී පක්ෂ හා ඒවායේ අතු-ඉති බවට පත්වූ සංවිධාන නියෝජනය කරන, දේශපාලන ගැඹුරක් නැති, අධ්‍යාපනයක් නැති, හිස් හා බොල් දේශපාලන චරිත එම සජීවී විකාශනය යොදා ගනු ලැබුවේ පාර්ලිමේන්තුව තුළ තම "රඟපෑම්" සඳහාය.

දැන් පාර්ලිමේන්තුවට පැමිණ සජීවී විකාශනය පවතින කාලය තුළ කෑ කෝ ගසමින්, එකිනෙකා පරයා රඟදක්වමින් තම රූපය කැමරාවට නිරාවරණය කර ගන්නා ඔවුහු, ඉන්පසු පාර්ලිමේන්තුවේ වැදගත් සාකච්ඡාවලට පවා නොසිට මාරුවෙති. ඒ රටේ දේශපාලනය වැටී ඇති තරමය.

ආර්ථික ක්‍රමයේ පිරිහීමෙන්, සමාජය පිරිහීමෙන්, ප්‍රකාශනයක් ලෙසම ධනපති දේශපාලනයේ මතුව ඇති මෙම පිරිහීම දැන් ඉහළ දක්වාම ගමන්කර තිබෙන්නේ "පැණිවරකා ගහටද හෙණ ගැසුවා" මෙනි. දැන් ලංකාවේ ජනාධිපතිවරයා රටේ ගැටලු පිළිබඳ අවබෝධයක සිට රට පාලනය කරන්නෙකු ලෙස නොව ජනමාධ්‍ය සඳහා ජනප්‍රිය ප්‍රකාශ කරන අයෙකුගේ තත්වයට වැටී තිබේ. ඔහු රජයේත් ඇමති මණ්ඩලයේත් ප්‍රධානියා වුවත් ඔහුම විටින් විට ප්‍රකාශ කරන පරිදි රටේ සිදුවන බොහෝ දේවල් දන්නේ "පත්තරය බැලීමෙනි". ඔහු රටේ ප්‍රශ්න සාකච්ඡා කොට තීරණ ගන්නේ ඇමති මණ්ඩලයේදී නොව ප්‍රචාරක රැස්වීම්වල විද්‍යුත් මාධ්‍ය කැමරා ඉදිරියේය. මෑතකදී ඔහු ප්‍රකාශ කර තිබුණේ, ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ ව්‍යාපාරික පංතියේ මගීන්ට දෙන කජු 'බල්ලෙකුටවත් කෑමට බැරි' බවය. එය සත්‍යයක් නම් ඔහු කළ යුතුව තිබුණේ ලෝකයට ඇහෙන්නට එය මාධ්‍යවලට කීම නොව අදාළ බලධාරීන් ගෙන්වා මේ ගැන විමසා එය නිවැරදි කිරීමට නියෝගයක් දීමය. එහෙත් ඔහු ජනප්‍රිය බාල දේශපාලනයට කොතරම් ගොදුරුවී ඇද්ද යන්න ඔහු කටයුතු කළ ආකාරයෙන් පැහැදිලිව පෙනේ.

අනෙක් අතට මුළු ශ්‍රීලන්කන් ගුවන් සේවයම විශාල අර්බුදයක තිබියදී ඒ ගැන නොබලා 'කජු' ගැන සෙවීමද විකාර සහගතය. එහෙත් ලංකාවේ ධනපති දේශපාලනයේ නායකයින් වැටී ඇති තත්වය එසේය.

ලංකාවේ අගමැතිවරයාද මේ ලෙසම හැසිරෙන කෙනෙකි. ඔහුද නිතර වේදිකාවල හා පාර්ලමේන්තුවේ විහිළු කරයි. ලංකාවේ හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහතා ඊට හපන්ය. දැන් ජනමාධ්‍ය ඔස්සේ වැඩිම විහිළු සපයන කෙනා බවට පත්ව සිටින්නේ ඔහුය. ලංකාවේදී මත්තල ගුවන්තොටුපළ ඉන්දියාවට දීමට එරෙහිව මරාගෙන මැරෙන වර්ගයේ ප්‍රකාශ කරන ඔහු, ඉන්දියාවේදී පවසන්නේ තමන් ඉන්දියාවට මත්තල ගුවන්තොට දීමට විරුද්ධ නැති බවය. එමෙන්ම පසුගිය සැප්තැම්බර් 05 දා ආණ්ඩු පෙරළන අමුතු පන්නයේ උද්ඝෝෂණයක් පවත්වා රටම හිනැස්සූ ඔහු ඉන්පසුද එවැනි විහිළු කතා නිතර කියමින් සිටී. වරක් ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීවරයා ළඟ සිටියදී ඔහු ජනමාධ්‍යවලට කියන්නේ උද්ඝෝෂණයට දුන් 'කිරි' බීම නිසා ඩලස්ද අසනීප වී ගෙදර ගිය බවය. ජනමාධ්‍ය ඉදිරිපිටදීම ඔහුගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කරන උදිත ලොකුබණ්ඩාරට 'මෝඩ යකෙක් මූ. පැත්තකට වෙලා ඉන්නවා' යැයි බැණවැදීමද ඔහුගේ අසංවරකම පෙන්නන සිදුවීමක් විය.

මේ තිදෙනා අතරට දැන් අලුතින්ම එකතු වී සිටින්නේ පොලිස්පතිතුමාය. ඔහුද 'ජනප්‍රිය' හැසිරීම් පෙන්වීමට කැමති අයෙකි. ජනමාධ්‍ය ඉදිරිපිට පොලිස් කොස්තාපල්වරියන්ට 'හිසතෙල්' ගෑමේ සිට මිනිසුන්ට ප්‍රසිද්ධියේ බැණවැදීම, පහරදීමට යාම ආදී විහිළු රැසක් ඔහු කරමින් සිටී. මේ නිසා දැන් මුළු රටම 'විනෝද සමයක්' බවට පත්ව තිබේ.

15 වැනි පිටුවට

> මේ තත්වය සරල සිනහවකින් බැහැර කළ යුතු තත්වයක් නොවේ. මේ අය මේ විහිළු කරන්නේ රටක ජනතාවක අනාගතය සමඟය. දිනපතා වේගයෙන් කඩාවැටෙන රුපියලේ අගය රැක ගැනීමට ගිලාබසින ආර්ථිකය ගොඩ ගැනීමට මොවුනට දැක්මක් නැත. එවැනි වුවමනාවක්ද නැත. රටේ ප්‍රධානතම ප්‍රශ්න පසෙක තබා අතිරේක කරුණු ගැන විහිළුකීම දැන් සම්ප්‍රදාය වී තිබේ. සැබෑවටම විහිළු කරන අයගේ විහිළු නිසා ජනතාව සිනාසුණද මොවුන්ගේ විහිළු රටක 'ගමනක අවසානය' කියාපාන ඛේදවාචකයන්ය.



"ලෝක ඉතිහාසයේ ඉතා වැදගත් සිද්ධීන් හා පෞරුෂත්වයන් දෙවරක් ඇතිවන බව කිව හැකියි හෙගල් වරක් පැවසීය. එහෙත් ඔහුට මෙලෙස එකතු කිරීමට අමතක විය. ඒවා ඇතිවන්නේ, ප්‍රථමවරට ඛේදජනකයක් ලෙසත් දෙවැනි වර හාස්‍යජනකයක් ලෙසත්ය.''

**කාල් මාක්ස්**

**'ලුයී බොනපාට්ගේ බෲමර් 18දා' ලිපියෙන්**

# සිංගප්පූරු ගිවිසුමට එරෙහිව ජනතාව අතරට



ජාත්‍යන්තර ඒකාධිකාරයන් අතර ලෝකය ආර්ථික වශයෙන් බෙදා ගැනීම හා නැවත බෙදාගැනීම අධිරාජ්‍යවාදයේ ප්‍රධාන ලක්ෂණයන්ගෙන් එකකි. සිංගප්පූරු - ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් අවධානය යොමු කළ විටද පෙනී යන කරුණක් වන්නේ මෙම ගිවිසුම පිටුපස ධනවාදීන්ගේ ජාත්‍යන්තර සංවිධානයක් වන ලෝක වෙළඳ සංවිධානය සිටින බවය. ජනතාවගේ දැවැන්ත විරෝධතාවලින් තොරව තම සමුළුවවත් පවත්වා ගත නොහැකි විරෝධයකට ලක්ව සිටින ලෝක වෙළඳ සංවිධානයේ භූමිකාව අද ලෝකයට නිරාවරණය වී අවසන්ය.

මෙම ගිවිසුමේ යටි අරමුණු සහ ඒ සම්බන්ධයෙන් රටේ පාලකයන් අනුගමනය කරමින් සිටින ක්‍රියාමාර්ග පිළිබඳව ජනතාව දැනුවත් කරමින් එයට එරෙහිව පෙළගැස්වීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ කටයුතු ආරම්භ කර තිබේ. 'සිංගප්පූරු-ශ්‍රී ලංකා නීති විරෝධී හොර වෙළඳ ගිවිසුමට විරුද්ධ විය යුත්තේ ඇයි?' යනුවෙන් විස්තරාත්මක පත්‍රිකාවක් පසුගිය සැප්තැම්බර් 07 වැනිදා කොළඹ කොටුව දුම්රිය පොළ ඉදිරිපිටදී ජනතා විමුක්ති පෙරමුණ විසින් බෙදාහැරීම ආරම්භ කළ අතර ඒ අනුව යමින් දිවයිනේ ප්‍රධාන නගර ඇතුළු ප්‍රසිද්ධ ස්ථානයන්හීද මෙම පත්‍රිකා බෙදාහැරීම සිදුවිය. පත්‍රිකා බෙදාහැරීමේ ආරම්භක අවස්ථාව සඳහා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති, මධ්‍යම කාරක සභික බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ලක්ෂමන් නිපුණාරච්චි, මහින්ද ජයසිංහ සහ නීතිඥ සුනිල් වටගල යන සහෝදරවරුන්ද ඇතුළුව ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරීහු රැසක් එක්ව සිටියහ.

# ජාතික විද්වත් සංවිධානයේ දිස්ත්‍රික් සමුළු මුළුදෙයි

රට ආර්ථික හා සමාජීය වශයෙන් පිරිහුණු අවස්ථාවන්හිදී එනම් ජනතාවට දරා ගත නොහැකි පීඩනයක් එල්ල වෙද්දී එයට එරෙහිව ප්‍රගතිශීලී බලවේගයන් පෙරමුණ ගත් සෑම විටකම රටේ උගතුන් හා බුද්ධිමතුන් එම බලවේගයන් සමග එකට පෙළට සිටගත් අවස්ථා ඉතිහාසයේ ඕනෑතරම් තිබේ.

වර්තමානයේද රට බරපතළ ආර්ථික හා සමාජීය අර්බුදයකට ඇද වැටෙමින් ඇත. එවන් මොහොතක විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, රාජ්‍ය නිලධාරීන්, බුද්ධිමතුන් ආදීන්ගෙන් සමන්විත වූ ජාතික විද්වත් සංවිධානය රට ගොඩනැගීම අරමුණු කර ගනිමින් ජාතික වැඩපිළිවෙළක් සකස් කරමින් සිටී. ආර්ථික, සෞඛ්‍ය, කෘෂිකාර්මික, ක්‍රීඩා, සහජීවනය වැනි විවිධ ක්ෂේත්‍රවල මූලික ප්‍රතිපත්තීන් සෑදීමට කටයුතු කරමින් සිටින අතර ඒ සඳහා මහජනයාට අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමටද අවස්ථා සලසා දී තිබේ.

මේ අතර ජාතික විද්වත් සංවිධානය තම අරමුණු හා වැඩපිළිවෙළ රටට ඉදිරිපත් කිරීම සඳහා දිවයිනේ ප්‍රධාන නගර ඉලක්ක කර ගනිමින් සමුළු මාලාවක්ද සංවිධානය කර ඇති අතර ඔවුන් දේශපාලන ව්‍යාපාරයක් ලෙස බද්ධ වී ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණ සමඟ පමණි. මෙතෙක් රට පාලනය කළ එ.ජා.ප., ශ්‍රීල.නි.ප. හා රාජපක්ෂ කණ්ඩායම් සමග ප්‍රතිපත්ති දේශපාලනයක් සිදු කළ නොහැකි වීමත් ඔවුන් සමග තවත් අත්හදා බලන්නට දෙයක් ඉතිරි නොවීමත් මෙයට හේතු වන්නට ඇත.

මෙහි ආරම්භක දිස්ත්‍රික් සමුළුව පසුග ිය සැප්තැම්බ 20වැනිදා රත්නපුරයේදී පවත්වන ලද අතර කළුතර දිස්ත්‍රික් සමුළුව සැප්තැම්බර් 22දා කළුතර නගර ශාලාවේදීද පැවැත්වුණි. ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා සහ සාහිත්‍යවේදී බටුවන්ගල රාහුල හිමියන්, හිටපු අමාත්‍යංශ ලේකම් ඒ.පී.ඒ. ගුණසේකර, කළුතර සහ කොළඹ හිටපු මහ දිසාපති එස්. හපුආරච්චි, වෛද්‍ය නිහාල් අබේසිංහ යන විද්වත් පිරිස විසින් මෙම සමුළුව අමතන ලදී.



# චේ ඉගැන්වූ ශිෂ්‍ය - තරුණ භූමිකාව



වඩා නිවැරදි දැක්ම වටා ශිෂ්‍ය ප්‍රජාව සංවිධානය කිරීම පිණිස සමාජවාදී ශිෂ්‍ය සංගමය විශාල කාර්යය භාරයක් සිදු කරමින් සිටී. විටෙක මිත්‍යාවට එරෙහිවද තවත් විටෙක අධ්‍යාපන අයිතිවාසිකම් රැක ගැනීම වෙනුවෙන්ද එසේම පොදු ජනතාවගේ අරගලවලට උරදෙමින්ද සාකච්ඡා, සම්මන්ත්‍රණ, සංවාද මෙන්ම විවිධ කෘතිද එළිදක්වමින් මතවාදී තලය තුළ සුවිශේෂී මැදිහත්වීමක් කරමින්ද සමාජවාදී ශිෂ්‍ය සංගමය කටයුතු කරයි.

මෙහි දිගුවක් ලෙස අර්නෙස්ටෝ චේ ගෙවරා සහෝදරයා විවිධ අවස්ථාවන්හිදී ශිෂ්‍යයන් හා තරුණයන් වෙනුවෙන් පවත්වන ලද දේශන අඩංගු කෘතියක් සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් පසුගිය සැප්තැම්බර් 06වැනිදා කොළඹ ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදී එළිදක්වන ලදී. "ශිෂ්‍ය - තරුණ භූමිකාව - අර්නෙස්ටෝ චේ ගෙවරා" යනුවෙන් මෙම කෘතිය නම් කරනු ලැබ ඇත.

රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ශම්මික ලියනගේ මහතා සහ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක, සමාජවාදී ශිෂ්‍ය සංගයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය යන සහෝදරවරු මෙහිදී සභාව ඇමතූහ. මේ සදහා ශිෂ්‍යයන් හා තරුණයන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වී සිටියහ.

# අම්පාර ගොවි දුක රැගෙන අරගල බිමට

මෙරට ගොවි ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින වඩා සක්‍රීයම ගොවි සංවිධානය සමස්ත ලංකා ගොවිජන සම්මේලනය බව අද ගොවි ජනතාව අතර තහවුරු වී අවසන්ය. අද ගොවි අරගලයක් ඇත්තේ කොහිද එතැන සමාජවාදී ගොවිජන සම්මේලනය අනිවාර්යයක් වී ඇත.

පසුගිය සැප්තැම්බර් 17 වැනිදා අම්පාර නගරයේ පැවති ගොවි උද්ඝෝෂණයේද පෙරමුණ ගෙන සිටියේ සමස්ත ලංකා ගොවිජන සම්මේලනයයි. ඒකාබද්ධ ගොවි පෙරමුණ හා එක්ව දියත් කළ මෙම උද්ඝෝෂණ පා ගමනේ අරමුණ වී තිබුණේ, බඩඉරිඟු , අතුරු භෝග සඳහා ගෙවිය යුතු රක්ෂණ වන්දි වහා ලබා ගැනීම, රජය පොරොන්දු වූ වගා වන්දි වහා ලබා ගැනීම, කීඩෑ උවදුරින් විනාශ වූ කුඹුරු සඳහා සාධාරණ වන්දියක් ලබා ගැනීම සහ වගා ණය වහා කපා හැරීම යන කාරණා ඇතුළුව ඉල්ලීම් 16 ක් දිනා ගැනීම සඳහා ආණ්ඩුවට බල කිරීමය.

අම්පාර නගරයේ සිට එහි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දක්වා පැමිණි විරෝධතා පා ගමන සඳහා අම්පාර දිස්ත්‍රික් ජනතා විමුක්ති පෙරමුණේ සංවිධායක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පියතිස්ස, සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න යන සහෝදරවරුන් ඇතුළුව විශාල පිරිසක් සහභාගි වී සිටියහ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දක්වා පාගමනින් පැමිණි පිරිස දිස්ත්‍රික් ලේකම්වරයා සමඟ පැවති සාකච්ඡාකින් අනතුරුව ගොවි ජනතාගේ ඉල්ලීම් ඇතුලත් පෙත්සමක්ද ලේකම්වරයාට බාර දෙන ලදී.



# රුපියල කඩාවැටීම

## ගෝලීය අර්බුදයක්ද? ජාතික අර්බුදයක්ද? දෙකමද?

මේ දිනවල වඩාත්ම කථාබහට ලක්වී ඇති ආර්ථික සංසිද්ධිය වී ඇත්තේ රුපියල කඩා වැටීමයි. දිනපතා ඩොලරයක් සඳහා හුවමාරු වන රුපියල් වටිනාකම වැඩිවෙමින් රුපියලේ අගය බාල්දු වෙමින් තිබේ. මෙම සටහන තබන 2018 සැප්තැම්බර් 25 වනවිට එය රු.172/-ක් බවට පත්වී ඇති අතර මෙම වසර අග වනවිට ඩොලරයට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය රු.200/- දක්වා වැඩි වනු ඇති බවට ආර්ථික විචාරකයෝ කරුණු දක්වති.

මෙම කෙටිකාලීනව සිදුවන වේගවත් කඩාවැටීම සමහරු ගෝලීය ආර්ථිකයේ ඇතිවන වෙනස්කම්වල චලනයන්ගේ ප්‍රතිඵල ලෙස දක්වන අතර, ගෝලීය සාධක මෙන්ම ලාංකේය ආර්ථිකයේ කඩා වැටීමේ ප්‍රතිඵල ලෙසද තවත් ආර්ථික විග්‍රහයන් ඉදිරිපත් වෙමින් තිබේ. නමුත්, සුපුරුදු ලෙසම ආණ්ඩුවේ ප්‍රතිචාරයන් නම් ඉතාම විහිළු සහගතය. ආණ්ඩුවේ මුදල් ඇමති මංගල සමරවීරට අනුව මෙය ආර්ථික අර්බුදයක් නොවේය. මෙම කඩාවැටීම ආර්ථිකය ශක්තිමත් වීමේ තවත් ක්‍රමයකි. ආණ්ඩුවේ බොහෝ නායකයින් කියන්නේ, මෙය රුපියලේ කඩා වැටීමක් නොව ඩොලරයේ ශක්තිමත් වීම බවය. ඩොලරයේ ශක්තිමත්වීම රටට වාසිදායකය. "ඒ නිසා මේ කඩා වැටීම අපට ආශීර්වාදයක්ය" ආදී ලෙස මෙම පස්ස බිම ඇනීම මහා ආශීර්වාදයක් ලෙස උලුප්පා දැක්වීමට ආණ්ඩුවේ මැති ඇමැති බොහෝ දෙනෙක් උත්සාහ දරති. ඔවුන්ගේ තර්කය වී ඇත්තේ රුපියල කඩා වැටුණා නොව ඩොලරයේ ශක්තිමත් වීම සිදුවීම නිසා අපනයන ආදායම ඉහළ යන බවය. මංගල සමරවීර මුදල් ඇමතිවරයාද ආර්ථිකය කඩා වැටීමක් රුපියල කඩා වැටීමෙන් නොපෙනේ යැයි කියන්නේ මේ පදනමේම පිහිටා විය හැකිය. ඒ නිසාම අප විසින් මෙම රුපියල කඩා වැටීමේ හේතු සහ මින් මතුවිය හැකි සැබෑ ආර්ථික, දේශපාලනික ප්‍රතිවිපාක හොඳින් තේරුම් ගත යුතුව ඇත.



"වැඩකරන ජනතාවට තමන් හැර බලාපොරොත්තු රැඳවිය හැකි හෝ විශ්වාසය තැබිය හැකි වෙනත් කෙනෙක් නොමැත. වැඩ කරන මිනිසා තමාම නිදහස් නොවේනම් ඔහු නිදහස් කිරීමට වෙනත් කෙනෙක් නොමැත."

**ලෙනින්**
**කම්කරු පංතිය හා ගොවි ජනතාව අතර සන්ධානය**
**26 පිටුව**

### රුපියල්-ඩොලර් ඉතිහාසය

අපගේ මුදල් ඒකකය වන රුපියල අප ලෝකය ලෙස හුවමාරු කරන්නේ ඩොලරය සමගය. ලෝකයේ පිළිගත් ප්‍රධාන මුදල් ඒකක කිහිපයක් තිබුණද (යුරෝ, පවුම්, යෙන්, යුවාන් වැනි) තවමත් ලෝකයේ බහුතර රටවල් ජාත්‍යන්තරව හුවමාරු මුදල් ඒකකය ලෙස පිළිගන්නේ ඩොලරයයි. නිදහසට පෙර බ්‍රිතාන්‍ය පවුම්වලින් අප ගනුදෙනු සිදු කළද නිදහසින් පසු 1968 දක්වා ස්ථාවර හුවමාරු අගයක් (Fixed exchange rate) ලෙස ඩොලරයක් සඳහා රු.4.76ක් යොදා ගැනිණි. නමුත්, ප්‍රමාණවත් විදේශ සංචිත අඛණ්ඩව පවත්වා ගෙන යාමට අපහසු වීමෙන් "අවප්‍රමාණය" (Devaluation) හුවමාරු ක්‍රියාවලියට යොමුවීමට ශ්‍රී ලංකාවට සිදුවිය.



1966 පමණ වන විට යථාර්ථයට මුහුණ දීමේදී, තවදුරටත් ස්ථාවර හුවමාරු අගයක් රඳා ගත නොහැකි වීමෙන් ද්විත්ව හුවමාරු ක්‍රමයට (Dual exchange rate) මාරු වූ අතර එහිදී අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය නිල විනිමය අනුපාතයටත්, අත්‍යාවශ්‍ය නොවන ද්‍රව්‍ය සඳහා නිල අනුපාතයට ඉහළ 65%ක් පැනවූ සහතික කළ හුවමාරු වටිනාකමටත් හුවමාරු කරන ලදී. එය අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා විදේශ විනිමය භාවිතා කරන්නන් සඳහා 65%ක බදු පැනවීමට සමාන විය.

1977 දී විවෘත ආර්ථික මොඩලය ක්‍රියාත්මක කිරීමත් සමග පාවෙන විනිමය අනුපාත ක්‍රමයට මාරු වූ අතර (Flexible exchange rate) ඒ අනුව එකවරම 100%කින් පැවැති ඩොලරය අවප්‍රමාණ කරමින් ඩොලරයක් සඳහා රුපියල් හුවමාරුව රු.15.56ක් දක්වා වෙනස් කරන ලදී. මෙම පාවෙන විනිමය අනුපාත ක්‍රමය යටතේ ඩොලර් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම අනුව ඩොලරය හුවමාරු වන රුපියල් වටිනාකම තීරණය වීමට ඉඩ හරින ලදී. එහෙත් මීට පෙර අවස්ථාවල අවශ්‍ය විටෙක රජය මැදිහත් වී රුපියල පාලනය කිරීමද සිදු කරන ලදී. එය හැඳින්වූයේ පාවෙන, පාලිත විනිමය අනුපාතය ලෙසය. නමුත් මේ වනවිට රුපියල මුළුමනින්ම පාවෙන තත්වයට පත් කර තිබේ. නූල කැඩුණු සරුංගලයක් ලෙස ආර්ථිකය තුළ පළමුව රුපියල පාවෙන තත්වයට පත්වී, මේ වනවිට පාවීම වෙනුවට රුපියල කඩා වැටීමටත් එය දිනපතා සිදුවන ක්‍රියාවලියක් බවටත් පත්ව ඇත.

### කඩාවැටීමේ ගෝලීය සාධක

මහ බැංකු අධිපති ඇතුළු ආණ්ඩුවේ නිලධාරීන්ගෙත් ආණ්ඩුවේ දේශපාලකයින්ගේත් වත්මන් අර්බුදයට ඇති පොදු පැහැදිලි කිරීම වී ඇත්තේ මෙම රුපියල බාල්දු වීම අපට පාලනය කළ නොහැකි බාහිර (ජාත්‍යන්තර) සාධක නිසා සිදුවන්නක් බවයි. ඇමරිකා එක්සත් ජනපදය තම පොලී අනුපාත ස්ථාවර මට්ටමක තබා ගැනීමට ආයෝජනවලට ගෙවන පොලී අනුපාත ඉහළ දැමීම නිසා, මෙතෙක් කල් ඇමරිකාවේ පොලී අනුපාත අඩු නිසා ඇමරිකාවෙන් බැහැරව සිටි ආයෝජකයින් යළි ඇමරිකාවට ආයෝජන රැගෙන ඒමට පෙළඹීමෙන් ඇමරිකන් ඩොලරය ශක්තිමත් වීම මෙයින් එක් සාධකයකි.

එසේම මෑතකදී ඇමරිකා එක්සත් ජනපදය විසින් චීනයෙන් ඇමරිකාවට ආනයනය කරන භාණ්ඩ රැසකට ඉහළ බදු පැනවීම නිසා වන බලපෑමද ඇති බව පැවැසේ. මෙම කරුණු 100%ක් බැහැර කළ නොහැකි සාධකයන්ය. නමුත්. ආණ්ඩුව උත්සාහ කරමින් සිටින්නේ, මෙය හුදෙක්ම ජාත්‍යන්තර ආර්ථික ප්‍රතික්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් මිස ජාතික වශයෙන් ලංකාව තුළ ක්‍රියාත්මක වන දුබල ආර්ථික ප්‍රතිපත්තිවල අර්බුදයක් ලෙස නොදැකීමටය. නමුත් පැහැදිලිවම මෙය මෙතෙක් ලංකාව තුළ ක්‍රියාත්මක කළ රටට අවාසි ආර්ථික කොන්දේසි සහිත ආර්ථිකය මුළුමනින්ම පාලනයකින් තොරව විවෘත කිරීමේ ප්‍රතිඵලයකි. එනම් ජංගම ගිණුම හා ප්‍රාග්ධන ගිණුම විවෘත කිරීමේ ප්‍රතිඵලයයි.

### කඩාවැටීමේ ජාතික සාධක

ආණ්ඩුව පුනරුච්චාරණය කරන ලෙසට රුපියල කඩා වැටී ඇත්තේ ඩොලරය ශක්තිමත් වීමේ ප්‍රතිඵලයක් නිසා පමණක් නම් එය අනිකුත් මුදල් ඒකකවලට අදාළ නොවිය යුතුව ඇත. නමුත් මේ වසර තුළ ඩොලරයට සාපේක්ෂව පමණක් නොව යුරෝවට සාපේක්ෂවද 7%කින්ද ජපන් යෙන්වලට සාපේක්ෂව 10%කින්ද බ්‍රිතාන්‍ය පවුමට සාපේක්ෂව 7%කින්ද රුපියල කඩා වැටීමට ලක් වී ඇත. ඒ ඩොලරයේ ශක්තිමත් වීමක් නිසා පමණක් නොවේ. රුපියල බාල්දු වීමට ප්‍රධාන ලෙසම බලපෑ ඇත්තේ, දුර්වල අපනයන සහ නාස්තිකාර වියදම් පිළිබඳ ලංකාවේ ප්‍රතිපත්තියයි. රටට ගලා එන විදේශ විනිමය ආදායම මෙන් දෙගුණයක් රටින් එළියට ගමන් කරන, ආර්ථිකය සෝදාපාලු කළ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මෙම ආර්ථික ඛේදවාචකයට ඍජු ලෙසම මුළුමනින්ම බලපෑ හේතුවයි.

> රුපියල අවප්‍රමාණය වීමෙන් අපනයන ආදායම ඉහළ යන බවත් ඒ නිසා ඩොලරය ශක්තිමත් වන තරමට අපට වාසියයි සිතන මුදල් ඇමතිවරු මෙම අවාසි සහගත වෙළඳ ශේෂ පරතරය නොදකිති; නොදකී කියනවාට වඩා හිතාමතාම අමතක කර දමති.

ලංකාවේ ආනයන - අපනයන පරතරය ඍජු ලෙසම රුපියල කඩා වැටීමට බලපෑ ප්‍රධාන සාධකයකි. මෙය වෙළඳ ශේෂ පරතරයේ අර්බුදය ලෙසද හඳුන්වයි. ලංකාව 2018 වසරේ මුල් මාස 06 තුළදී පමණක් ඩොලර් මිලියන 5732ක් අපනයන (විදේශ රටවලට භාණ්ඩ විකිණීමෙන්) ආදායමක් උපයන විට, එම මාස 06 තුළදී ආනයන සඳහා ඩොලර් මිලියන 11,441ක් වියදම් කර ඇත. දිගින් දිගටම ලංකාවේ පවතින්නේ ඍණ (අවාසි) වෙළඳ ශේෂ පරතරයකි. එම පරතරය 2016 දී ඩොලර් මිලියන 8873කි. 2017 දී එය ඩොලර් මිලියන 9616කි. සෑම වසරකම මෙම පරතරය ඩොලර් මිලියන 10,000කට ආසන්නය. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ, අප රටක් ලෙස අපනයන ආදායමෙන් උපයන දේ ආනයන වියදම ලෙස ගෙවීමට තරම් ප්‍රමාණවත් නොවීමයි.

රුපියල අවප්‍රමාණය වීමෙන් අපනයන ආදායම ඉහළ යන බවත් ඒ නිසා ඩොලරය ශක්තිමත් වන තරමට අපට වාසියයි සිතන මුදල් ඇමතිවරු මෙම අවාසි සහගත වෙළඳ ශේෂ පරතරය නොදකිති; නොදකී කියනවාට වඩා හිතාමතාම අමතක කර දමති. ලංකාවේ තේ, රබර්, පොල්, ඇඟලුම්, කුළු බඩු වැනි සම්ප්‍රදායික අපනයනයන් තවදුරටත් ලෝක වෙළඳපොළේ තරඟය ජයගත හැකි ලෙස නවීකරණයකට පසුගිය දශක කිහිපය තුළම ලක් වී නොමැත. අපගේ ආදායම රඳා පවතින්නේම සම්ප්‍රදායික අමුද්‍රව්‍ය මට්ටමේ යැපුම් අපනයන ආර්ථිකයක් මතය.

පසුගිය දශක හතරක වකවානුවේ ක්‍රියාත්මක කළ ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති විසින් අපට රටක් ලෙස ඩොලර් ආදායම ඉපැයිය හැකි හොඳම ආදායම මාර්ග විදේශිකයින්ට පවරා හෝ විකුණා අවසන්ය. ඒ අතර කොළඹ වරායේ ප්‍රධාන ජැටි දෙකක්, හම්බන්තොට වරාය, වරාය බංකරින් සේවා, ටෙලිකොම් ආයතනය, (දැන් මැලේසියානු සමාගමකට විකුණා ඇත), තෙල් සංස්ථාවේ බෙදාහැරීම් 1/3ක් ඉන්දියාවට පවරා, ත්‍රිකුණාමලේ තෙල් ටැංකි සමූහයද දැන් විකිණීමට යෝජිතය. ආදායම ඉපැයිය හැකි මර්මස්ථාන අත්හැරියා පමණක් නොව, ලංකාවේම නිෂ්පාදනය කළ හැකි දේශීය කර්මාන්ත බොහොමයක් විකුණා දැමූ ධනපති පාලකයෝ, අද වනවිට රටේ සීනි අවශ්‍යතාවයෙන් 91.5%ක් ආනයනය කරති. වියලි මිරිස් වලින් 80%ක්ද ලොකු ළූණුවලින් 82%ක්ද, කඩදාසි මුළුමනින්මද, ලංකාව විසින් ආනයනය කරනු ලබයි. කිරිපිටි සඳහා වාර්ෂිකව රු. කෝටි 4,800ක් ලංකාවෙන් විදේශවලට ඇදී යයි.

තීරු බදු රහිත වාහන බලපත්‍ර නිකුත් කිරීමත්, සුඛෝපභෝගී මට්ටමේ වාහන සඳහා පැවැති බදු ඉවත් කිරීම

15 වැනි පිටුවට

# එක්සත් ජනපද තීරුබදු පාරාවළල්ලක් වන'යුරු




එක්සත් ජනපදය චීනයට එරෙහිව එක්සත් ජනපද ඩොලර් බිලියන 200ක වටිනාකමකින් යුක්ත නව තීරු බදු පැනවීමක් සිදුකිරීමට සූදානම් වේ. එයට එකට එක කිරීමක් වශයෙන් චීනයද තම රටට ආනයනය කරන එක්සත් ජනපද ඩොලර් බිලියන 60ක වටිනාකමකින් යුක්ත භාණ්ඩ සඳහා තීරුබදු පැනවීමක් සිදු කිරීමට සූදානම් වේ. චීනය මෙය හඳුන්වන්නේ තීරුබදු පැනවීමක් ලෙස නොව සම්බාධක පැනවීමක් ලෙසටය.

මේ වනවිට එක්සත් ජනපදය චීනයට පමණක් නොව මෙක්සිකෝව, කැනඩාව, යුරෝපය ආදී රටවලටද තීරු බදු පනවා තිබේ. අනෙක් අතට වෙනිසියුලාව, රුසියාව, ඉරානය, උතුරු කොරියාව ආදී රටවලටද සම්බාධක පනවා තිබේ. සෑම අවුරුද්දකම එක්සත් ජනපදය සම්බාධක පැනවීම සඳහා රටක් හෝ රටවල් කණ්ඩායමක් අලුතින් සොයා ගනී. එක් වර්ෂයක් තුළදී පුද්ගලයින් 1000කට පමණ සම්බාධක පනවයි. දේශපාලන විශ්ලේෂකයන්ට අනුව දැන් එය තීරණාත්මක ලක්ෂයකට පැමිණ තිබේ.

එක්සත් ජනපද ආර්ථිකය හා යුරෝපා සංගම් ආර්ථිකය එක්ව ගත් කළ ලෝක ආර්ථිකයෙන් භාගයකි. මෙතෙක් කල් එක්සත් ජනපදය සම්බාධක හෝ තීරු බදු පැනවූයේ ලෝක ආර්ථිකයේ අනෙක් අර්ධයටයි. නමුත් දැන් එය එසේ නොවේ. දැන් එක්සත් ජනපදය යුරෝපා සංගමයට තීරුබදු පනවා ඇති අතර ඒක්සත් ජනපදය පැනවූ ඇතැම් සම්බාධක විශේෂයෙන් ඉරානයට හා රුසියාවට එරෙහිව පැනවූ සම්බාධක යුරෝපා සංගමයටද වක්‍රව බලපාන්නේය. එක්සත් ජනපදය සය පාර්ශ්වික ඉරාන න්‍යෂ්ටික ගිවිසුමෙන් ඒක පාර්ශ්වීයව ඉවත් වී පනවන ලද සම්බාධක බලපා ඇත්තේ ඉරානයට පමණක් නොවේ. සම්බාධක ඉවත් කිරීමෙන් පසු ඉරානය සමඟ වෙළඳ ගනුදෙනු ආරම්භ කළ යුරෝපීය සමාගම්වලටද එය වක්‍රව බලපායි. ඒ මගින් එය යුරෝපා සංගමයේ නිදහස, ආරක්ෂාව හා ස්වාධීනත්වයටද බලපෑම් එල්ල කර තිබේ.

මේ මොහොතේදී ලෝක දළ ජාතික නිෂ්පාදිතයෙන් 1/4කට මදක් අඩු ප්‍රමාණයක් එක්සත් ජනපද ආර්ථිකය විසින් නියෝජනය කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව 2023 වර්ෂය වෙද්දී ලෝක දළ ජාතික නිෂ්පාදිතයෙන් 1/5ක දක්වා එක්සත් ජනපදය ආර්ථිකය හැකිළෙයි. එවිට ලෝක දළ ජාතික නිෂ්පාදිතයෙන් 4/5ක්ම නියෝජනය කරන්නේ චීනය, යුරෝපා සංගමය, ඉන්දියාව, රුසියාව ඇතුළු අනෙකුත් රටවල් විසිනි. එවිට එකී රටවල් එක්සත් ජනපදයේ මෙම සම්බාධක හා තීරු බදු පැනවීම් සමග ගැටුමකට පිවිසීම වැළැක්විය නොහැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ධනය වන තත්වයන් එක්සත් ජනපදයට වාසි සහගත නොවේ.

ගෙවීම් ක්‍රමවේදයන් හැකි තරම් එක්සත් ජනපද බැංකු මඟහරිමින් සිදු කිරීමේ ප්‍රවණතාවයක් වර්ධනය වීමට ඉඩ තිබේ. එක්සත් ජනපදයේ මෙම ක්‍රියාමාර්ගයන් අනෙකුත් රටවලට එක්සත් ජනපද බැංකු මඟ හරිමින් ගෙවීම් සිදුකිරීම සඳහා තමන්ගේම මුදල් ඒකක වර්ධනය කිරීමටත් තමන්ගේම ජාත්‍යන්තර බැංකු පද්ධතියක් වර්ධනය කර ගැනීමටත් සාධාරණ හේතුවක් සපයා තිබේ.

මූල්‍ය කර්මාන්තය එක්සත් ජනපද ආර්ථිකය ඉහළට ඔසවන විශාලතම වර්ධනය සපයන ක්ෂේත්‍රයයි. එයට ප්‍රමාණාත්මකව හා වර්ධනයේ වැඩිම ක්ෂේත්‍රයයි. (ආයුධ කර්මාන්තයද ඒ හා සමාන වුවද මූල්‍ය ක්ෂේත්‍රය ප්‍රමාණාත්මකව වැඩිය.) මේ හේතුවෙන් එක්සත් ජනපද ආර්ථිකයේ මූල්‍ය ක්ෂේත්‍රය බරපතළ ලෙස අඩපණ වීමට ඉඩ තිබේ. එය එක්සත් ජනපදයට මරු පහරකි.

එක්සත් ජනපදයේ ණය කාඩ්පත් (Credit card) ක්‍රියාවලියද අඩපණ වනු ඇත. ලෝක වෙළඳපොළෙහි වඩාත් ලාභදායක හා වේගයෙන් වර්ධනය වන මෙම ක්ෂේත්‍රයේ විශාල කොටසක් චීනය, යුරෝපය හා ඇතැම් විට ඉන්දියානු ණය කාඩ්පත් විසින් අත්පත් කර ගැනීමට ඉඩ තිබේ. රුසියාව එහි ප්‍රථම රට බවට පත් වෙමින් එක්සත් ජනපද ණය කාඩ්පත් සමාගම් එළවා දමා චීන ණය කාඩ්පත් සමාගම්වලට තම රට තුළ කටයුතු කිරීමට ඉඩ ලබා දුන්නාය.

ජාත්‍යන්තර ගනුදෙනුවලදී ඩොලරය අත්හැරීමේ ප්‍රවණතාවයක්ද වර්ධනය වී තිබේ. යුරෝපා සංගමය දැනටමත් බලශක්ති වෙළඳාමේදී ඩොලරය අතහැර යුරෝ වෙත ප්‍රවිශ්ට වී තිබේ. මේ වනවිටත් ලෝකයේ දැවැන්තම බොරතෙල් නිෂ්පාදකයින් වන රුසියාව, ඉරානය, වෙනිසියුලාව යන රටවල් ඩොලරය මඟහැර තමන්ගේම මුදල් ඒකකවලින් ගනුදෙනු කිරීමට හෝ ලෝකයේ නිල සංචිත මුදලක් ලෙස පිළිගත් යුවාන් වෙත යුවාන් වෙත මාරුවීම සිදුකර තිබේ. මේ නිසා ජාත්‍යන්තර වෙළඳාමේදී ඩොලරය සඳහා ඇති ඉල්ලුම අඩුවන අතර ඩොලරය ආපසු එක්සත් ජනපදය වෙත පැමිණීමෙන් රට තුළ උද්ධමනයක් හා ආර්ථික අර්බුදයක් ඇතිවීමේ අවදානම වර්ධනය වී තිබේ.

එබැවින් එක්සත් ජනපදයේ සම්බාධක පැනවීමේ හා තීරු බදු පැනවීමේ ක්‍රියාමාර්ග ඔවුන් බලාපොරොත්තු වන ප්‍රතිඵල ලබා නොදී වඩාත් දරුණු අර්බුදයකට එක්සත් ජනපදය ඇද දැමීමට හේතුවිය හැකියයි විශ්ලේෂකයෝ පවසති.

## වියට්නාම් ජනාධිපති නික්මයයි



වියට්නාම් ජනාධිපති ට්‍රැන් ඩායි ත්වැන්ග් සහෝදරයා සැප්තැම්බර් 21වැනි සිකුරාදා අභාවයට පත්විය. කලක් අසනීප තත්වයෙන් පසුවූ ඔහු මියයන විට 61වැනි වියෙහි පසුවිය. වියට්නාමයේ සන් ඩින් පළාතේ ගොවි පවුලක උපත ලැබූ ඔහු මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රධානියා ලෙස කලක් කටයුතු කළේය. ඔහු ජනාධිපති ධුරයට තෝරා පත්කර ගනු ලැබුවේ 2016 වසරේදීය. 1980 වර්ෂයේ සිටම වියට්නාම් කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කළ ඔහුගේ අවසන් කටයුතු සැප්තැම්බර් 26/27 දෙදින වියට්නාමයේ නින් බිම් පළාතේදී සිදු කෙරිණි.

## ඊශ්‍රායලයට රුසියාවෙන් ප්‍රතිචාර




ඊශ්‍රායලය විසින් පසුගිය සතියේදී සිරියානු ගුවන් යානයක් බිම හෙළා හමුදා නිලධාරීන් 15 දෙනෙකු ඝාතනය කිරීමට ප්‍රතිචාර වශයෙන් රුසියාව සිරියාවට එස්-300 මිසයිල පද්ධතියක් ලබාදීමට තීරණය කර තිබේ. මෙතෙක් ඊශ්‍රායලයේ ඉල්ලීම මත සිරියාවට එස්-300 මිසයිල පද්ධතිය ලබාදීම අත්හිටුවා තිබුණද ඉහත සිදුවීමත් සමඟ එම තීරණය වෙනස් කිරීමට රුසියාව තීන්දු කර තිබේ. මෙම මිසයිල පද්ධතිය ඉදිරි සති දෙක තුළදී සිරියාවට ලබා දෙනු ලබන අතර එමගින් කි.මී. 250 දක්වා දුරකදී ප්‍රහාරක මිසයිල විනාශ කර දැමීමටත් ඒ සමඟම අවශ්‍ය ඉලක්ක වෙත පහර දීමටත් හැකියාව ලැබේ.

මීට අමතරව රුසියාව විසින් සිරියාවේ රුසියානු නාවුක හමුදා කඳවුර ආශ්‍රිත කලාපය ගුවන් මුක්ත කලාපයක් ලෙසද ප්‍රකාශයට පත්කරන ලදී.

කෙසේ වෙතත් මෙම සිදුවීම් නිසා ඊශ්‍රායලය හා රුසියාව අතර දැනට පවතින සබඳතා තවදුරටත් පළුදු නොවනු ඇතැයි රුසියාව අපේක්ෂා කරයි.

## නේපාලයට චීන දොරටුවක්



චීනයේ සියලු වරායන් වෙළඳ හා අනෙකුත් කටයුතු සඳහා නේපාලයට භාවිතා කළ හැකි වන අයුරින් දෙරට සංක්‍රමණික රාජ්‍යතාන්ත්‍රික එකඟතාවයක් ඇතිකරගෙන තිබේ. මෙම එකඟතාව ඇතිකර ගැනුණේ 2016 මාර්තු මාසයේ ඉන්දියානු ආර්ථික සම්බාධක පනවා තිබූ මොහොතේ නේපාල අගමැති කේ.පී. ඕලි චීනයේ කළ සංචාරයේදී ඇතිකර ගත් මූලික එකඟතාවන් අනුවය.

දැනට නේපාලයට භාණ්ඩ ගෙන්වන්නේ ඉන්දියාවේ කල්කටා වරාය හරහාය. ඒ සඳහා අවම වශයෙන් මාස 03ක කාලයක් ගතවේ. මීට අමතරව ඉන්දියාව විශාකාපට්ටම් වරායද නේපාලයට භාවිත කිරීමට ඉඩ ලබාදී තිබේ.

නේපාලය හා චීනය අතර ඇතිකරගත් මෙම ගිවිසුම අනුව ඉන්දියාව මත යැපුණු නේපාලන ආර්ථිකයට ඉන් නිදහස් වීමට අවස්ථාව සැලසේ. එහෙත් චීන වරායයන්හි සිට නේපාලයට භාණ්ඩ ප්‍රවාහනය කිරීමද පහසු කටයුත්තක් නොවේ. නේපාලයේ චීන පැත්තේ ඇති මහා මාර්ග ඉතාම අබලන් තත්වයේ පවතී. බොහෝ මාර්ග පිළිසකර කළ යුතුව තිබේ. එසේම නේපාලයේ සිට චීනයේ ආසන්නතම වරායට කි.මී. 2600ක දුරක් තිබේ.

මේ තත්වයට පිළිතුරක් ලෙස චීනයේ සිට නේපාලයට මාර්ග පද්ධතියක් සකස් කිරීම සඳහා අවශ්‍ය ආධාර ලබාදීමට චීනය ඉදිරිපත්ව සිටින අතර චීනය හා නේපාලය අතර දුම්රිය මාර්ගයක් ගොඩනැගීමටද දෙරට අතර නිදහස් වෙළඳ ගිවිසුමක් ඇතිකර ගැනීමටද චීනය කටයුතු කරමින් සිටී.

## මාලදිවයින නව නායකත්වයක් අතට



පසුගිය සැප්තැම්බර් 23වැනිදා මාලදිවයිනේ පැවැත්වූ ජනාධිපතිවරණයෙන් එරට පොදු විපක්ෂය නියෝජනය කරමින් ඉදිරිපත් වූ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ඉබ්‍රාහිම් සාලි ජයග්‍රහණය කළේය. ඔහු ඡන්ද 1,34,616 (58%)ක් ලබා ගැනීමට සමත් වූ අතර ප්‍රගතිශීලී පක්ෂය නියෝජනය කරමින් ඉදිරිපත් වූ ජනාධිපති අබ්දුල් යමීන්ට ලබගත හැකි වූයේ ඡන්ද 96,132 (41.7%)ක් පමණි. ලියාපදිංචි ඡන්ද දායකයන් අතරින් 89.2%ක් ඡන්දය ප්‍රකාශ කර තිබුණි.

මේ අනුව මාලදිවයිනේ හත්වන ජනාධිපතිවරයා ලෙසත්, ඡන්දයෙන් තෝරා පත්කරගත් තුන්වන ජනාධිපතිවරයා ලෙසත් ඉබ්‍රාහිම් මොහොමඩ් සාලි නොවැම්බර් 17වැනි දින දිවුරුම් දීමට නියමිතය.

මාලදිවයින තුළ දේශපාලන බල අරගලයට ඉන්දියාවත්, චීනයත්, එක්සත් ජනපදයත් මැදිහත් වන්නේ එය පිහිටීමේ ඇති වැදගත්කම නිසාය. මෙම මැතිවරණ ප්‍රතිඵලයත් සමඟ ඉන්දියානු විදේශ අමාත්‍යාංශය මාලදිවයිනේ මැතිවරණ කොමසාරිස්වරයාට බලකර සිටියේ වහාම අවසන් ප්‍රතිඵලය නිකුත් කරන ලෙසය. චීනය මේ වන විටත් මාලදිවයිනේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල ණය ප්‍රමාණයක් ලබා දී තිබේ. දේශපාලන විචාරකයන් පවසන ආකාරයට ඒ හරහා චීනය මාලදිවයින ණය උගුලක සිරකර ගෙන ඇත. මේ අතර මැතිවරණයට ප්‍රථම එක්සත් ජනපදය මාලදිවයිනට අනතුරු අඟවා සිටියේ සාධාරණ මැතිවරණයක් නොපැවැත්වුවහොත් තමන් එරටට සම්බාධක පනවන බවටය.

කෙසේ වෙතත් පත්වූ නව පාලනයටද සිදුවනු ඇත්තේ මෙම කලාපීය බල අරගලයට මුහුණ දීමටය.

# සෝවියට් දේශය ගොඩනැගූ ආර්ථික සැලසුම්

රට හදන වැඩපිළිවෙළවල් පිළිබඳ මේ දිනවල රට තුළ සාකච්ඡා කෙරෙමින් තිබේ. මෙතෙක් අවස්ථා කිහිපයකදීම රට පාලනය කළ දේශපාලන පක්ෂ හා කණ්ඩායම්වලට හදිසියේම රට හදන ආකාරය පිළිබඳ උනන්දුවක් ඇති වී තිබේ. එහිදී ඔවුහු තමන් අවස්ථා ගණනාවක්ම රට පාලනය කළ බවත් එම අවස්ථාවලදී එවැනි වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම පිළිබඳ කිසිදු වුවමනාවක් තමන්ට නොතිබුණු බවත් අමතක කරති.

මේ අතර ඉතිහාසයේ ප්‍රථම වතාවට අප රටේ විද්වතුන් විසින්ද රට හදන වැඩපිළිවෙළක් කෙටුම්පත් කරමින් සිටිනු පෙනේ.

රටක් කිසියම් සැලැස්මකට අනුව ගොඩනැගිය යුතුය යන සංකල්පය පළමු වරට ඉදිරිපත් කරන්නේ වමේ ව්‍යාපාරය විසිනි. ඉතිහාසයේ ප්‍රථම වතාවට රටක් සැලසුම් සහගත ලෙස ගොඩනගන්නේ සමාජවාදය තුළදීය. සමාජවාදය තුළදී ක්‍රියාත්මක කරන පස් අවුරුදු සැලසුම් පිළිබඳ අපි කවුරුත් අසා ඇත්තෙමු.

ධනපති ක්‍රමය තුළදී ආර්ථිකය සැලසුම් කළ නොහැකිය. නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික අයිතියත්, ධනවාදයේ ක්‍රියාත්මක වන ස්වයංසිද්ධතාවත් නිසා එය කළ නොහැකිය. ධනවාදයේදී නිෂ්පාදනය සමාජමය වශයෙන් පාලනය කිරීම හා එහි සැලසුම් සහගත තුළනාත්මක ස්වාභාවය ඇති කිරීම අපහසුය. ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය ස්වභාවයෙන්ම අරාජික වේ.

එහෙත් සමාජවාදයේදී එය එසේ නොවේ. සමාජවාදී ආර්ථිකය සැලසුම් කරන ලද්දකි. අප බහුලව දන්නේ සමාජවාදයේදී ක්‍රියාත්මක කරන පස් අවුරුදු සැලසුම් පිළිබඳවය. පස් අවුරුදු සැලසුම් සමාජවාදී සැලසුම්කරණයේ එක් ආකාරයක් පමණි. සමාජවාදය තුළදී ආකාර කිහිපයක සැලසුම් සකස් කෙරේ.

★ අවුරුදු 20ක් සඳහා වන විද්‍යාත්මක හා තාක්ෂණ සංවර්ධනයට අදාළ විස්තීර්ණ වැඩසටහන් එක් ආකාරයකි. මේ යටතේ විද්‍යාවේ හා තාක්ෂණයේ සංවර්ධනයට අදාළ සැලසුම් සකස් කෙරෙන අතර ඒවා නැවත පස් අවුරුදු කාලයක් සඳහා නැවත වෙන් කරනු ලැබයි. සෝවියට් සංගමයේ අභ්‍යවකාශ වැඩපිළිවෙළ සැලසුම් වූයේ මේ ආකාරයටය.

මීට අමතරව රටේ එක් එක් ප්‍රදේශ සංවර්ධනයට අදාළව දිගු කාලීන සැලසුම් සකස් කෙරෙන්නේ මේ ආකාරයේ සැලසුම්කරණයේදීය. සෝවියට් සංගමය තුළ බටහිර සයිබීරියාව හා නැගෙනහිර සයිබීරියාව සංවර්ධනයට අදාළ වැඩසටහන් කෙරුණේ ඒ අයුරිනි.

★ අවුරුදු 10ක් සඳහා වන ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා වන සැලසුම් දෙවන ආකාරයයි. එයද අවුරුදු පහක කාලයක් සඳහා නැවත වෙන් කෙරේ.

★ තෙවන ආකාරය වන්නේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා වන පස් අවුරුදු සැලසුම්ය. පස් අවුරුදු සැලසුම් අවුරුද්දක කාලයක් සඳහා වෙන් කරනු ලබයි.

★ හතර වන ආකාරය වන්නේ වාර්ෂික සැලසුම්ය.

සමාජවාදය තුළදී මේ සැලසුම් ආකාර 04ම ක්‍රියාත්මක වන අතර ඒවා එකිනෙක හා සම්බන්ධ වන ලෙස සකස් කෙරේ. සැලසුම්වල අඛණ්ඩතාවය හා ස්ථාවරභාවය සහතික කරනු ලබන්නේ, දිගු කාලීන පස් අවුරුදු හා වාර්ෂික සැලසුම්වල සංකලනයෙනි.

## පළමුවන පස් අවුරුදු සැලැස්ම

ලෙනින්ගේ උපදෙස් පරිදි 1922 දී දීර්ඝ කාලීන ආර්ථික ආර්ථික සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ආරම්භ කරන ලදී. 1926 දී සියලුම සමූහාණ්ඩුවලට අයත් විද්‍යාඥයින් සැලැස්මක් සකස් කිරීමේ කටයුතුවල යෙදුන අතර රාජ්‍ය සැලසුම් කමිටුව රටේ පළමු පස් අවුරුදු සැලැස්ම සකස් කිරීම සඳහා මධ්‍යම කොමිසමක් පිහිටුවීය.

පස් අවුරුදු සැලසුම් හයක් ඉදිරිපත් විය. සැලසුම් එතරම් සංඛ්‍යාවක් වූයේ ඇයි? දේශපාලනික වශයෙන් රටම රත් වූ බොයිලේරුවක් මෙන් වූ බැවිනි. විවිධ කණ්ඩායම් තම මත හා වැඩපිළිවෙළවල් ඉදිරියට දැමීමට ගත් උත්සාහයන් නිසා තත්වය උණුසුම් වී තිබිණි.

ළදරු සෝවියට් රාජ්‍යයට බොහෝ සතුරෝ වූහ. එය වටා වූයේ සමාජවාදී විප්ලවයේ ගෙල සිරකොට, රට කැබලිවලට කඩා එහි සම්පත් සූරාගැනීමට මාන බැලූ සමාජවාදයට එරෙහි ධනවාදී ලෝකයයි.

මේ තත්වය යටතේ බොහෝ අන්තවාදී අදහස් ඉදිරිපත් කෙරිණි. සමහරුන්ගේ මතය වූයේ විනාශ වී ගිය රටක (1910-1918 පළමු ලෝක යුද්ධය හා 1918-20 සිවිල් යුද්ධය හේතුවෙන්) පුහුණු ශ්‍රමිකයන් බලවත් හිඟයක්ව තිබියදී පස් අවුරුදු සැලැස්මක් ක්‍රියාත්මක කළ නොහැකි බවයි. අනෙක් අයගේ අදහස වූයේ ඉතාමත් අසීරු කාර්යයන් ඇතුළු ඕනෑම දෙයක් විමුක්තිය ලත් ජනතාවට සපුරාගත හැකි බවයි. කෙටුම්පත් කළ පස් අවුරුදු සැලසුම් හය රටේ හැකියාවන් සම්බන්ධයෙන් වූ විවිධ ඇගයීම් මත පදනම් වී තිබිණි.

1928 අවසාන භාගයේදී පළමු පස් අවුරුදු සැලැස්ම ක්‍රියාවට නැංවීම ආරම්භ කරන විට සෝවියට් සංගමය ආර්ථික වශයෙන් වඩාත් දියුණු රටවලට වඩා වසර 50 සිට 100 දක්වා වූ කාලයකින් පිටුපසින් සිටියේය. දස අවුරුද්දක් තුළදී මේ පසුබැසීම ජයගත යුතුව තිබිණි.

පළමුවන පස් අවුරුදු සැලැස්ම ක්‍රියාවට නැගිය හැකිද යන්න ගැන ඒ දිනවල බොහෝ දෙනා තුළ පැවතියේ සැකයකි. එහෙත් සැලැස්ම ක්‍රියාවට නැංවීම අරඹා අවුරුදු දෙකක් ගතවීමටත් පෙර දැකිය හැකි වූ ප්‍රතිඵල අනුව සැලසුම් කළ ඉලක්කයටත් වඩා රටට ඉතා වැදගත් විශාල සහ අලුත් කර්තව්‍යයන් නිම කළ හැකි බව පෙනී ගියේය.

> අවසාන දිනට පෙර දින තුනෙහි හා රාත්‍රී තුනෙහි වැඩපොළේ එක් කම්කරුවකුදු කම්හලෙන් පිටට ගියේ නැත. යන්ත්‍ර හා උපකරණ ක්‍රියා කරවන්නන්, කොටස් එකතු කර පූට්ටු කරන්නන්, ඉංජිනේරුවරුන් හා සැලසුම්කරුවන් සියලු දෙනාම ඔවුන්ගේ කටයුතුවල නිරතව සිටියහ. 1931 අප්‍රේල් 30 දා ඔවුහු ප්‍රථම යවට මෝල සාදා අවසන් කළ බව කියැවෙන විදුලි පුවත ආණ්ඩුවට යැවූහ.

## ද්නිපර් ජල විදුලි යෝජනා ක්‍රමය

ද්නිපර් ගඟෙහි ඉදිවූ ද්නිපර්ස්ත්‍රොයි ජල විදුලි බල ස්ථානය නව ජීවිතයක් ගොඩනැගීමට අධිෂ්ඨානය කර ගත් ජනතාවගේ ඉමහත් උද්යෝගය පෙන්නුම් කළ හෙයින් එය සංකේතාත්මක වශයෙන් මෙන්ම ප්‍රායෝගික වශයෙන්ද අතිශයින් වැදගත් විය. ආරම්භයේදී ගොඩනගන්නන් සතුව තිබුණේ උපකරණ හා ආයුධ ඉතා සුළු ප්‍රමාණයකි. මූලික ප්‍රවාහන පහසුකම අශ්වයින් බැඳි සම්ප්‍රදායික කරත්ත වූ අතර ප්‍රධාන ආයුධ වූයේ බිම කොටන ඉස්කෝප්පය, සවල, ගල්කටුව, යකඩ ඉන්න, නගුල් පෝරුව හා විල් බැරෝව යන මේවාය. මේ ආදිකල්පිත උපකරණවල ආධාරයෙන් ජනතාව පස් ටොන් ගණන් ඉවත් කර කියුබික් මීටර් දහස් ගණනක කොන්ක්‍රීට් දමා දැවැන්ත වානේ ව්‍යුහයන් ඉදිකොට විශාල උපකරණ සවි කළහ.

ද්නිපර් ජල විදුලි බල යෝජනා ක්‍රමය ගොඩ නැගෙමින් පවතිද්දී සුප්‍රසිද්ධ ජර්මන් බලශක්ති ඉංජිනේරුවරයෙකු වූ මහාචාර්ය එලෙසිංගර් කීවේ ජල විදුලි මධ්‍යස්ථානය ගොඩනැංවීම සඳහා සෝවියට් ජනතාව අන්තිම පැංස කිහිපය පවා දෙන අතර එම යෝජනා ක්‍රමය ලෝකයේ විශිෂ්ටතම එකක් වන බවයි.

සැබැවින්ම ජනතාවට අවසන් කොපෙක් එක පවා ඉතිරි කිරීමට සිදුව තිබුණි. ඒ, ද්නිපර් යෝජනා ක්‍රමය ගොඩනැගීමට පමණක් නොවේ; රජය වියදම් අඩු කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබූ බැවින් සමහර මූලික අවශ්‍යතාවන් නොමැතිව පවා ජීවත් වීමට ජනතාවට සිදු විය.

මුලින් ලුහු කර්මාන්තය වර්ධනය කර එමගින් කාර්මීකරණයට පිවිසීමේ බටහිර රටවල් යෝජනා කළ මාර්ගය සෝවියට් සංගමයට යෝග්‍ය නොවීය. එමගින් කර්මාන්තකරණයට ළඟා වීමට දීර්ඝ කාලයක් ගත වීමට ඉඩ තිබුණි. සෝවියට් සංගමයට බැර කර්මාන්තය වාර්තාගත තරම් කෙටි කාලයක් තුළ ගොඩනැගීමට සිදුව තිබිණි. ඒ අනුව නිෂ්පාදන කාර්යය සඳහා යොදා ගන්නා යන්ත්‍ර උපකරණ පිටරටින් ගෙන්වීම වෙනුවට ඒවා රට තුළම නිපදවා ගැනීමටත්, එමගින් රට ආර්ථික වශයෙන් ධනපති රටවලින් නිදහස් වීමටත් අවශ්‍ය විය.

1932 මැයි 01වැනි දා ද්නිපර් ජල විදුලි මධ්‍යස්ථානයේ පළමු වැනි ජනන යන්ත්‍රය ක්‍රියාත්මක කෙරුණි. එම වසරේ ඔක්තෝබර 10 දින මධ්‍යස්ථානය නිල වශයෙන් විවෘත කෙරිණි. එකල විශේෂඥයන්ගේ තක්සේරුව අනුව ද්නිපර් ජල විදුලි බල මධ්‍යස්ථානයේ ධාරිතාව කම්කරුවන් මිලියන 16කට සමාන විය.

## සෝවියට් සංගමයේ ප්‍රථම යවට මෝල (Blooming Mill) ගොඩනැගීම

සෝවියට් සංගමයේ ප්‍රථම යවට මෝල ගොඩනැගීම සඳහා 1930 අගෝස්තුවේදී ලෙනින්ග්‍රාඩ් අසල ඉෂෝර්ස්ක් වැඩපළට ආණ්ඩුවෙන් ඇණවුමක් ලැබිණි. මෙවැනි සංකීර්ණ උපකරණ නිපදවීම සම්බන්ධයෙන් සෝවියට් කාර්මික ආයතනයන්ට කලින් අත්දැකීම් තිබුණේ නැත.

ඊට ටික කලකට ඉහතදී යවට මෝලක් තැනීම සඳහා ජර්මනියේ ඩෙමැග් (Demag) සමාගමට සෝවියට් රජය විසින් ඇණවුමක් භාර දී තිබුණි. ඊෂෝර්ස්ක් කම්හලේ කම්කරුවෝ මෙම සමාගම සමග තරග

15 වැනි පිටුවට






"මම නැවත සටන් පෙරමුණට පැමිණෙන බව විශ්වාස කරමි. ඉදිරියට යන පෙරමුණු බල ඇණියේ මගේ බයිනෙත්තුවද දිලිසෙනු ඇත. අවුරුදු දහයක් තිස්සේ කොමියුනිස්ට් පක්ෂයත්, කොම්සොමොල් සංවිධානයත් සටන් කිරීමේ කලාව මට උගැන්වීය. අපේ නායකයාගේ වචන මටද එකසේ බලපායි: 'බොල්ෂෙවික්වාදීන්ට මෙල්ල නොවන බලකොටු නොමැත'."

**නිකොලායි ඔස්ත්‍රොව්ස්කි**



# කාන්තා බලය හා බාල්දුවීමේ තකතීරුකම

"කාන්තාවන් මුහු නොවී මහා සමාජ පරිවර්තනයක් සාර්ථක කළ නොහැකි බව ඉතිහාසය ගැන අල්ප දැනීමක් ඇති ඕනෑම කෙනෙක් දනිති.''යි මාක්ස්වාදී දර්ශනයේ නිර්මාතෘ කාල් මාක්ස් වරෙක පැවසීය. මාක්ස් එසේ පවසා මීට සියවසකට වැඩි කාලයක් ගතවී ඇතත් අදටත් එම ප්‍රකාශය වලංගුය. මන්ද කාන්තාවන් යනු සමාජයක සම කොටස්කාරියන් බැවිනි. එම නිසා රටක ආර්ථික හා දේශපාලන වැනි ප්‍රධාන ක්ෂේත්‍රයන් තුළ කාන්තාවන් දක්වන දායකත්වයේ මට්ටම අනුව එම රටේ සංවර්ධන මට්ටම පවා නිර්ණය කිරීමට හැකිය.

රටක ආර්ථික ක්‍රියාවලියට ඵලදායී ලෙස කාන්තාවන් යොදාගත් රටවල ආර්ථික සංවර්ධනය දියුණු මට්ටමක පවතින අතර එය කාන්තාවන්ගේ ජීවන මට්ටම ඉහළ තලයක පවත්වා ගැනීමට රුකුලක් වී ඇත. එහෙත් අපේ රටේ සිටින කාන්තා ශ්‍රම බලකායෙන් විශාල පිරිසක් තවමත් ඵලදායී ලෙස රටේ ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කරගෙන නොමැත. බහුතරයක් කාන්තාවන් සම්බන්ධ වී සිටින්නේ සුළු පරිමාණයේ පවුලේ ආර්ථික කටයුතුවලට බැවින් ඒ සඳහා වැටුපක් ඔවුන්ට හිමිවන්නේ නැත. බොහෝ විට එවැනි ආර්ථික කටයුතුවලින් ලැබෙන ආදායම පවුලේ නඩත්තුවටත් ප්‍රමාණවත් නොවේ. කාන්තාවන් බහුතරයක් ආර්ථික වශයෙන් ස්වාධීන තත්වයක නොමැති නිසා තවත් කෙනෙක් මත යැපෙන්නට ඔවුන්ට සිදු වී ඇත. ආර්ථික වශයෙන් පරාධීන තත්වයක සිටින නිසාම ඔවුන්ට ස්වාධීනව තීන්දු තීරණ ගැනීමට ඇති හැකියාවත් අඩුය.

එසේම දේශපාලනයේදී කාන්තාවන්ගේ දායකත්වය බොහෝ විට ලඝු වී ඇත්තේ යම් දේශපාලන පක්ෂයක හිතවාදීන්, සාමාජිකාවන් ලෙස පමණය. එසේ දායකවන්නේද දැනුවත්කමින් තොරවය. බොහෝ විට තමා රැඳී සිටින දේශපාලන පක්ෂය තීරණය වන්නේ යම් පක්ෂයක ප්‍රතිපත්ති මත නොව තම පවුලේ වැඩිහිටියන්ගේ හෝ තම ස්වාමිපුරුෂයාගේ දේශපාලනය මතය. නැතහොත් දේශපාලන පුද්ගල ප්‍රතිරූප මතය. මේ දේශපාලන අනවබෝධය නිසාම ධනපති දේශපාලන පක්ෂ නායකයින්ට රිසි ලෙස කාන්තාවන් හැසිරවීමට හැකි වී ඇත.

කාන්තාවන්ගේ මේ දේශපාලන නොදැනුවත්භාවය නිසා ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් ඉන්නා ධනපති නායකයින් තම බලය පෙන්වීමට ප්‍රදර්ශනාත්මක තලයේ කරනු ලබන රැස්වීම්, පෙළපාලි, උද්ඝෝෂණ යනාදියට සම්බන්ධවන පුද්ගලයින්ව තම අතකොළු බවට පත්කරගෙන ඇත. නායකයින්ට අවශ්‍ය ඕනෑම දෙයක් ඔවුන් ලවා කරවා ගැනීමට හැකිවන තරමටම මේ අඳබාලබව බරපතළය. මෑත ධනපති දේශපාලන භාවිතාව තුළ එය මැනවින් පෙන්වා දී ඇත.

මෑතදී රාජපක්ෂලා විසින් 'ජනබලය' නමින් කරනු ලැබූ පෙළපාලිය තුළද එය එලෙසම දක්නට ලැබිණි. වඩාත් ඛේදනීය තත්වය නම් කාන්තාවන්ව හැල්ලුවට ලක්වන ආකාරයේ සටන්පාඨ කාන්තාවන් විසින්ම හඬ නගා කීමය. කවුරුන් හෝ විසින් ලියාදෙන සටන්පාඨ එහි අර්ථය ගැනවත් නොසිතා ඔහේ ගිරවුන් සේ කියවීමට තරම් කාන්තාවන් පහතට වැටීම වඩාත් බරපතළ කාරණාවකි.

මෙරට මැතිවරණවලදී රටේ තීරණාත්මක සාධකයක් වන්නේ කාන්තා ඡන්ද ප්‍රමාණයයි. එහෙත් බහුතරයක් කාන්තාවන් තම ඡන්දය නිවැරදි ලෙස තවමත් භාවිතා කිරීමට සමත්ව නැත. තමන්ගේත් තම දරුවන්ගේත් අනාගතය ගැන නොසිතා යමෙකු දෙන අල්ලසක් මත, යම් ආකාරයේ ප්‍රතිලාභයක් මත, විවිධ පොරොන්දු මත, පුද්ගල ප්‍රතිරූප මත තම ඡන්දය පාවිච්චි කිරීමට බොහෝ කාන්තාවෝ හුරුව සිටිති.

කාන්තා බලය යනු සුළු කොට තැකිය හැක්කක් නොවේ. අපේ රටේ ජනගහනයෙන් කාන්තා ප්‍රතිශතය 51%කට වැඩිය. කාන්තාවන් අවබෝධයෙන් නිවැරදි පෙරමුණකට එක් වුවහොත් මේ අසාධාරණ, අයහපත් සමාජය වෙනස් කිරීම දුෂ්කර නොවනු ඇත. නමුත් කාන්තාවන් ධනපති දේශපාලකයින්ට වුවමනා අයුරින් හැසිරවිය හැකි පිරිසක් බවට පත්වන්නේ නම්, ඒ තුළ තම පෞරුෂය ගැන නොසිතා තමාවම 'බාල්දු' කරගන්නේ නම්, දේශපාලනය පිළිබඳ දැනුවත්භාවයෙන් තොරව කටයුතු කරන්නේ නම් තමන් සමගින් අනාගත පරපුරත් රැගෙන යන්නේ අගාධයට බව කාන්තාවන් විසින් සිහි තබා ගත යුතුය.



## බලන් ගිනි පුළිඟු ඇත කඳුළු වතුරෙන් ඇවිලෙන

ඉසුරු දෙව්ඳුනි කොහිද ඔබ?
උමයංගනාවන් වැළපෙනු නොදැක..
නළල දිලි කොකුමගර වෙනුවට
උණ්ඩයෙන් රතු තිලක තැබූ වග..
ආඬි ලිංවල ගැඹුරු පත්ලේ
කඳුළු උල්පත් පිරී ගිය බව
නොදැක, කොහිද ඔබ...?

එකම යායට ඔමරි පෑ
සුදු මිරිස් මල් පරවුණා.
වරල රැඳි සුදු පිච්ච මල් වැල්
අදත් තැන තැන විසිරෙනා..
දෙවිඳ, උමයංගනාවන් නෙත
මුකුලිතව අසරණ වුණා...

පඬුරු, පාවඩ ඉවත විසිකර
බිමට ඇවිදින් නෙත් යොමා.
බලන් තැන තැන
ගිනි පුළිඟු ඇත
කඳුළු වතුරෙන් ඇවිලෙනා..
දසත විසිරුණු පිච්ච මල්ගෙන
එකම දමකට අමුණලා
හිසෙහි ගවසන්නට නොහැකිද
දෙවොල හැර යනු පිටවෙලා..

## ලංකාවේ ළමුන්ගේ තතු

- වයස අවුරුදු 14ට ළමා ජනගහනය - 5 392 610
  මුළු ජනගහනයෙන් ළමා ප්‍රතිශතය - 24%
  (2017 ජුලි වනවිට)

- කිලෝග්‍රෑම් 2.5ට අඩු බර දරු උපත් - 15.7%
- ළමා මන්දපෝෂණය - 52.9%
  (වයසට අනුව බර අඩු - 20.5%
  උසට අනුව බර අඩු - 17.3%
  වයසට අනුව උස අඩු - 15.1%

- පාසල් නොයන පිරිමි ළමුන් - 2.3%
  (මඩකලපුව 4.6%
  බදුල්ල 4.5%)
- පාසල් නොයන ගැහැණු ළමුන් -4.2%
  (නුවර එළිය - 10.4%
  බදුල්ල - 9.3%)

- ළමා ශ්‍රමිකයන් - 43 714 (ළමා ජනගහනයෙන් 1%)
  එයින් 39 007ක් (ළමා ජනගහනයෙන් 0.9%ක්)
  අනතුරුදායක රැකියාවන්හි නිරත වේ.



ඉතිහාසයේ කතාව... 02

# ඉතිහාසය ඇරඹුණු හැටි





"ලෝකය ඉදිරියට යයි. අනාගතය හිරු මෙන් දිදුලනු ඇත. ඉතිහාසය බර වේගෙන යන මේ අත වෙනස් කරන්නට කිසිවෙකුටත් බැරිය. ජයග්‍රහණය ගැන තමන්ගේ විශ්වාසය ගොඩ නගාගන්නට ජනතාවට හැකිවන සේ අප ඔවුන් අතර ලෝක ප්‍රගතියත්, ප්‍රභාෂ්වර අනාගතයත් පිළිබඳ සත්‍ය කරුණු නිරතුරුවම ප්‍රචාරය කර ගෙන යා යුතුයි."

**මාවෝ සේතුං**
**තෝරාගත් කෘති 4වැනි කාණ්ඩය, 59 පිටුව**

ඉතිහාසය පිළිබඳව කරනු ලබන අධ්‍යයනයකදී අප මුහුණපාන පළමු අභියෝගය වන්නේ, ඉතිහාසය පටන් ගත්තේ කොතැන සිටද යන්නය. මේ නිසා ඉතිහාසය යනු කුමක්දැයි දළ වශයෙන් විග්‍රහ කරගත යුතුව තිබේ. ඉතිහාසය යනු හුදු අතීතයම නොවේ. අතීතය හා ඉතිහාසය අතර ප්‍රධාන වෙනසක් තිබේ. අතීතය, කාලය හා බැඳුණු සංකල්පයකි. එයට කෙළවරක් හා ආරම්භයක් නැත. එහෙත් ඉතිහාසයට ආරම්භයක් තිබේ. එසේනම් ඉතිහාසයේ ආරම්භය සනිටුහන් කරන ප්‍රධාන සාධක මොනවාද? සාමාන්‍යයෙන් අප 'ඉතිහාසය' ලෙස අධ්‍යයනය කරන්නේ, මානව සමාජය හා මානව ක්‍රියාකාරකම්වල අතීතය බව බැලූ බැල්මට පෙනේ. ඒ අනුව මානව සමාජය බිහිවූ දා සිට මානව වර්ගයා විසින් සිදුකරන ලද ක්‍රියාකාරිත්වයන්ගේ අතීතයට අයත් වූ සියලු දේ ඉතිහාසය ලෙස සැලකිය හැක. කෙටියෙන් ගත් විට මානව වංශ කතාවේ අතීතය ඉතිහාසය වේ. ඉන් අදහස් වන්නේ මිනිසා බිහිවීමට පෙර අතීතයක් තිබුණද එය ඉතිහාසය නොවන බවය.

## ඉතිහාසයේ ආරම්භය කොතැනද?

ඉතිහාසය යනු මානව පැවැත්මේ අතීතය නම් ඉතිහාසය පටන් ගන්නේ, 'මිනිසා' බිහිවීමත් සමඟය. මෙය මෙලෙස තර්ක කළ හැකි වුවත් එය එතරම් සරල නොවේ. ක්‍රිස්තියානියට අනුව පළමු මිනිසා වන 'ආදම්' දෙවියන්ගේ මැවීමකි. එවිට ඉතිහාසය ආරම්භ වන්නේ ආදම්ගේ සිටය. එය එතරම් දිගු නැති ඉතිහාසයකි. නමුත් මෙම සංකල්පය දැන් බයිබලයට පමණක් සීමා වූ සංකල්පයකි. වෙනත් ආගම් විසින්ද මිනිසාගේ ආරම්භය ගැන විවිධ විඥානවාදී සංකල්පයන් ඉදිරිපත් කොට තිබේ. එහෙත් වර්තමානයේ පොදු විද්‍යාත්මක පිළිගැනීම වන්නේ පරිණාමවාදයයි. මිනිසා වානර වර්ගයකින් පරිණාමය වූ බව පරිණාමවාදයත් මානව විද්‍යාවත් පුරාවිද්‍යාවත් විසින් ඔප්පු කරනු ලැබ තිබේ. එබැවින් ඉතිහාසය පටන් ගන්නා නිශ්චිත දිනයක් නැත. ඒ, 'පළමු මිනිසා' බිහිවූ දිනයක් නැති නිසාය.

මානව කල්ප වානරයින්ගෙන් හොමෝසේපියන් නම් මිනිසා බිහිවූයේ පරිණාම ක්‍රියාවලියක් තුළ නිසා ඉතිහාසයේ ආරම්භය පිළිබඳ පවතින්නේද දළ වකවානුවකි. නූතන ලක්‍ෂණ සහිත මානවයා මීට අවුරුදු ලක්‍ෂයකට, එක්ලක්‍ෂ විසිපන්දහසකට පමණ පෙර ලොව පුරා පැතිරීම පටන්ගත් බව පොදු මතයක් පවතී. එහෙත් එම මානවයා ශිෂ්ටාචාරගතව ජනාවාස සකස්කරගෙන ස්ථාවර ජීවිතයක් පටන් ගන්නා තෙක් 'ඉතිහාසය' ලෙස සැලකිය හැකි යමක් අපට හමුවන්නේ නැත. සාමාන්‍යයෙන් පොදු පිළිගැනීම අනුව ඉතිහාසය ලෙස සැලකෙන්නේ, ලිඛිත ඉතිහාසයයි. ලිඛිත ඉතිහාසය ආරම්භ වන්නේ, සමාජය තුළ දේපළ මත පංති බිහිවී රජය බිහිවීමත් සමගය. උදාහරණයක් ලෙස ලංකාවේ ඉතිහාසය අරම්භ වන්නේ 'විජය පැමිණීම' ලෙස සඳහන්කර ඇති ඉන්දු යුරෝපීයන්ගේ මෙරටට පැමිණීම හා රජය ඇතිවීමත් සමඟය. ලංකාවේ ඉතිහාසය රජවරුන්ගෙන් පටන් ගන්නේ ඒ නිසාය.

## ඉතිහාසය හා ප්‍රාග් ඉතිහාසය

මානව ඉතිහාසය ලිඛිත ඉතිහාසයෙන් පටන් ගත්තත් ඉතිහාසයේ සැබෑ අරම්භය එය නොවේ. ඊට පෙරද මිනිසා සමාජයක් ලෙස ජීවත් වූ අතර නිෂ්පාදනය මගින් තම අවශ්‍යතා සපුරා ගන්නා ලදී. එබැවින් ඉතිහාසය ලිඛිත ඉතිහාසයෙන් ඔබ්බට යා යුතුය. සාමජය මෙම ගැටලුව විසඳනු ලැබුවේ ප්‍රාග් ඉතිහාසය හෙවත් ඉතිහාසයට පෙර යුගයක් පිළිබඳ අධ්‍යයනය ආරම්භ කරමිනි.

1848දී මාක්ස්-එංගල්ස් කොමියුනිස්ට් පක්‍ෂයේ ප්‍රකාශනය ලියන විට එහි පළමු වාක්‍ය ලෙස සඳහන් කළේ 'මෙතෙක් පැවති සමාජයන්ගේ ඉතිහාසය වූකලී පංති සටන්වල ඉතිහාසයයි' යනුවෙනි. මන්ද ඒ වනවිට මිනිසාගේ ආදිකාලීන පැවැත්ම පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණයක් සිදුවී ඒ පිළිබඳ හෙළිවී නොතිබූ නිසාය. එහෙත් 1860 දශකයේ ඇමරිකානු ජාතික මානව විද්‍යාඥයෙක් වූ ලෙවිස් මෝර්ගන් මේ පිළිබඳ පරීක්‍ෂණ සිදු කළ අතර ඔහු 1877දී 'පැරණි සමාජය' නම් කෘතිය එළිදැක්වීය. එසේම මේ කාලය වනවිට රුසියාවේ පොදු ඉඩම් අයිතිය සහිත සමාජයක් පිළිබඳ තොරතුරුත් ඉන්දියාවේ හා ජර්මනියේ ආදිකාලීන සමාජයන් පිළිබඳ තොරතුරුත් හෙළිදරව් වෙමින් පැවතිණි. පැරණි සමාජය පිළිබඳ එනම් පංති සමාජයට පෙර තිබූ සාමූහික සමාජයක් පිළිබඳ මෝර්ගන්ගේ ඉගැන්වීම් අධ්‍යයනය කළ මාක්ස් හා එංගල්ස් පසු කලෙක කොමියුනිස්ට් ප්‍රකාශනයේ මුල් වාක්‍යයට එකතුවක් කරමින් ඉන් අදහස් කරන්නේ, ලිඛිත ඉතිහාසය බවත් ඊට පෙර ඉතිහාසයක් තිබෙන බවත් පැවසූහ.

> ඉතිහාසය හැදෑරිය යුත්තේ විඥානවාදී හෝ පාරභෞතිකවාදී දැක්මක සිට නොව විද්‍යාත්මක ද්‍රව්‍යවාදී දැක්මක සිටය. පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවූ මිනිසා සමාජයක් ලෙස සංවිධානය විය. එබැවින් අප මිනිස් සමාජයක් ගැන කථා කරමු. මිනිස් සමාජය සත්ව රංචුවෙන් වෙනස් වෙයි. එසේ වෙනස් වන මූලිකම සාධකය වන්නේ 'ශ්‍රමය'යි.

මේ අනුව පළමු පංති සමාජයෙන් ඇරඹී ලේඛනගත වූ යුගය ඉතිහාසය ලෙසත් ඊට පෙර මානව සමාජය ප්‍රාග් ඉතිහාසය ලෙසත් වර්ග කෙරිණි. ලංකාවේදී 'විජය පැමිණීම' සමඟ ආරම්භ වන ඉතිහාසය (ප්‍රබන්ධ කළ ඉතිහාසය!) ලිඛිත ඉතිහාසය ලෙසත් පුරාවිද්‍යාව විසින් හෙළිකර ගන්නා ලද ඊට පෙර මානව ක්‍රියාකාරකම් සහිත යුගය ප්‍රාග් ඉතිහාසය ලෙසත් වර්ග කර තිබේ. මහාචාර්ය රාජ් සෝමදේවයන්ට අනුව හෝමෝ සේපියන්වරුන් ලංකාවේ දකුණුදිග තැන්නේ හම්බන්තොට ප්‍රදේශයට ගොඩබැස ඇත්තේ මීට වසර එක්ලක්‍ෂ විසිදහසකට පමණ පෙර බව "ශ්‍රී ලංකාවේ ආදි ඉතිහාසය" නම් ඔහුගේ කෘතියේ දැක්වේ. එබැවින් ලංකාවේ ජනතාවගේ සැබෑ ඉතිහාසය ආරම්භ වී ඇත්තේ ක්‍රි.පූ. 06වැනි සියවසේ නොව අවම තරමින් මීට වසර ලක්‍ෂයකට පමණ පෙර සිට බව පැහැදිලිය.

## ඉතිහාසය ද්‍රව්‍යවාදී දැක්මකින්

ඉතිහාසය හැදෑරිය යුත්තේ විඥානවාදී හෝ පාරභෞතිකවාදී දැක්මක සිට නොව විද්‍යාත්මක ද්‍රව්‍යවාදී දැක්මක සිටය. පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවූ මිනිසා සමාජයක් ලෙස සංවිධානය විය. එබැවින් අප මිනිස් සමාජයක් ගැන කථා කරමු. මිනිස් සමාජය සත්ව රංචුවෙන් වෙනස් වෙයි. එසේ වෙනස් වන මූලිකම සාධකය වන්නේ 'ශ්‍රමය'යි. සතුන්ට නැති මිනිසා සතුව ඇති ප්‍රධානම හැකියාව වූයේ සොබා දහමේ දේවල් තම පරිභෝජනය සඳහා වෙනස්කර ගත හැකි (නිෂ්පාදනය කළ හැකි) හැකියාව වූ ශ්‍රම ශක්තියයි. ඊට අමතවර සවිඥානික තාර්කික චින්තනය හා භාෂාවක් කථාකිරීමේ හැකියාවද මිනිසාට විශේෂිතය. මේ අනුව මිනිස් සමාජයත් මානව ඉතිහාසයත් පටන් ගන්නේ, මිනිසා ශ්‍රමය හා උපකරණ යොදාගනිමින් තම යැපීමේ මාධ්‍යයන් 'නිපදවා' ගැනීම ඇරඹීමත් එම නිෂ්පාදන ක්‍රියාවලිය මත සාමූහයක් ලෙස ගොනුවීමත් සමඟය. එබැවින් ඕනෑම සමාජයක මිනිසුන් අතර ඇති සම්බන්ධතාවය තවත් නිෂ්පාදන සබඳතාවයක්ද වේ. සතුන් රංචුවක් ලෙස සිටීමේදී එම 'රංචුව' සෑදීමේ ප්‍රධාන සාධකය වන්නේ සොබාදහම විසින් උන්ගේ පැවැත්ම සඳහා නිර්මාණය කරනු ලැබූ ජීවවිද්‍යාත්මක සම්බන්ධතාය. එහෙත් මිනිස් සමාජයක් තුළ ජීවවිද්‍යාත්මක සබඳතා අභිබවා නිෂ්පාදන සබඳතා ප්‍රබල වී තිබේ. එබැවින් මානව සමාජයත් එහි ඉතිහාසයත් අධ්‍යයනය කිරීමේ අප පදනම් කරගත යුතු ප්‍රධාන සාධකය වන්නේ නිෂ්පාදනයයි.

මේ අනුව මානව සමාජය ඉතිහාසයේ විවිධ යුග පසුකරමින් සංවර්ධනය වී තිබේ. ඒ හැම යුගයක්ම තවත් යුගයකින් වෙනස් වන්නේ, නිෂ්පාදන ක්‍රියාවලිය හෙවත් නිෂ්පාදන මාදිලිය පදනම් කරගෙනය. මේ පිළිබඳව යුගයෙන් යුගය හඳුනා ගැනීමට ඉදිරියේදී හමුවෙමු.

# අයාලේ යන ඖෂධ ප්‍රතිපත්තිය

බහුජාතික ඖෂධ සමාගම් විසින් ජනතාව සූරාකෑමට එරෙහිව ලොව ප්‍රථම විද්‍යාත්මක ජාතික ඖෂධ ප්‍රතිපත්තිය හඳුන්වාදීම සිදුකරනු ලැබුවේ මහාචාර්ය සේනක බිබිලේ විසිනි. ඌව වෙල්ලස්සෙන් බිහිවූ ශ්‍රී ලංකාවේ ප්‍රථම ඖෂධවේදී මහාචාර්යවරයා වශයෙන් කටයුතු කළ ඔහු ඝාතනය කර 2018 සැප්තැම්බර් 30 වන විට වසර 41ක් ගතවී ඇත. නමුත් ඔහු විසින් ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් හඳුන්වා දී බහු ජාතික ඖෂධ සමාගම් මගින් ජනතාව සූරාකෑම නැවැත්වීම වෙනුවෙන් නැගූ හඬ අදටද අපට වැදගත් වේ. ඔහු විසින් හඳුන්වා දුන් එම ප්‍රතිපත්තියේ මූලික කරුණු පදනම් කරගනිමින් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. ලංකාවට අමතරව ඔහු තවත් රටවල් විශාල ප්‍රමාණයක ඖෂධ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා මැදිහත් වී ඇත. බංග්ලාදේශය, මැලේසියාව, දකුණු අප්‍රිකාව, ඇෆ්ගනිස්ථානය යනු ඉන් රටවල් කිහිපයකි. බංග්ලාදේශය එයින් විශාල ප්‍රතිඵල අත්පත් කරගෙන ඇති රටකි. අද වනවිට ඔවුහු තම ඖෂධ අවශ්‍යතාවයෙන් 80%ක් පමණ තම රටවලම නිෂ්පාදනය කරගැනීමට සමත්ව සිටිති. එසේම එම ඖෂධවල ගුණාත්මකභාවය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමටද ඔවුන් විසින් කටයුතු කර ඇත. නමුත් අප රටට අවශ්‍ය ඖෂධවලින් 10%ක් වත් නිෂ්පාදනය කිරීමට අප තවමත් අපොහොසත්ය. වාර්ෂිකව රු. බිලියන 70කට වැඩි ප්‍රමාණයක් ඖෂධ ආනයනය කිරීම වෙනුවෙන් වැය කිරීමට අපට සිදුවී ඇත. එසේ ආනයනය කරන වැඩි ප්‍රමාණයක් ඖෂධ ඉන්දියානු සමාගම්වල නිෂ්පාදිත ඒවාය. ගුණාත්මකභාවය අතින් ඉතාමත් පහළ මට්ටමක ඇති ඖෂධ විශාල ප්‍රමාණයක් අප වෙළඳපොළට පැමිණේ. එම ඖෂධවල ගුණාත්මකභාවය විටින් විට පරීක්ෂා කර තහවුරු කරගන්නා වූ නිශ්චිත ක්‍රමවේදයක් අපට නැත.

## සේනක බිබිලේ භූමිකාව

එදා 1971 දී මහාචාර්ය සේනක බිබිලේ විසින් පාර්ලිමේන්තු පනතක් මගින් රාජ්‍ය ඖෂධ සංස්ථාව ආරම්භ කරන ලදී. එහි ප්‍රථම සභාපතිවරයා වූයේ මහාචාර්ය සේනක බිබිලේය. ඒ වෙනුවෙන් ඔහු වැටුප් හෝ කිසිදු දීමනාවක් ලබාගත්තේ නැත. පේරාදෙණිය වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් කටයුතු කරන අතරතුර රාජ්‍ය ඖෂධ සංස්ථාව බිහි කිරීම වෙනුවෙන් ඔහු දැවැන්ත කාර්යභාරයක් ඉටු කළේය. එකල ඖෂධ සමාගම්වලින් ජනතාව රැකගැනීම සඳහා රාජ්‍ය ඖෂධ සංස්ථාව දැවැන්ත පවුරක් විය. දේශපාලන මැදිහත්වීම් නිසා රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව තම සේවාව නිසි පරිදි කිරීමට වර්තමානයේදී අපොහොසත් වී ඇතත් අදටද ඖෂධ මිල පාලනයෙහිලා සංස්ථාව මගින් ජනතාවට සැලකිය යුතු සේවාවක් සිදුවේ. 1971 සිට 1975 දක්වා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරමින් ඔහු ඖෂධ ආනයනය කිරීම, ඖෂධ අමුද්‍රව්‍ය ආනයනය කිරීම, ඖෂධ නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම සඳහා ආණ්ඩුවට මැදිහත්විය හැකිවන පරිදි ඖෂධ සංස්ථාව සංවර්ධනය කළේය. නමුත් 1975 සමගි පෙරමුණ ආණ්ඩුවේ විරසකය නිසා සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය විසින් සේනක බිබිලේ මහාචාර්යතුමාට ඖෂධ සංස්ථාවෙන් ඉල්ලා අස්වන ලෙස කරන ලද බලපෑම හමුවේ ඔහු එම තනතුරෙන් ඉල්ලා අස්විය. එවකට ඔහු සමසමාජ පක්ෂයේ මධ්‍යම කාරක සභිකයෙකු ලෙස කටයුතු කළේය.

1976 ශ්‍රී ලංකාවේ පැවති නොබැඳි ජාතීන්ගේ සමුළුවට තම ඖෂධ ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමට ඔහුට අවස්ථාව හිමිවිය. එහිදී එම ප්‍රතිපත්තිය පිළිබඳව අවබෝධ කරගත් බොහෝ රාජ්‍ය නායකයෝ තම තමන්ගේ රටවල්වලට පැමිණ ඖෂධ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සහයෝගය ලබාදෙන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියෝය. ඉන් ටික කලකට පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ අන්ක්ටෑඩ් (UNCTAD) සංවිධානය විසින් ඖෂධ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා කරන ලද ආරාධනයකට අනුව ඔහු ජිනීවා නුවර වසරක පමණ කාලයක් සේවය කළේය. ඔහුගේ කාර්යභාරය වූයේ විවිධ රටවලට ඖෂධ ප්‍රතිපත්ති සකස් කිරීමය. අවසාන වශයෙන් ඔහුට පැවරුණු රාජකාරිය වූයේ කැරිබියන් දූපත් ආශ්‍රිත රටවලට ඖෂධ ප්‍රතිපත්ති සකස් කිරීමය. ඒ අනුව ඔහු ජමෙයිකා, ගයනා, බාබඩෝස් ආදී දූපත් රාජ්‍යයන් ගණනාවක සංචාරයකින් පසුව ගයනා රටට පැමිණ එම රට සඳහා ඖෂධ ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කටයුතු කරමින් සිටියේය. එක් දිනක රාත්‍රී සාදයකදී සිදුවූ විෂවීමකින් ඇතිවූ හෘදයාබාධයකින් ඔහු මියගිය බව බොහෝ පිරිස් විසින් පිළිගනු ලබයි. ඔහුගේ මරණය ඉතා කුමන්ත්‍රණකාරීව සිදුකළ ඝාතනයක් බවට පැහැදිලි කරුණු ඉදිරිපත් වී තිබේ. ඔහු සමඟ කටයුතු කළ කිහිපදෙනෙක් කුමන්ත්‍රණකරුවන් ලෙස කටයුතු කළ බවටද සාක්ෂි ඇත. එදින රාත්‍රියේ ඔහුගේ අසනීප තත්ත්වය සම්බන්ධව ඔහුගේ බිරිඳ විසින් ඔහු සමඟ කටයුතු කළ කණ්ඩායමේ අයට දැනුම් දුන්නද ඔවුන් කිසිවකු ඔහු රෝහල්ගත කිරීමට ඉදිරිපත් වී නැත. පසුදින උදෑසන ඔහු රෝහලට රැගෙන යාමට වාහනයක් පවා සොයාගැනීමට නොහැකි වූ



අතර පසුව බිරිඳ විසින් ඉතා පැරණි ලොරි රථයක් උපයෝගී කරගනිමින් ඔහු රෝහල්ගත කර ඇතත් රෝහල් ගත කර සුළු මොහොතකින් ඔහු මියගොස් ඇත. ඔහුගේ මරණයෙන් අනතුරුව මරණ පරීක්ෂණයක්ද සිදුකර නැත. බිරිඳ සහ කණ්ඩායමේ තවත් එක් පුද්ගලයෙකුගේ මැදිහත්වීමෙන් ගයනාවේ මුහුදු වෙරළක දර සෑයක ඔහුගේ සිරුර ආදාහනය කරන ලදී. ඔහුගේ බිරිඳ වන ලීලා බිබිලේ විසින් භෂ්මාවශේෂ රැගෙන තනිව ශ්‍රී ලංකාවට පැමිණ ඇත. දැනට ජාවත්ත කනත්තේ ඔහුගේ භෂ්මාවශේෂ සහිත සොහොන් කොත දක්නට ඇත. රටට ලෝකයට මෙතරම් දැවැන්ත කාර්යභාරයක් ඉටුකළ විද්වතෙකුගේ මරණය සම්බන්ධව කිසිඳු අවධානයක් යොමු නොවන ලෙස කටයුතු කරමින් ආදාහනය කර දැමීමද එම කුමන්ත්‍රණයේම කොටසක් වන්නට ඇත.

> නව ඖෂධ පනත අනුව හඳුන්වා දී ඇති උපරිම සිල්ලර මිල ක්‍රමය මගින් ඖෂධ වර්ග කිහිපයක මිල යම් ප්‍රමාණයකට අඩු වී තිබුණද පොදුවේ මිල අඩු ඖෂධ විශාල ප්‍රමාණයක මිල ඉහළ ගොස් ඇත. උපරිම සිල්ලර මිල ක්‍රමවේදය මහාචාර්ය සේනක බිබිලේ ප්‍රතිපත්තිය මඟින් හඳුන්වා දුන් ආනයනික වියදම මත ඖෂධයේ මිල තීරණය කිරීමේ විද්‍යාත්මක ක්‍රමවේදයට පටහැණිය.

## ආණ්ඩුවේ බොරුව

සේනක බිබිලේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යැයි කියමින් වර්තමාන ආණ්ඩුව 2015 මාර්තු මාසයේදී නව ඖෂධ පනතක් සම්මත කරන ලදී. ඒ අනුව 1981 අංක 25 දරන ඖෂධ, උපකරණ හා සුවඳ විලවුන් පනත අහෝසි විය. මෙම නව පනත මගින් අවධානය යොමුකර තිබුණේ වෙළඳපොළ තුළ ඖෂධ නියාමනය කිරීමට අදාළ නීති රීති පිළිබඳවය. 1981 අංක 25 දරණ පැරණි පනතේද ඒ පිළිබඳව සැලකිය යුතු කරුණු ප්‍රමාණයක් අන්තර්ගතව පැවතුණි. නමුත් එම නව පනතින්ද ඉහත කරුණු සම්බන්ධව අවධානය යොමුකොට තිබූ අතර ඊට වෙළඳපොළේ ඖෂධ මිල නියාමනය කිරීම සඳහා නව වගන්ති කිහිපයක් එක්කොට ඇත.

දැනට අප රටේ ඖෂධ වර්ග 18,000කට වැඩි ප්‍රමාණයක් විවිධ වෙළඳ සන්නාම (Brands) යටතේ ලියාපදිංචි කර ඇත. මෙම ලියාපදිංචිය ආරම්භ කර ඇත්තේ 1981 ඉහත සඳහන් කළ පනත සම්මත වීමෙන් පසුවය. නමුත් මේ වනවිට එම ලියාපදිංචි කරන ලද ඖෂධ සන්නාම සියල්ලම වෙළඳපොළේ දක්නට නැත. එසේ වුවද දැනට අප රටේ වෙළඳපොළෙහි ඖෂධ සන්නාම 10,000කට අධික ප්‍රමාණයක් පවතින බවට අනුමාන කළ හැක. ඒ සඳහා නිශ්චිත තොරතුරු සොයාගැනීම දුෂ්කරය. එහෙත් අප රටට දැනට විවිධ වෙළඳ සන්නාම යටතේ අතිවිශාල ඖෂධ ප්‍රමාණයක් සංසරණය වුවද ඒවා අයත් වන්නේ ඖෂධ වර්ග (Genaric drugs) 500කට ආසන්න ප්‍රමාණයකටය. ඒ අනුව එක් ඖෂධයක් සඳහා විවිධ වෙළඳ සන්නාම විශාල ප්‍රමාණයක් ඇත. උදාහරණයක් ලෙස ඇමොක්සොලින් නැමැති ප්‍රතිජීවක ඖෂධය වෙළඳ සන්නාම 40කට වැඩි ප්‍රමාණයකින් අලෙවි වේ. සමහර ඖෂධවලින් වෙළඳ සන්නාම 50, 60 දක්වා ප්‍රමාණයක් වෙළඳපොළෙහි ඇත.

ඉහත ඖෂධවල මිල තීරණය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් නැත. පහුගිය කාලය පුරාම ඖෂධ මිල තීරණය කරනු ලැබුවේ ඖෂධ සමාගම් තමන්ගේ හිතුමනාපයටය. ඒ අනුව ඖෂධ සමාගම් අධික ලාභ ලබමින් හිතුමතේ තම මාෆියාව දිගින් දිගටම කරගෙන යයි. මහාචාර්ය සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තියට අනුව ඖෂධ මිල තීරණය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් සකස් කර ඇත. ඒ අනුව ඖෂධවල ආනයන වියදම පදනම් කරගනිමින් එම ක්‍රමවේදය සකස් කර ඇත. ඖෂධයක ආනයන වියදමෙන් (CIF value) 60%ක උපරිම ලාබයක් සමාගම්වලට ලබාගත හැකිවන පරිදි එම ක්‍රමවේදය සකස් කර ඇත.

නමුත් නව ඖෂධ පනත අනුව ආණ්ඩුව විසින් ඖෂධ මිල නියාමනය කිරීමේදී ඖෂධ වර්ග 68කට උපරිම සිල්ලර මිලක් හඳුන්වා දෙමින් ගැසට් නිවේදන දෙකක් නිකුත් කර ඇත.

නව ඖෂධ පනත අනුව හඳුන්වා දී ඇති උපරිම සිල්ලර මිල ක්‍රමය මගින් ඖෂධ වර්ග කිහිපයක මිල යම් ප්‍රමාණයකට අඩු වී තිබුණද පොදුවේ මිල අඩු ඖෂධ විශාල ප්‍රමාණයක මිල ඉහළ ගොස් ඇත. උපරිම සිල්ලර මිල ක්‍රමවේදය මහාචාර්ය සේනක බිබිලේ ප්‍රතිපත්තිය මඟින් හඳුන්වා දුන් ආනයනික වියදම මත ඖෂධයේ මිල තීරණය කිරීමේ විද්‍යාත්මක ක්‍රමවේදයට පටහැණිය. උපරිම සිල්ලර මිල ක්‍රමය මඟින් මිල අධික වෙළඳ සන්නාම සහිත ඖෂධ වර්ග අඩු ප්‍රමාණයක මිල අඩු වී ඇත. නමුත් පසුගිය වර්ෂ 3 ඇතුළත වෙළඳපොළේ ඉතා අඩු මිලට පැවති වෙළඳ සන්නාම විශාල ප්‍රමාණයක මිල උපරිම සිල්ලර මිලට ආසන්න ප්‍රමාණයක් දක්වා වැඩිකරනු ලැබ ඇත. ඉහත පනත මගින් ඊට කිසිදු බාධාවක් නැත. ඒ අනුව සමස්තයක් ලෙස ඖෂධ වර්ග විශාල ප්‍රමාණයක මිල ඉහළ ගොස් ඇත.

උපරිම සිල්ලර මිල ගණනය කිරීමේදී එකම ඖෂධයක වෙළඳපොළෙහි ඇති විවිධ වෙළඳ සන්නාමවල මිල ගණන් සසඳා බලා ඒවායේ වෙළඳපොළෙහි අලෙවි වන ප්‍රමාණය මත පදනම්ව සිදු කරනු ලබයි. නමුත් ඖෂධ සන්නාමවල වෙළඳපොළ මිල තීරණය කර ඇත්තේ, ඒවායේ ආනයනික වියදම මත පදනම්ව නොව ඖෂධ සමාගම්වල ලාභය ගැන සලකා බලාය. එම නිසා එම ක්‍රමවේදය අසාර්ථක මෙන්ම අවිද්‍යාත්මක ක්‍රමවේදයකි.

සේනක බිබිලේ ජාතික ඖෂධ ප්‍රතිපත්තියෙහි අඩංගු වන මූලික කරුණු ගණනාවකි. අප රටට ඖෂධ ආනයනය කිරීම, ඖෂධ අමුද්‍රව්‍ය ආනයනය කිරීම, ඖෂධ නිෂ්පාදනය කිරීම, ඖෂධ බෙදා හැරීම සහ ඖෂධ අලෙවි කිරීම රජයේ පූර්ණ මැදිහත්වීම යටතේ සිදුවිය යුතු බව එම ප්‍රතිපත්තියෙහි සඳහන් වේ. එම ප්‍රතිපත්තිය මගින් ඖෂධ සමාගම්වල අධික ලාභ ලැබීම නැවැත්වීමටත් ඒ මගින් රෝගීන් සූරාකෑම නැවැත්වීමටත් ක්‍රමවේද සකස් කර ඇත.

ඖෂධ වර්ග සුළු ප්‍රමාණයකට උපරිම සිල්ලර මිලක් හඳුන්වාදීමෙන් පසුව ආණ්ඩුව තමන් සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා යැයි කීම විහිළුවකි. රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සංවර්ධනය කර අප රටට අවශ්‍ය අත්‍යවශ්‍ය ඖෂධ ගුණාත්මකභාවය රැකගනිමින් නිෂ්පාදනය කර බෙදාහැරීමට කටයුතු කිරීමත් රජයේ රෝහල්වලට අවශ්‍ය ඖෂධ සහ අනෙකුත් උපකරණ අවශ්‍ය ප්‍රමාණයට අඛණ්ඩව සැපයීම මගින් අප රටේ ඖෂධ ගැටලුවට සැලකිය යුතු විසඳුමක් ලබාදිය හැකිය. එසේ නොමැතිව රටේ කීර්තිමත් නාමයක් වූ සේනක බිබිලේ නාමයට මුවාවී ප්‍රදර්ශනාත්මක වැඩපිළිවෙළක් මගින් ජනතාවගේ සෞඛ්‍යය පරදුවට තබා තමන්ගේ දේශපාලන සෞඛ්‍යය ආරක්ෂා කරගැනීමට ආණ්ඩුවට ඉඩ නොදිය යුතුය.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා 'වේදිකාව' වෙන්වෙයි.

2018 සැප්තැම්බර් 05

# ලංකාවේ දූෂණයේ හා නාස්තියේ මුදුන් මල්කඩ විධායක ජනාධිපති ධුරයයි

(තැපැල් දෙපාර්තමේන්තුවට අදාළ ගැසට් නිවේදනය පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා

අද දිනයේ පැවැත්වෙන මෙම විවාදයට අදාළ ගැසට් පත්‍රය මම දුටුවා. ශාස්තු වැඩි කිරීම මගින් තැපැල් දෙපාර්තමේන්තුව දියුණු කරන්න පුළුවන්ය කියන යෝජනාව තමයි එහි තිබෙන්නේ. පළමු කරුණ තමයි දැනටමත් තැපැල් දෙපාර්තමේන්තුව පාඩු ලබනවාය කියන එක. මේ ආයතනය ඉතාම දූෂිත ආයතනයක් බවට පත් වී තිබෙනවා; අකාර්යක්ෂම වී තිබෙනවා. එය සත්‍යයක්. එතකොට ප්‍රධාන වශයෙන්ම එයට වගකියන්න ඕනෑකම තිබෙන්නේ මේ තැපැල් දෙපාර්තමේන්තුව පාලනය කරන ලද එක්සත් ජාතික පක්ෂයේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරුන්, ඒ දෙපාර්තමේන්තුවේ හිටපු විවිධ ප්‍රධානීනුත්. ඒ වාගේම සේවක සේවිකාවන් යම් කිසි පිරිසකගේත් දායකත්වය මෙයට ලැබී තිබෙනවා.

නමුත් දැන් අපට තිබෙන තොරතුර තමයි, "තැපැල් දෙපාර්තමේන්තුව ස්වාධීන ආයතනයක් කරන්න යනවා, තැපැල් දෙපාර්තමේන්තුවේ ව්‍යුහය වෙනස් කරන්න විශේෂයෙන්ම ආණ්ඩුව පැත්තෙන් යම් සැලැස්මක් යටින් ක්‍රියාත්මක වනවා" කියන කාරණය. මීට කලිනුත් මේ යෝජනාව තිබුණා. ඒ නිසා අප ආණ්ඩුවෙන් දැනගන්න කැමැතියි, තැපෑල විකුණන්නද හදන්නේ, තැපෑල පෞද්ගලීකරණය කරන්නද හදන්නේ, එහෙම නැත්නම්, ආණ්ඩුව දැන් කෝකටත් තෛලය ලෙසට කියන පෞද්ගලික රාජ්‍ය හවුලක් බවට එම දෙපාර්තමේන්තුව පත් කරන්නද හදන්නේ කියන කාරණය. මෙන්න මේ අවිනිශ්චිතභාවය නිසාත් තැපැල් දෙපාර්තමේන්තුවේ අරාජිකත්වය වැඩි වී තිබෙනවා. මොකද, පසුගිය තැපැල් උද්ඝෝෂණය වෙලාවෙත් අපි දුටුවා, තැපෑල විකිණීමේ දිශාවට යන, එයට අවශ්‍ය කරන යම් වටාපිටාවක් සකස් වුණා කියන එක. ඒ එක්කම අපි තවත් කාරණයක් කියන්න කැමැතියි. රජයේ අකාර්යක්ෂමතාව නිසා සහ රජයේ දේශපාලනඥයන්ගේ දූෂිතභාවය නිසා විකුණනවා නම් විකුණන්න තිබෙන්නේ මේ පාර්ලිමේන්තුව වාගේ ඒවායි, කැබිනට් මණ්ඩලය වාගේ ඒවායි, ජනාධිපති ධුරය වාගේ ඒවායි.



ඒවා තමයි තමයි පෞද්ගලික අංශයට දෙන්න ඕනෑ. මොකද, ඒවා තමයි වැඩියෙන්ම දූෂිත ආයතන.

මේ රටේ දූෂණයේ මුදුන් මල්කඩ ජනාධිපති ධුරය බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගේ මැදිහත් වීමෙන් අප විසින් අද දිනයේදී ඉදිරිපත් කරනු ලැබුවා, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා වන විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. මොකද, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීමේ මූලික ආයතනය විධායක ජනාධිපති ධුරය පමණක් නොවෙයි. නමුත් ලංකාවේ

> පෞද්ගලීකරණය කරනවා නම් කරන්න තිබෙන්නේ මෙන්න මේවා. ජනාධිපති ධුරය, අගමැති ධුරය, පාර්ලිමේන්තුව, කැබිනට් මණ්ඩලය හා හොරකම් කරනවා නම් මහ බැංකුව. ඔබතුමන්ලා ඒවා පෞද්ගලීකරණය කරන්නේ නැහැ.

දූෂණයේ සහ නාස්තියේ මුදුන් මල්කඩ විධායක ජාධිපති ධුරයයි කියන එක පසුගිය අවුරුදු 20 තුළ තත්වය ගෙන බැලුවාම අපට පෙනෙනවා. ඒ සඳහා වැඩි විස්තරවලට යන්න ඕනෑ නැහැ. වර්තමාන ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා පගාව අරගෙන අතට හසු වෙලා රිමාන්ඩ් භාරයේ සිටිනවා; හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා පගාව අරගෙන රිමාන්ඩ් එකේ ඉන්නවා; හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා මුදල් අවභාවිත කරලා රිමාන්ඩ් එකේ ඉඳලා දැන් ඇප පිට ඉන්නවා; හිටපු ජනාධිපතිවරයාගේ ලේකම්වරයාත් -ලලිත් වීරතුංග මහත්මයා මුදල් අවභාවිතා කරල වැරැදිකරු වෙලා අභියාචනාධිකරණයෙන් ඇප අරගෙන ඉන්නවා. දූෂණය සිදු කරන්නේ යම්කිසි ජනාධිපතිවරයකු නම්, ඒ එන එන හැම ලේකම්වරයාම හොරෙකු වන්න හේතුවක් නැහැ.

දූෂිතයා ලලිත් වීරතුංග විතරක් නම්, තේරුම් ගන්න පුළුවන්, තනතුරේ ප්‍රශ්නයක් නොවෙයි, පුද්ගලයාගේ ප්‍රශ්නයක් තිබෙන්නේ කියලා. දැන් පෙනෙනවා ඇති, පත්වන හැම ලේකම්වරයාම හොරකම් කරලා අහුවෙලා තිබෙන බව. එහෙම නම්, දූෂණයේ මධ්‍යස්ථානය තනතුර බව පැහැදිලියි. 'ජනාධිපතිවරයා' කියන පුද්ගලයාට විරුද්ධව නඩු පවරන්න බැරි නිසා, එතුමාගේ ලේකම් තමයි අහු වෙන්නේ. ඒ නිසා දූෂණයට වැට බඳින්න මේ රටේ කවුරු හෝ කල්පනා කරනවා නම්, ඉස්සෙල්ලාම කරන්න තිබෙන දේ තමයි, දූෂණයේ මුදුන් මල්කඩ වෙච්ච මේ විධායක ජනාධිපති ධුරය විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අහෝසි කරලා, කැබිනට් මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට වග කියන අගමැති ක්‍රමයක් හදන එක.

ජනාධිපතිවරයාගේ නාස්තියත් එහෙමයි. එය මම වගකීමෙන් කියනවා. මේ මාතෘකාවට අදාළ නොවුණත් මොරගහකන්ද ජලාශය හදපු එකෙන් ජනතාවට යම් ප්‍රයෝජනයක් තිබෙන්න පුළුවන්. මම ඒ ගැන ප්‍රශ්න කරන්න යන්නේ නැහැ. නමුත් මෛත්‍රිපාල සිරිසේන මහත්මයා මොරගහකන්ද ජලාශය හතර සැරයක් විවෘත කර තිබෙනවා. හතර සැරයක්! මොරගහකන්ද ව්‍යාපෘතියට මුල්ගල තියන්න ජාතික උත්සවයක් පැවැත්තුවා. මොරගහකන්ද ව්‍යාපෘතියේ නිධන් වස්තු තැන්පත් කරන්න ජාතික උත්සවයක් පැවැත්තුවා, මොරගහකන්ද ජලාශයට වතුර පුරවන්න ජාතික උත්සවයක් පැවැත්තුවා, මොරගහකන්ද ජලාශයේ වතුර ඉවත් කරන්න ජාතික උත්සවයක් පැවැත්තුවා. ඊළඟට ලබන අවුරුද්දේ වතුර හිඳුණාම තව උත්සවයක් පවත්වයි. එකම ජලාශයක් විවෘත කරන්න හතර පාරක් ජාතික උත්සව පවත්වන්න කොපමණ මුදලක් නාස්ති කරනවා කියලා ඔබතුමා හිතනවාද?

2018 සැප්තැම්බර් 07

# ජනතාවට ප්‍රශස්ත සෞඛ්‍ය සේවයක් ලබා දීමට විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයින් රටට අවශ්‍යයි

(වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා

අපේ රටේ විශේෂඥ වෛද්‍යවරුන් තුන්දහසක් පමණ සිටින නමුත්, සමහර ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නැහැ. උදාහරණයක් හැටියට කොළඹ ජාතික රෝහලේ එක් අවස්ථාවක ඩයි වර්ගයක් විෂ වීමෙන් රෝගීන් කිහිප දෙනකු මරණයට පත් වුණාට පසුත් දැඩි සත්කාර ඒකක -ICU- සඳහාම ප්‍රවීණයන් වුණු විශේෂඥයන් පත් කරන්න සාකච්ඡාවක් පැමිණියා. කෙසේ නමුත්, අපි විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලේඛනයක් සකස් කරන්න කටයුතු කරන මේ වේලාවේ, ICU සඳහාම විශේෂඥ වෛද්‍යවරු ප්‍රමාණයක් වැඩි කර ගන්න ඒ ක්ෂේත්‍රයෙන්ම ඉල්ලීමක් පැමිණියොත් හොඳයි. මොකද, එහෙම වුණොත් තමයි ඒ රෝගීන්ට විශේෂ අවධානයක් යොමු කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

ඊළඟට, විශේෂඥ වෛද්‍යවරුන් අපේ රෝහල්වලට යොමු කළාට පස්සේ ඔවුන් මුහුණ දෙන බරපතළම ප්‍රශ්නයක් තමයි ඒ විශේෂඥ වෛද්‍ය සේවාව පවත්වාගෙන යාම සඳහා ඒ රෝහල්වල අවශ්‍ය කරන සාමාන්‍ය වෛද්‍යවරුන් නොමැති වීම. ඒ කියන්නේ, විශේෂඥ වෛද්‍යවරයකු අනුයුක්ත කළාට වැඩක් නැහැ. ඔහුට හෝ ඇයට සහය ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට සාමාන්‍ය වෛද්‍යවරුන් නැත්නම්, මේක මෑත කාලයේ මූලික රෝහල් බවට පත් කරපු බොහෝ රෝහල්වල තිබෙන ප්‍රශ්නයක්. ඇත්තටම සමහර රෝහල් මූලික රෝහල් බවට පත් කළේ, ඒ රෝහලේ තිබෙන සංවර්ධනයේ අවධිය සලකා බලා නොවෙයි; සමහර දේශපාලන අවශ්‍යතාවන් මතයි. කෙසේ නමුත්, රෝහලකට විශේෂඥ වෛද්‍යවරයෙකු අනුයුක්ත කිරීම හොඳයි. ඒ අනුයුක්ත කළාට පස්සේ ඒ වෛද්‍යවරයාගේ සේවය නිසි පරිදි ලබා ගන්න නම් ඔහුට සහය වන්න සාමාන්‍ය වෛද්‍යවරු කණ්ඩායමක් වුවමනා කරනවා. ඒ වාගේම රෝගවලට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය කරන මූලික පහසුකම් සැපයීමත් ප්‍රධාන කාරණයක්. රෝහලක ශල්‍ය වෛද්‍යවරයකුට අවශ්‍ය කරන තියටර් එක, මූලික පරීක්ෂණ සඳහා අවශ්‍ය



පහසුකම් ආදී දේවල් ප්‍රමාණවත් නොවෙනවා නම් විශේෂඥ වෛද්‍යවරයකු අනුයුක්ත කිරීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ.

ඊළඟට, මම තවත් කාරණයක් කෙරෙහි අවධානය යොමු කරන්න කැමැතියි. විශේෂයෙන් විදේශීය පුහුණුව අවසන් වෙලා ලංකාවට පැමිණෙන තරුණ විශේෂඥ වෛද්‍යවරුන්ට පත්වීම් ලැබෙන්නේ බොහෝ දුර බැහැර දිස්ත්‍රික්කවලටයි. එවිට ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි ඔවුන්ගේ දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමේ ප්‍රශ්නය. ඒ බොහෝ අය අපේ රටේ මධ්‍ය විද්‍යාල, මහා විද්‍යාලවලින් ආපු සාමාන්‍ය පවුල්වල අය. ඔවුන් කැමැතියි, තමන්ගේ දරුවා රජයේ පාසලකට ඇතුළත්

> සෞඛ්‍ය ක්ෂේත්‍රය පුළුල් වීමේදී අපට විවිධ ක්ෂේත්‍රවල උපාධිධාරීන්, පශ්චාත් උපාධිධාරීන් වුවමනා කරනවා. නමුත්, විවිධ ශ්‍රේණි ප්‍රශ්න පදනම් කර ගෙන ඒ අය බඳවා ගැනීමේ කටයුතුවලට අකුල් හෙළීම එතරම් සුදුසු වන්නේ නැහැ. මොකද, ඒකෙන් පීඩාවට පත් වන්නේ බදු ගෙවන අපේ රටේ සාමාන්‍ය ජනතාව වන නිසා. ඒ ජනතාවට ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබා දෙන්න නම්, විවිධ ක්ෂේත්‍රවල විශේෂඥභාවය සහිත, දැනුමත්භාවය සහිත විශාල කණ්ඩායමක් අපට වුවමනා කරනවා.

කර උගන්වන්න. නමුත්, ඔවුන් සේවය කරන ස්ථානය අනුව ඒ පහසුකම ලැබෙන්නේ නැහැ. මෙන්න මේ ප්‍රශ්නයෙන් සමහර අය බරපතළ පීඩාවකට පත් වෙලා ඉන්නවා. එවැනි තරුණ විශේෂඥ වෛද්‍යවරුන් මේ ප්‍රශ්නය නිසාම සමහර වෙලාවට රට අතහැර යනවා. ඒක අපට සැලකිය යුතු මට්ටමේ පාඩුවක්. මොකද, ඔවුන්ගේ අධ්‍යාපනයට, ඔවුන් විශේෂඥ වෛද්‍යවරුන් බවට පත් කිරීමට මේ රටේ ජනතාවගේ බදු මුදල් විශාල ප්‍රමාණයක් වැය කර තිබෙනවා.

නමුත්, දරුවා පාසලට ඇතුළත් කර ගැනීම කියන ප්‍රශ්නය මත එවැනි කෙනෙකුගේ සේවය අපට අහිමි වනවා නම්, ඒක අපේ රටේ ජනතාවට වන පාඩුවක්. එම නිසා විශේෂඥ වෛද්‍යවරු ප්‍රමාණය වැඩි කර ගන්නා අතරේම, දැන් සිටින අය මේ රටේ රඳවා ගන්න ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම සම්බන්ධයෙනුත් අවධානයය යොමු කරන්න කැමැතියි.

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී ඖෂධවේදීන්ගේ පැත්තෙන්, පෝෂණවේදීන්ගේ පැත්තෙන් විවිවධාකාරයේ සංශෝධන ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. මීට කලිනුත් මේ ප්‍රශ්නය ඉදිරිපත් වුණා. ඒ ප්‍රශ්නය එන්නේ මේ පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් නොවෙයි.

නමුත්, පෝෂණවේදීන්ගේ ප්‍රශ්නය පිළිබඳව මම නැවත වතාවක් අවධානය යොමු කරවනවා.

දකුණු සහ අග්නිදිග ආසියානු කලාපවල පමණක් නොවෙයි, සමහර සෞඛ්‍ය දර්ශක අතින් අපි ලෝකයෙන්ම ඉදිරියෙන් ඉන්නවා. ආර්ථික මට්ටමින් ඉහළ සිටින සමහර රටවලට සාපේක්ෂව අපි ඒ අයට ආසන්න මට්ටමක ඉදිරියෙන් ඉන්නවා. විශේෂයෙන් මාතෘ මරණ අනුපාතිකය, ළදරු මරණ අනුපාතිකය, වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ මරණ අනුපාතිකය වාගේ දේවල්වලින් අපි ඉදිරියෙන් ඉන්නවා. නමුත්, අපේ රටේ දැන් පෝෂණ ප්‍රශ්නයක් පැන නැගෙමින් තිබෙන බව ඔබතුමා දන්නවා. එය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයත් පිළිගන්නවා. ලෝක සෞඛ්‍ය සංවිධානයත් පිළිගන්නවා. ඒ අනුව අධිපෝෂණය සහ මන්ද පෝෂණය කියන දුෂ්පෝෂණයේ අවස්ථා දෙකම අපේ රටේ දැන් දක්නට ලැබෙනවා.

කවුළුව හැරතබමි

# විප්ලවයේ කලාකරුවා

චේ සමරු දිනය සෑම වසරකම ඔක්තෝම්බර් 08 දිනට යෙදී ඇත. ලොව පුරා පීඩිත ජනයා සෑම වසරකම ඒ වෙනුවෙන් සැමරුම් උළෙලවල් පවත්වති.

අර්නස්ටෝ චේ ගුවේරා විප්ලවවාදියෙකු ලෙස සන්නද්ධවීම අරඹන්නේ තරුණ කාලයේදීමය. එනම් 40-50 දශකවලදීය. 1959 වන විට ඔහු චේ නමින් ප්‍රකට විය. ඒ, කියුබානු විප්ලවය සිදුවූ වසරය. අද අපි ජීවත්වන අඳුරු කාලපරිච්ඡේදයේ වුවද ඒවා ඉතිහාසයෙන් මකා දැමිය නොහැකි වනු ඇත. ඇත්තටම චේ යනු විප්ලවවාදියකුට වඩා ජාත්‍යන්තර විප්ලවීය සංස්කෘතියකි. චේ ගැන මෙලෝ හසරක් නොදන්න අය පවා අද තම ත්‍රීවිල් රථ හා ටීෂර්ට්වල චේගේ රුවින් සරසාගෙන සිටින්නේ ඒ සංස්කෘතික සංකේතය නිසාය.

චේ නමැති මිනිසා නිර්මාණකරුවෙකු මිස අනුවර්තකයකු නොවීය. ඔහු හුදු බුද්ධිමය ව්‍යායාමක් සඳහා වන විවේචකයකු නොවීය. එහෙත් සමාජවාදය ලොව පුරා පතුරුවාලීමේ පුරෝගාමියකු විය.

චේ අතිභයංකාර, ප්‍රතික්ෂේප කළ යුතු පුද්ගලයකු ලෙස හතුරාගේ පහරදීමට ඉලක්ක විය. එයම ඔහු ලද ජයග්‍රහණයකි. ඉතිහාසයේ විකෘතියක් ලෙස හුවාදැක්වීමට සතුරා දැරූ සියලු ප්‍රයත්නයන් පරදා චේ අද ලෝකයේම පීඩිතයන්ගේ විස්මිත විප්ලවීය ස්ථම්භයක් ලෙස



ඉහළටම නැගී සිටී. ඔහු නැගෙනහිර යුරෝපයේ සමාජවාදී රටවල් ගැන කළ විවේචනය අද ප්‍රායෝගිකව ඔප්පු වී ඇත.

චේගේ අවමඟුල් උත්සවයේදී ෆිදෙල් කළ කථාවේදී ඔහු චේ හැඳින්වූයේ විප්ලවයේ කලාකරුවා ලෙසිනි. චේගේ අලංකාරමය නිර්මාණය ඔහුම වේ. එනම් නව මිනිසකු නිර්මාණය කිරීමය. ඒ සඳහා පළමුව ඔහු තමාවම නව මිනිසකු කරගත්තේය. නව සමාජයක් සඳහා සටන් වදින්නා නව මිනිසකු ලෙස ප්‍රතිනිර්මාණය විය යුතුමය. විප්ලවීය කලාකරුවා ලොවට දුන් අනගි පණිවුඩයද එයයි.

# නුඹ නාඩං - නුඹ නාඩං නුඹට මේව හොඳ පාඩං

සැප්තැම්බර් 6 එළිවෙන විට ලංකාවේ මිනිස්සු බොහොමයක් බලාසිටියේ මහින්ද අගමැති වෙනවා දකින්නය. සැප්තැම්බර් 5 ජනබල පා ගමනින් මහින්දද එකක් බලාපොරොත්තු විය. එනම් අනාගත ඔටුනු පළන් කුමරා ලෙස නාමල් බබාව අභිෂේක ගන්වන්නටය. එහෙත් පසුවදාම ඒ දුටු සියලු සිහින සුනාමියකට අසු වූවා සේ සේදී බොඳව ගියේය. මේ ආණ්ඩුව පෙරළා මිස නැවත ගෙදර නොයන බවටත්, අගනගරය වටලා කඳවුරු බඳින බවටත් පුරසාරම් දෙඩූ මහින්ද ප්‍රමුඛ ඔහුගේ රැළ වැසි කැළගේ මුඛවල් පූට්ටුවීමට ගතවූයේ පැය විසිහතරකි.

බලයෙන් චුතවී පසුවදාම මැදමුලන ජනේලයක එල්ලී බලයට තිබෙන මජරකම ප්‍රදර්ශනය කළ මහින්ද ප්‍රමුඛ පවුල සහ හවුල් නඩය තම ගමනක අවසානය ලේක්හවුස් වටරවුමින් සටහන් වේ යැයි සිහිනෙන්වත් නොසිතන්නට ඇත. බලයෙන් පහවී ගිය ලංකාවේ කිසිදු රාජ්‍ය නායකයකු බලය සහ වස්තුවට තිබෙන මජරකම මහින්ද තරම් පිළිකුල් ලෙස ප්‍රදර්ශනය කළ බවක් අපි නොදනිමු.

ජනබල මෙහෙයුම අවසානයේ දැන් මහින්දගේ පවුලේ ඇතුලේද කචල්ය. ආබාධිත විපක්ෂයේ නායකයන් අතරද කචල්ය. ජනබලයෙන් හෙළි වූ විළිය වසා ගැනීමට දුන් එක එක කතාය. එළිවෙනතුරු නිදිවරා සටන් වදිනවා කියූ නායක රැළ අවසානයේ විවේක සුවයෙන් සිටියේ තරුපහේ හෝටල්වලය. ඔවුන්ගේ ප්‍රවේණිදායන්ගෙන් කොටසක් සුරාවෙන් මත් වී මහපොළොව බදාගෙන හතරගාතෙන් සුබසිහින දුටහ. කොටසක් ආපයින්ම පැදුරටත් නොකියා ගම් රටවල් බලා ගොසින්ය. මහරජුගේ සිහින මාලිගය පුතුගේ හිස මතට කඩා වැටුණේ එසේය.




# මොළය මළකඩ කන සාහිත්‍යයක් වෙනුවට



සියලු කලාවන්හි නිර්මාතෘ මිනිසාය. නැතිනම් මිනිස් ශ්‍රමයයි. මිනිසා නිර්මාණය කළ කලාව සහ සාහිත්‍ය පෙරළා මිනිස් සමාජයේ උන්නතිය පිණිස සේවයට ගත් අවස්ථා ඉතිහාසයේ එමට ඇත. සෝවියට් සාහිත්‍ය මේ අතර ප්‍රමුඛය.

ජීවත්වීම සඳහා අනවරත අරගලයක නිරත වූ මිනිසා සිය පරම්පරාවෙන් පරම්පරාවට දැනුම විනෝදාස්වාදය සමාජ තත්වය සහ ජීවන වෘත්තීන් සම්ප්‍රේෂණය කිරීම උදෙසා කලාව සහ සාහිත්‍ය භාවිතයට ගෙන ඇත.

මේ සාහිත්‍ය මාසයයි. අද සාහිත්‍යය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝගය කුමක්ද? ධනවාදය තුළ අද සාහිත්‍යයද සෙසු භාණ්ඩ මෙන්ම පාරිභෝගික භාණ්ඩයක් වී ඇත. නැතිනම් වෙළඳ භාණ්ඩයක් වී ඇත. මෙම තත්වයෙන් සාහිත්‍ය මුදාගෙන එය සමාජ සංවර්ධනය පිණිස යොදාගත හැකි උපකරණයක් බවට පත්කර ගැනීම අද සැබෑ මානවවාදී සාහිත්‍යකරුවා, කලාකරුවා මුහුණ දී ඇති ප්‍රධාන අභියෝගයයි. ඒ සඳහා සොවියට් සාහිත්‍යයෙන් ගත හැකි ආදර්ශ බොහෝය. මැක්සිම් ගෝර්කිලා, චිංගිස් අයිත්මාතොව්ලා, මිහයිල් ෂොලෝහොව්ලා පමණක් නොව ටෝල්ස්ටෝයිලා පවා ඒ සඳහා කළ මෙහෙය අපමණය.

මිනිසුන් හිතන්නේ සංස්කෘතියද පදනම් කරගෙනය. එනම් මිනිසා විසින් ගොඩනගන ලද, ඥානනය කරන ලද, උගන්නා ලද වාස්තවික පරිසරය අනුවය. එහිදී සාහිත්‍ය මානව සමාජයේ උන්නතිය හා උසස් මිනිසෙකු බව මිනිසා ප්‍රතිනිර්මාණය කිරීම සඳහා සාහිත්‍යයෙන් කළ හැකි මෙහෙය අති විශාලය. සාහිත්‍ය හා කලාව ජනතාවගේ හිසට උඩින් පාත් කරන මායාමය සිහිනයක් විය යුතු නැත. ජීවිතය හා සමාජය සමග එය සංයෝජනය කළ යුතුය. සෝවියට් සාහිත්‍යකරුවා එය කළේය. විප්ලවීය කලාව යනු එයයි. අද අවශ්‍යව ඇත්තේ මිනිස් මොළය තුළ මළ බඳින සාහිත්‍යයක් නොවේ. මළ කඩා දමා ප්‍රඥාව විකසිත කරන සාහිත්‍යයකි. එහෙව් සාහිත්‍ය කෘති ලොව එමට ඇත. එහෙව් භාවිතයකට යා හැක්කේද විප්ලවීය අරුතකින් කලාව පුරුදු පුහුණු කළ සාහිත්‍ය හා කලාකරුවන්ටම පමණි.

# පෝ ලිටිකල් පංතිය

පොලිටික්ක දවසක් සුපුරුදු පරිදි පංතියට පරක්කු වෙලා ආවත් කලබලෙන් ආවෙ කවුරුහරි පස්සෙන් එළවගෙන එනව වගේ. මේ වැඩේ කොයි තරම් සීරියස් වුණාද කියනවනම් ඉස්සරහ පේළිවල කීපදෙනෙක් නැගිටල ගිහින් දොරෙනුත් එබිල බැලුව.

“කෝ නෑනෙ සර් කවුරුවත්” ඉස්සර වෙලාම මුට්ටිය දැම්මෙ මංජුව දමල ගහපු ඩස්ටර් එක ඇහිඳින්න ඉස්සරහට දුවපු කනිය.

“ඒක තමයි සර්. කවුරුවත් නෑ.” වසන්තියත් කොල්ලොත් එක්ක හරි හරියට පසුමඟ බැලුව.

“මොනවද ඔය ළමයි බැලුවෙ... ඇයි කවුරුහරි ආවද?” පොලිටික්කටත් හැකේ.

“නෑ සර්... සර් පස්සෙන් කවුරුවත්ම ආවෙ නෑ” කනිය සහතික කරල කියනව.

“කවුරුවත් එනව කියල මම කිවුවෙ නෑනෙ...” පොලිටික්ක යන්තම් හුස්මක් හෙළුව. “ඔය ළමයි බලපු හින්ද තමයි මමත් බය වුණේ”

“ඇති යන්තං... සර් ආපු කලබලේට අපි හිතුවෙ කවුරුහරි ෆලෝ කළාවත්ද කියල” අනුරුද්දිය බාල ටෙලියක වගේ පපුවට ඇඟිලි ටික තියාගත්ත.

“එහෙම කොහෙද මාව ෆලෝ කරන්නෙ...!” පොලිටික්ක හීනියට සිංහ සෙයියාවක් අරන් අත් මාරු කරල බාහු දෙක අතගෑව.

“ඇත්ත තමයි... ගෝලයො වෙලා අපිවත් සර්ව ‘ෆලෝ’ කරන්නෙ නැති එකේ කවුද එහෙම කරන්නෙ?” සමන සද්දෙ වහල කිවුවට වටේ රොත්තකට හිනාව කපා ගන්න බැරිවුණා.

“මොකද්ද සමන් කිවුවෙ?” සමනගෙන් මොකක් හරි අලුකුත්තේරු කතාවක් විසිවුණා කියල පොලිටික්කට තේරුණා.

“නෑ සර් තිස්ස එලෝනකොට මුවා දිවුව වගේනෙ සර් ආවෙ.” සමන වැඩේ තනුක කළා.

“නෑ සමන් මං ආවෙ මුවා එලෝනකොට තිස්ස දිවුව වගේ” පොලිටික්ක හම් මල්ල දුන්නට අරන් ජහුටා රජ පාට් එකක් දැම්ම. “ඇත්තටම ළමයිනේ මම මඩ ගොඩක වැටිල කලිසමේ පිටිපස්සෙ මඩ ගෑවුණා. ඒක කවුරුත් දකී කියල තමයි කොරිඩෝවෙන් ඉක්මණට ආවෙ.” කට්ටිය හිනා වෙලා ඉවර වෙනවත් එක්ක පොලිටික්ක කියල දැම්ම.

“ඕක මොකද්ද සර්, ඕව වැටිල ගෑවිච්චි ඒවනේ... එහෙමද මහින්ද මහත්තය බිම මඩ නැතුවත් මඩ කන්නේ.” මංජුව මඩටම කැපුව.

“මොන බොරුද ළමයො, හතුරො ගහන ඒවනෙ.” පොලිටික්ක නියපොත්තෙන්ම කඩන්න බැලුව.

“නෑ මං කියන්නෙ සර්... එහෙන් කොල්ලො කියනව මහින්ද මහත්තය ‘රැය පහන් වන තුරු’ කියන එකේ තේරුම දන්නෙ නෑ කියල. වෙලාවකට ඩලස් ළඟ ඉන්න බව අමතක වෙලා ‘කිරි බීලා ලෙඩ වෙලා එයාට අමාරුයි’ කියනව. මාධ්‍ය සාකච්ඡාවෙ රුපියල ගොඩගන්නෙ කොහොමද අහනකොට හිටපු මුදල් ඇමතිවරය ‘බලේ දෙන්න ඊට පස්සෙ කියන්නම්’ කියනව. අනේ මන්ද... මේවා අහන අපිටත් පිස්සු වගේ” මංජුව ඔළුව කැරකෙව්ව.

“ළමයිනේ වයස බලල කතා කරන්න. ඔය වයසට කොච්චර දේවල් අමතක වෙන්න පුළුවන්ද? දැන් අපිටත් මේ තිබ්බ දේ මේ මතක නෑ. සුවල්ප වයසක්ද? මේ නොවැම්බරේට හැත්තැම තුනක්නෙ.” පොලිටික්ක බැලුවෙ අමතක වෙන එකට හේතු කියල කඩේ වහන්න.

“ඒකම තමයි අවුල සර්... කීත් නොයාර් කවුද කියල මතක නෑ. ලසන්ත ඝාතනය කළේ කවුද කියල මතක නෑ. රතුපස්වල වෙඩි තිබ්බද කියල මතක නෑ. රොෂේන් චානුකලට, ඇන්ටනිලට වෙඩි තිබ්බ කියල මතක නෑ. වටේ කට්ටිය තාමත් ජනාධිපතිතුමා කියන හින්ද මට හිතෙන්නෙ පැරදුණා කියලත් නිච්චියටම මතක නෑ. ඇත්තම ගත්තොත් ඔය තරම් වයසකදි ඔච්චර දේවල් අමතක වෙනවනම් ඔය දේශපාලනේ කරන එක හරිම අවදානම්. මොකද රට එක පාරක් චීනෙට විකුණල... පස්සෙ අමතක වෙලා ඉන්දියාවෙ ගිය වෙලාවක එහෙට විකුණුවොත් ලංකාවෙ අයිතිකාරයො අතරෙ ලෝක යුද්ධයක් ඇතිවෙන්න ඉඩ තියෙනව.” සමන ඇඟට නොදැනි කියල දාද්දි පොලිටික්ක නෑහුණා වගේ කැන්ටිම පැත්තට ගියේ කලිසමේ පිටිපස්සෙ මඩ බවත් අමතක වෙලා...

## ආණ්ඩුව පෙරළා...

03 පිටුවෙන්



ගාස්තු, දුම්රිය ගාස්තු දැනටමත් වැඩිවෙලා. තෙල් මිල වැඩිවෙන කොට සමස්ත ජීවන වියදම වැඩිවෙනවා. ජනතාව දැන් ජීවත්වෙන්න බැරි අමාරුවක වැටිල ඉන්නේ. දැන් ඒක උඩට කෝටි ප්‍රකෝටි ගණනක ණය කන්දක් කඩා වැටිලා. දැන් මේ රුපියල කඩන් වැටෙනකොට ඒ ණය කන්ද තවත් ඉහළට නගිනවා. ගෙවීමට ඇති ණය ප්‍රමාණය, පොලී ප්‍රමාණය දෙගුණ තෙගුණ වෙනවා.

බදු පිට බදු ගහලා, බඩු මිල වැඩිකරලා මේ ජනතාව තලන පෙළන පීඩාවට පත්කරන මේ පාලනය දැන් ජනතාවට අප්‍රසන්න වෙලා තියෙන්නේ. ඇත්තටම ජනතාව කබලෙන් ලිපට වැටිලා තියෙන්නේ. මේ ආණ්ඩුව පම්පෝරි ගහපු ආයෝජකයො ආවෙත් නැහැ. රටේ ආර්ථිකය පණගැහුවෙත් නැහැ. රුපියල කඩන් වැටිලා අපේ ආනයන වියදම වැඩිවෙලා තියෙනවා. දැන් ඩොලර් මිලියන 20,000යි ආනයන වියදම. අපේ අපනයන ආදායම ඩොලර් මිලියන 10,000යි. ඒ කියන්නේ අපි හම්බකරලා උපයනවා වගේ දෙගුණයක් පිටරටින් බඩු ගේන්න මුදල් වියදම් කරනවා. ලොකු ඇණු ගෙඩිය, පරිප්පු ටික, සීනි ටික, මිරිස් කරල, තෙල් ටික, කිරිපිටි ටික, සෙල්ලම් බඩු, වාහන ටික, අපි සියල්ල පිටරටින් ගේන්නෙ. පැන්සල, පෑන, මකනකෑල්ල, ඒ සියල්ලත් පිටරටින් ගේන්නෙ. මේ රුපියල කඩන් වැටෙන කොට මේ වියදම තවත් වැඩිවෙනවා. ඉතින් මේවාට මේ පාලකයින්ට උත්තරයක් නැහැ. රනිල් මහින්දගෙන් උත්තර අහනවා. මහින්ද රනිල්ගෙන් උත්තර අහනවා. දෙන්නටම උත්තර නැහැ. ඒකියන්නෙ යූ.එන්.පී. එකටත්, ශ්‍රීලංකා එකටත් උත්තර නැහැ.

රටේ නිෂ්පාදනය වැඩිකර ජනතාවගේ ආදායම ඉහළ නංන්වනවායින් මෙහා මේකට උත්තර හොයන්න බැහැ. ඒනිසා අපි රටට ගැලපෙන ආනයන අපනයන ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න ඕනැ. අපේ විනිමය පාලන නීති රීති පසුගිය කාලේ වක්කඩ අරින්නා වගේ සංශෝධනය කරලා දැම්මා. ඒවායේ ප්‍රතිඵල තමා දැන් අපි මේ දකින්නේ. ඒ නිසා ජනතාව තව තවත් අමාරුවේ වැටීම තමා මේ රුපියල කඩා වැටීමත් එක්ක සිදුවී තිබෙන්නේ. ඇත්තටම රුපියල බාල්දුවෙන තත්වෙට ආණ්ඩුවත් බාල්දුවෙලා තිබෙන්නේ.

***නියමුවා:-* විපක්ෂයේ රාජපක්ෂ පාර්ශ්වය උද්ඝෝෂණ කැඳවමින් ආණ්ඩු පෙරළියක් ඉල්ලා සිටියා. නමුත් අවසානයේ ඉතිරි වූයේ කිරි පැකට් පැමිණිල්ලක් පමණයි. මෙම තත්වය තුළ ජනතාවගේ සැබෑ ආණ්ඩු විරෝධය ඒකරාශි කිරීම සඳහා වන ජනතා විමුක්ති පෙරමුණේ සූදානම කවරේද?**

***විජිත හේරත් සහෝදරයා:-*** වැඩිවෙන ජීවන බර, බදු බරට එරෙහිව, මේ ආණ්ඩුවට එරෙහිව රටේ ජනතාවගේ සැබෑ විරෝධයක් තිබෙනවා. හැබැයි රාජපක්ෂ කණ්ඩායම කළේ ඒ සැබෑ ජනතා විරෝධය විහිළුවක් බවට පත්කරපු එකයි; නාඩගමක් බවට පත්කරපු එකයි. පසුගිය දවස්වල ඒ කරපු දෙයින් ආණ්ඩුවට එරෙහි විරෝධය විහිළුවක් හැල්ලුවක් බවට පත් කළා. සැබෑ ජනතා විරෝධය හැල්ලුවට ලක්කළා. නමුත් මේ කැකෑරෙන ප්‍රශ්න නිසා විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියෝ, ඉඩම් ප්‍රශ්න, ආර්ථික ප්‍රශ්නවලින් පෙලෙන ජනතාව මේ ආණ්ඩුවට එරෙහිව සැබෑ විරෝධයක ඉන්නවා. ඒනිසා ඒ සියලු ජනතාව දැනුවත් කරන්න අපි දැන් ආරම්භ කරලා තියෙනවා. ගමින් ගමට, නගරෙන් නගරෙට ඔවුන් දැනුවත් කරන්න ජනහමු දසදහස අපි දැන් ක්‍රියාත්මක කරමින් යනවා. ඒ වගේම ඒ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි සටන් වදිනවා. ගොවි ජනතාව, වෘත්තීය සමිති, කම්කරු ජනතාවට ඔවුන්ගේ වැඩිවෙන ජීවන වියදමට සාපේක්ෂව වැඩි වැටුපක් ඉල්ලා අපේ වෘත්තීය සමිති දැනටමත් සටන් ආරම්භ කර තියෙන්නේ. මේ ආණ්ඩුව ගෙනියන ජනතාව පෙළන ප්‍රතිපත්තියට එරෙහිව සැබෑ ජනතා විරෝධයක් අපි දක්වනවා.

මේ මාසේ 23දා කොළඹදී අපි දැවැන්ත ජනතා විරෝධයක් පෙන්වනවා. ඒ සඳහා දැනටමත් ගම් මට්ටමෙන්, දිස්ත්‍රික් මට්ටමෙන් ජනතාව දැනුවත් කරමින් සංවිධානය කරමින් ජනතාව පෙළන ආණ්ඩුවට එරෙහි විරෝධය මේ 23දා කොළඹදී බලමුළු ගන්වනවා. එතනින් නතරවෙන්නේ නැහැ. පුළුල් ජනතා ව්‍යාපාරයක් ඔස්සේ මේ ජනතා ද්‍රෝහී ආණ්ඩුව වෙනස්කර විකල්ප වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම දක්වා අපි ඒ සටන අඛණ්ඩව දිගටම අරගෙන යනවා.

## රුපියල කඩාවැටීම...

07 පිටුවෙන්



නිසාත් 2012 වසරේදී වාහන ගෙන්වීම සඳහා වියදම් කළ මුදල ඩොලර් මිලියන 566කි. එය 2017 වසරට වඩා දෙගුණයක වියදමකි. මේ රටට ලැබෙන විදේශ ආදායම නැවත පිටතට ගලා යන ක්‍රම සඳහා උදාහරණ කිහිපයක් පමණි.

ආණ්ඩුව තර්ක කරන පරිදි රුපියල බාල්දු වීමේ ප්‍රතිඵල ලෙස රට තුළට ගලා එන ආදායම ඉහළ යාමට නම්, ආනයන වියදම වැඩිවීමේ වේගයට වැඩි වේගයකින් අපනයන ආදායම ඉහළ යා යුතුය. නමුත් ප්‍රායෝගික යථාර්ථයේදී සිදුවන්නේ එහි ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵලයයි. විදේශගත ලාංකිකයින් රැකියා කර උපයන ඩොලර් ලංකාවට එවන විට වාසියක් රුපියල අවප්‍රමාණයෙන් ලැබුණද, මෙහිදී කෙටි කාලීනව ඉදිරියේදී තවත් වාසි අපේක්ෂාවෙන් ඩොලර් එවීම සීමා කරනු ලබයි. එවිට ආණ්ඩුව අපේක්ෂා කරන ප්‍රතිඵල නොලැබේ. අනෙක් අතට සංචාරකයින් දැන් ජාත්‍යන්තර වශයෙන් ගෙවීම සිදුකර (අන්තර්ජාලයෙන්) ලංකාවට පැමිණෙන නිසාද සංචාරක කර්මාන්තයෙන් රුපියල බාල්දුවීමේ වාසි අත්පත් කරගත නොහැක. ඒ, සංචාරකයින්ගේ බොහෝ ගෙවීම් ඩොලර්වලින්ම ඔවුන්ගේ මව් සමාගමවලටම ප්‍රතිලාභ ලැබෙන නිසාය.

### අර්බුදයට පිළිතුරු කොතැනද?

මෙවැනි දිනපතා රුපියල බාල්දු වන අර්බුද මොහොතකදී ආණ්ඩුවට ඇති කෙටිකාලීන විසඳුමක් වන්නේ ආණ්ඩුවේ භාණ්ඩාගාරය සතු ඩොලර් සංචිත වෙළඳපොළට මුදාහැර වෙළඳපොළ ඉල්ලුමට ගැලපෙන ඩොලර් සැපයුමක් කෘත්‍රිමව ඇති කිරීමයි. නමුත් එසේ කිරීමට නම්, ඒ සඳහා අවශ්‍ය තරම් ඩොලර් භාණ්ඩාගාරයේ පැවතිය යුතුය.

2018 වසරේ ආරම්භයේදී රජය සතුව ඩොලර් බිලියන 8.8ක සමස්ත නිල විදේශ සංචිත පැවැති අතර, 2018 අගෝස්තු 31 වන විට එම ප්‍රමාණය ඩොලර් මිලියන 8590.87ක් (බිලියන 8.5ක්) විය. එයින් මිලියන 768.69ක් ඉක්මනින් විකිණිය නොහැකි රන් සංචිතයයි. සරලව කිවහොත් මහා භාණ්ඩාගාරය සතු මුළු සංචිත තොගයම වෙළඳපොළට මේ මොහොතේ මුදා හැරියද එම ප්‍රමාණය ඩොලර් මිලියන 7900ක (වසරක අපනයන ආදායමට අඩුය.) ප්‍රමාණයකි. එම සංචිතවලින් 2018 වසරේ අවසාන වනවිට ණය වාරික හා පොලී ගෙවීමට තවත් ඩොලර් බිලියන 6.4ක් අවශ්‍යය. ණය වාරික ගෙවීමට ආණ්ඩුව සංචිත යොදා ගතහොත් ආණ්ඩුවට ඉතිරි වන්නේ, ඩොලර් මිලියන 800ක තරම් සොච්චම් මුදලකි. ආණ්ඩුව එක්කෝ ණය වාරික ගෙවීම අතහැර රුපියල බේරා ගැනීමට මැදිහත් විය යුතුය. එයද කල හැකි නොවේ. පසුගිය සැප්තැම්බර් 21 දිනයේදීද භාණ්ඩාගාරය ඩොලර් මිලියන 50ක් මුදාහැර ඩොලරයට හුවමාරු වන රුපියල 170 අගයේ තියා ගැනීමට මැදිහත් විය. රජයේ ඇමතිවරුන් ඩොලර් සංචිතය මුදාහරින්නේ නැතිව උත්තර සොයනවා යැයි කියන විටත් නිලධාරීන්ට සිදුවී ඇත්තේ "අතීසාරයට අමුඩ ගසන" පිළිතුරු සෙවීමටය.

රාජපක්ෂ පාලනය තුළදී 2012 වසරේදී මෙවැනිම රුපියල කඩා වැටීමේ තත්වයක් පාලනය කර ගැනීමට ඩොලර් බිලියන 4.2ක් භාණ්ඩාගාර සංචිත වෙළඳ පොළට මුදාහැරීමට භාණ්ඩාගාරයට සිදුවිය. නමුත් රුපියලේ කඩා වැටීම 13%කින් සිදුවිය. 2015 අගෝස්තුවේදී (මහා මැතිවරණයට පෙර) රනිල් වික්‍රමසිංහ පාලනයටද ඩොලර් බිලියන 1.2ක් වෙළඳපොළට මුදාහැරීමෙන්ද පාලනය කළ හැකි වූයේ 9%ක මට්ටමක කඩා වැටීමක් දක්වා පමණි. ඒ අනුව පැහැදිලි වන්නේ කෙටි කාලීනව භාණ්ඩාගාරය සතු ඩොලර් සංචිත මුදාහැරීමෙන් වුවද රුපියල කඩා වැටීමට ස්ථිර විසඳුමක් සෙවිය නොහැකි බවය.

ඩොලරයට සාපේක්ෂව රුපියල බාල්දුවීමත් සමග ඇතිවන තවත් දරුණු ප්‍රතිවිපාකයක් වන්නේ, ගෙවීමට ඇති ණයවල රුපියල් වටිනාකම ඉහළ යාමයි. ණය ගන්නා අවස්ථාවේදී ඩොලරයක් සඳහා ගෙවිය යුතු වූයේ රු. 100ක් නම්, ණය ගෙවන විට එම ඩොලරයටම අද රු.170ක් ගෙවීමට සිදුව ඇත. එයද රටට දරාගත නොහැකි මහා බරකි.

රුපියල ශක්තිමත් කිරීමට ඇති ස්ථිරසාර විසඳුම වන්නේ, අන් කිසිවක් නොව රටේ විදේශ වත්කම් ඉපැයීමේ මාර්ග දියුණු කිරීම පමණි. එය සිදු කල හැක්කේ, වත්කම් ඉපැයීමේ මූලාශ්‍ර, සම්පත් කුණු කොල්ලයට විකිණීමෙන් නොව එම සම්පත් ආර්ථිකයේ ජාතික පැවැත්මට යොදවා ගැනීමෙනි. නමුත්, එවැනි 'වික්‍රමයක්' මෙවැනි සැලසුමක් නැති, වැඩපිළිවෙළක් නැති 'එදාවේල ආණ්ඩුවලින්' අපේක්ෂා කිරීම තේරුමක් නැත. ඒ නිසාම ඇමරිකාව තමන්ගේ ඩොලරය ශක්තිමත් කරන නිසා අපි වැටෙනවා යන කෙඳිරිල්ල පැත්තක තබා රට සැලසුමකට මෙහෙයවන ජාතික වැඩපිළිවෙළක් රටේ පාලනයට ගෙන ඒමේ අවශ්‍යතාවය කඩිනම් කළ යුතු බව මෙම රුපියල කඩා වැටීම මගින්ද දෙන පණිවුඩයයි.

## සෝවියට් දේශය..

9 පිටුවෙන්

වැදීමට තීරණය කළෝය. මෙය අනුවණ තීරණයක් සේ පෙනුණි. එකල මුළු ලෝකයේම යවට මෝල් තිබුණේ 12ක් පමණි. ඒ සියල්ල ගොඩනගන ලද්දේ පළපුරුදු සැලසුම්කරුවන් සහ වුවමනා කරන නිෂ්පාදන මෙවලම් ඇතිව සිටි ඉහත කී ඩෙමැග් සමාගම විසිනි.

1930-1931 අවුරුදුවල යවට මෝල් යන වචනය හැම පුවත්පතකම හැම පිටුවකම සඳහන් විය. ඩෙමැග් සමාගම හා ඉෂෝර්ස්ක් කම්හල අතර වූ තරගය ගැන මුළු රටම දැඩි විමසිල්ලෙන් පසුවිය. ඉෂෝර්ස්ක් කම්කරුවෝ රජයේ ඇනවුම 1931 මැයි 01 දා වන විට නිම කරන බවට පොරොන්දු වූහ.

**අවසාන දිනට පෙර දින තුනෙහි හා රාත්‍රී තුනෙහි වැඩපොළේ එක් කම්කරුවකුදු කම්හලෙන් පිටට ගියේ නැත. යන්ත්‍ර හා උපකරණ ක්‍රියා කරවන්නන්, කොටස් එකතු කර පූට්ටු කරන්නන්, ඉංජිනේරුවරුන් හා සැලසුම්කරුවන් සියලු දෙනාම ඔවුන්ගේ කටයුතුවල නිරතව සිටියහ. 1931 අප්‍රේල් 30 දා ඔවුහු ප්‍රථම යවට මෝල සාදා අවසන් කළ බව කියැවෙන විදුලි පුවත ආණ්ඩුවට යැවූහ.**

ඩෙමැග් සමාගමද සිය යවට මෝල තනා නිම කළේය. එහෙත් ඒ සඳහා ඔවුන්ට මාස 12ක් ගත විය. ඉෂෝර්ස්ක් කම්කරුවන්ට ඒ සඳහා ගත වූයේ මාස 09කි.

### මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තය ගොඩනැගීම

පළමු පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර සෝවියට් සංගමයට මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයක් තිබුණේ නැත. ඒ.එම්.ඕ. මොස්කව් ඔටෝ මොබයිල් කොම්පැනිය යනුවෙන් හැඳින්වූ පෞද්ගලික ව්‍යවසායකයන් විසින් සංවිධානය කෙරුණු කුඩා කම්හලක් විය. අතිවිශාල රටක් වූ සෝවියට් සංගමයේ ඉතාමත් දුරබැහැර ප්‍රදේශවල පවා භාණ්ඩ ප්‍රවාහනය කරවීම සඳහා මෝටර් රථ අති විශාල ප්‍රමාණයක් අවශ්‍යව තිබුණි.

1928 දී ඒ.එම්.ඕ. කම්හල නවීකරණය කිරීමට රජය තීරණය කළ අතර ඉන් වසර තුනකට පසු වසරකට ලොරි 25,000ක් බැගින් නිපදවීම ආරම්භ විය. එකල ඇමෙරිකා එක්සත් ජනපදයේ ලොරි නිපදවූ විශාලතම කම්හල වසරකට නිපදවූ ලොරි සංඛ්‍යාව 18,000ක් විය.

### දුම්රිය සේවාව නවීකරණය කිරීම

දුම්රිය සේවාව නවීකරණයට භාජනය කෙරිණි. මින් අදහස් වූයේ සියලුම ගොඩනැගිලි හා පහසුකම්ද සංඥා හා ආරක්ෂක ක්‍රමද නැවත ගොඩනැගූ බවයි. දුම්රිය යන්ත්‍ර හා උපකරණ නිපදවීම සඳහා අලුත් කම්හල් ඉදිකෙරුණි. 1932දී ඩොන්බාස්හි ලුගාන්ස්ක් වාෂ්ප දුම්රිය එන්ජින් නිපදවීමේ කම්හල තනා නිම කෙරුණි.

මෙ කම්හල ලෝක ප්‍රකට මෆී (Maffei) හැනෝමැග් (Hanomag) බෝර්සිග් (Borsig) සහ හොහෙන් සොලර්න් (Hohen Sollern) යන සමාගම්වලට වඩා විශාල වූ අතර එකල යුරෝපයේ විශාලතම දුම්රිය සමාගම වශයෙන් පැවති ජර්මනියේ හෙන්ස්චෙල් (Henschel) සමාගමටත් වඩා විශාල විය. වසරකට වාෂ්ප දුම්රිය එන්ජින් 1000ක් නිපදවීමට අපේක්ෂා කළ ලුගාන්ස්ක් කර්මාන්ත ශාලාවට සමාන කළ හැකි වූයේ ඇමෙරිකාවේ බෝල්ඩ්වින් (Bold win) සමාගමත් ඇමෙරිකාවේ ලොකොමොටිව් සමාගමත් පමණි.

1932 දී සෝවියට් සංගමය සිය ප්‍රථම විදුලි දුම්රිය එන්ජිම නිපදවූ අතර ඉන් ටික කලකට පසු එම එන්ජින් අනුක්‍රම යන්ත්‍ර ක්‍රමයට නිපදවීම ආරම්භ කරන ලදී.

### ගොවිපළ උපකරණ නිෂ්පාදනය ආරම්භ කිරීම

පළමු පස් අවුරුදු සැලැස්ම ආරම්භ වූ 1928 දී මුළු රටටම තිබුණේ තිරිඟු කැපීමේ කොම්බයින් යන්ත්‍ර 2ක් පමණි. ඒවාද විදේශීයන්හි නිපදවන ලද ඒවාය.

පළමු පස් අවුරුදු සැලැස්ම අවසානයේදී සෝවියට් දේශයේ නිපදවන ලද ට්‍රැක්ටර් 150,000ක් ගොවිතැන් කටයුතුවල යොදවා තිබුණි. සෝවියට් සංගමය තුළ නිපදවන ලද ලොරි 15,000කට අධික ප්‍රමාණයත්, අස්වනු නෙලන කොම්බයින් යන්ත්‍ර 9000ත් ඇතුළු විප්ලවයට පෙර රුසියානු ගොවියන් දැන නොසිටි වෙනත් කෘෂි යන්ත්‍ර විශාල සංඛ්‍යාවක් සමූහ ගොවිපලවල වැඩට යොදවා තිබුණේය.

පළමු පස් අවුරුදු සැලසුම් කාලය තුළදී මස් ඇහිරීමේ, ආහාර ටින් කිරීමේ, වෙඬරු හා කේජු පිළියෙළ කිරීමේ වැඩපළවල් හා තෙල් හිඳීමේ අලුත් මෝල් 500කට වැඩි ප්‍රමාණයක නිෂ්පාදන කටයුතු ඇරඹුණි.

### පළමු පස් අවුරුදු සැලැස්මේ ප්‍රතිඵල

සෝවියට් සංගමය කාර්මික රටක් බවට පත් කිරීම පළමු පස් අවුරුදු කාලය තුළදී ඉටුකර ගත් ඉතාම වැදගත් ජයග්‍රහණ වූයේය. ඉන්පසු සෝවියට් සංගමය ප්‍රමාණවත් ආරක්ෂක ශක්තියකින් යුතු බලවත් රටක් බවට පත්විය. කර්මාන්තයන්ට හා ආරක්ෂක කටයුතුවලට අවශ්‍ය උපකරණ සියල්ල නිපදවා ගැනීමට දැන් එයට හැකියාව ලැබී තිබිණි.

සෝවියට් සංගමයේ යුග නිර්මාණක ජයග්‍රහණ ගැන බටහිර ධනපති පුවත්පත් අකමැත්තෙන් මෙන් වර්තා කළහ. පළමු වැනි පස් අවුරුදු සැලැස්මේ කතුවරයන් ආසන්න අතීතයේදී අවමානයට ලක්කළ පුවත්පත් පවා එම ජයග්‍රහණ ගැන වර්ණනා කළහ.

පළමු වැනි පස් අවුරුදු සැලැස්මේ ජයග්‍රහණ ගැන සඳහන් කරමින් 1915 දී සාහිත්‍ය පිළිබඳ නොබෙල් ත්‍යාගය දිනූ ප්‍රංශ ජාතික සාහිත්‍යධරයෙකු වූ රොමේන් රොනල්ඩ් (Romain Ronald) මෙසේ පැවසීය.

**"සෝවියට් සංගමය දැවැන්ත යෝජනා ක්‍රම, ලොකු යන්ත්‍ර සූත්‍ර ඉදිකරනවා පමණක් නොවේ, ඉතාම චමත්කාර දෙය නම් එය මිලියන ගණනින් නව ජනතාවක් හැඩගසමින් තිබීමත්, බියෙන් තොර, සෞඛ්‍ය සම්පන්න ශක්තිමත්, ආත්මාර්ථයෙන් තොර, නව ලෝකයක් පිළිබඳ ප්‍රබල විශ්වාසයක් ඇතිව සිටින ජන පරම්පරාවක් එහෙම පිටින්ම හැඩගැස්වීමය."**

## ධනවාදයේ පිරිහීම...

05 පිටුවෙන්

එහෙත් මේ තත්වය සරල සිනහවකින් බැහැර කළ යුතු තත්වයක් නොවේ. මේ අය මේ විහිළු කරන්නේ රටක ජනතාවක අනාගතය සමඟය. දිනපතා වේගයෙන් කඩාවැටෙන රුපියලේ අගය රැක ගැනීමට ගිලාබසින ආර්ථිකය ගොඩ ගැනීමට මොවුනට දැක්මක් නැත. එවැනි වුවමනාවක්ද නැත. රටේ ප්‍රධානතම ප්‍රශ්න පසෙක තබා අතිරේක කරුණු ගැන විහිළුකීම දැන් සම්ප්‍රදාය වී තිබේ. සැබෑවටම විහිළු කරන අයගේ විහිළු නිසා ජනතාව සිනාසුණද මොවුන්ගේ විහිළු රටක 'ගමනක අවසානය' කියාපාන බේදවාචකයන්ය. 'යකාගේ හැටියට විමානේ' යැයි කියමනක් අපේ ජනවහරේ තිබේ. දැන් ඒ අනුව ඡන්දදායකයාට ගැලපෙන ධනපති නායකයන් හා උන්ටම ගැලපෙන අන්ධ බැතිමතුන් වැනි ආධාරකරුවන් පිරිසක්ද බිහිවී සිටිති. ඒ දෙකටම හරියන නිලධාරීහු කිහිපදෙනෙක්ද සිටිති. තත්වය මෙසේ වූ විට ධනවාදයේ මුදුනම කුඩු වූ විට පොදු තත්වය ගැන කතාකිරීමෙන් පලක් නැත. මේ ලාංකේය ධනවාදයේ අවසානය පෙන්වන ජවනිකා බව ඉතා පැහැදිලිය.

දැන් කළ යුත්තේ කුමක්ද? දේශපාලන විහිළු නැරඹීම පසෙක තැබිය යුතුය. රටක හොඳ නරක තේරෙන සමාජ ප්‍රශ්න පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති පිරිස් තවම සිටිති. ඔවුනට විශාල වගකීමක් තිබේ. ඒ වමේ හා ප්‍රගතිශීලී බලවේග සමග අත්වැල් බැඳගෙන මේ දේශපාලන නාඩගම්වල අවසානය සනිටුහන් කර, රටේ අනාගතය ගොඩනැගිය හැකි දැක්මක් ඇති, බරක්-හරයක් ඇති වගකීම් සම්පන්න නායකත්වයක් වෙත රට බාරකිරීමය. මේ සඳහා වන අවස්ථාවක් දැන් මතුවී තිබේ. දේශපාලනයේ මෙම විගඩම් බේදවාචකයකින් කෙළවර වීමට පෙර පරාජය කිරීමත්, ජනතාවට වගකියන ජනතාවාදී පාලනයක් නිර්මාණය කිරීමට පෙළගැසීමත් කාගේත් වගකීමය.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




සිංගප්පූරු ගිවිසුමට එරෙහිව...



ඉන්දියාවේදී මාක්ස්වාදී කො.ප. නායකයින් හමුවී...




උපාධිධාරීන්ට රැකියා ඉල්ලා...




ජාතික විද්වත් සමුළුව රත්නපුරේදී...



20 ගැන ජනතාව දැනුවත් කරමින්...



ජනහමු දස දහසින් - හෝමාගමදී...

# බදු පැනවීම මගින් අසාධාරණයට ලක් වූ කලාකරුවන්ට වහා සහන ලබා දිය යුතුයි

## ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා

නව බදු පනත මගින් කලා සාහිත්‍ය නිර්මාණකරුවන්ට මත පනවා ඇති ඉහළ බදු හේතුවෙන් කලා හා සංස්කෘතික ක්ෂේත්‍රයට බරපතළ පහරක් එල්ල වී ඇතැයි පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා ජනතා විරෝධය හේතුවෙන් ආණ්ඩුව කලාකරුවන්ගේ බදු අඩු කරන බවට පොරොන්දු වුවද ප්‍රායෝගික මැදිහත්වීමක් නොමැති බැවින් බදු පැනවීම මගින් පීඩනයටත් අසාධාරණයටත් පත් කලකරුවන්ට වහා සහන ලබාදීමට කඩිනම් මැදිහත් විය යුතු බවට ආණ්ඩුවට අවධාරණය කළේය.

ඔහු මෙසේ පැවසුවේ පසුගිය 04වැනි දින සමාජවාදී කලා සංගමය විසින් ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ බිමල් රත්නායක සහෝදරයා මෙසේද පැවසීය.

"අපේ රටේ අති බහුතරයක් කලාකරුවන් නිර්මාණ කටයුතුවල නියැළෙන්නේ ස්වෝත්සාහයෙන් අතින් වියදම් කරගෙන. විශාල ආදායමක් උපයන නිර්මාණ සිදුවෙන්නෙත් නැහැ. විශාල උද්ඝෝෂණ නිසා ආණ්ඩුවට සිදුවුණා මෙම බදු වැරදියි කියලා පිළිගන්න. නමුත් බදු අහෝසි කරන්න ආණ්ඩුව පනතට සංශෝධන ගෙනා යුතුයි. මේ වනතුරු සංශෝධන කැබිනට් මණ්ඩලයට ඉදිරිපත්වෙලා නැහැ.

අපේ රටේ රංගන ශාලා ආශ්‍රිතවද බරපතළ ගැටලු ගණනාවක් මතුවෙලා තිබෙනවා. මේ වනවිට ජාතික කලාභවන අලුත්වැඩියා කටයුත්තක් සඳහා යැයි පවසමින් වසා දමා තිබෙනවා. ජෝන්ද සිල්වා සමරු රඟහලේ දෙවන පියවරේ ඉදිකිරීම් කටයුතු සඳහා මිලියන එක්දාස් දෙසිය ගණනක් ලැබෙන්නේ නැති බව හොඳටම විශ්වාසයි. ආණ්ඩුවට අවශ්‍ය වෙලා තිබෙන්නේ කොළඹ වටිනා ඉඩම් සංස්කෘතික ආයතන ඉවත් කරලා ව්‍යාපාරිකයින්ට පවරාදීම බව පැහැදිලියි. පහුගිය කාලයේ සෞන්දර්යය විශ්වවිද්‍යාලය ඒ ප්‍රදේශයෙන් ඉවත් කරන්නත් විශාල උත්සාහයක් ගත්තා. නමුත් සිසුන්ගේ උද්ඝෝෂණ නිසා දැනට එය වළක්වාගෙන තිබෙනවා.



මේවනවිට ආණ්ඩුව ක්‍රියාත්මක වෙන ආකාරය දැක්කාම පෙනෙන්නට තිබෙන්නේ අපේ රටේ ජනතාව කලාව හා සංස්කෘතික ක්ෂේත්‍රයන්ගේ ඈත් කිරීමට කටයුතු කරගෙන යන බවක්. මේ ප්‍රශ්න සම්බන්ධයෙන් කලාකරුවන් පමණක් නොව ජනතාව පුරවැසියන් විදිහට මැදිහත් විය යුතුව තිබෙනවා."

මෙම මාධ්‍ය හමුවේදී ප්‍රවීණ රංගන ශිල්පිනී දීපානි සිල්වා, ප්‍රවීණ සාහිත්‍යවේදී කීර්ති වැලිසරගේ, ප්‍රවීණ වේදිකා නාට්‍ය ශිල්පී ලලිත් රාජපක්ෂ සහ ප්‍රවීණ රංගන ශිල්පී ජගත් මනුවර්ණ යන මහත්ම මහත්මීහුද අදහස් දැක්වූහ.

# නව පළාත් සභා ගොඩනැගිල්ල ගැන විගණනයක් අවශ්‍යයි

## ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික ලක්ෂ්මන් නිපුණආරච්චි සහෝදරයා

බිලියන 07ට වැඩි මුදලක් වැය කළ බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිල්ලේ වියදම් පිළිබඳව බලවත් සැක උපදවන බැවින් ඒ පිළිබඳව සම්පූර්ණ විගණනයක් කරන්නැයි ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික ලක්ෂ්මන් නිපුණආරච්චි සහෝදරයා විගණකාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියේය. ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 16වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

වැඩිදුරටත් කරුණු දැක්වූ ලක්ෂ්මන් නිපුණආරච්චි සහෝදරයා මෙසේද කියා සිටියේය.

"බස්නාහිර පළාත් සභාවේ පුටු සිද්ධියට අදාළව ආණ්ඩුකාරතුමා වාර්තාවක් ලබාදීලා තිබෙනවා. ඒ අනුව පුටු ගෙන්වීම නතර කොට තිබෙනවා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ සඳහා මැදිහත්වූ සියලු දෙනාට අපගේ ස්තුතිය පිරිනමනවා. මේ මගින් සිදුවීමට ගිය විශාල මූල්‍ය අලාභයක් වළක්වන්න හැකිවීම පිළිබඳව අපිට නිරාමිස සතුටක් තිබෙනවා. පළාත් සභා සුදු අලියෙක් බව මේ සිදුවීමෙනුත් ඔප්පු කළා. ජනතා මුදල් නාස්තිය පැහැදිලිව රටට පෙන්නුවා. ජනතා නියෝජිතයින් ලෙස පෙනී ඉන්න මහ ඇමතිත් එ.ජා.ප.යේ, ශ්‍රීල.නි.ප.යේ, පොහොට්ටුවේ මන්ත්‍රීවරුනුත් පුටු ගෙන්වීම සාධාරණීකරණය කිරීමට උත්සාහ ගත්තා. මෙම සිදුවීම් හෙළිදරව් නොවුණා නම් මේ වන විටත් ලක්ෂ හයේ පුටු ගෙන්වලා කොමිස් එකත් අරගෙන.

පුටු සිදුවීමෙන් පසුව මෙම දූෂිත ගනුදෙනුවලින් ගැලවිලා යන්න ඉඩ තියන්න හොඳ නැහැ. ඒ නිසා සම්පූර්ණ විගණනයක් කරන්න කියලා අපි විගණකාධිපතිවරයාගෙන් ඉල්ලනවා. ඒ



විතරක් නෙවෙයි, පළාත් සභාව මගින් සිදුවුණු කොන්ත්‍රාත්, ගිවිසුම් සියල්ල පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා විගණකාධිපතිවරයාගෙන් ඉල්ලනවා."

මෙම අවස්ථාවට ජ.වි.පෙ. බස්නාහිර පළාත් සභා මන්ත්‍රී නීතිඥ සුනිල් වටගල සහෝදරයා සහ පළාත් සභා මන්ත්‍රී නන්දන පද්මකුමාර සහෝදරයාද සහභාගි වූහ.

# අධ්‍යාපනය විකිණීමට එරෙහිව සමාජවාදී ශිෂ්‍ය සංගමයෙන් උද්ඝෝෂණ

## සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා

අධ්‍යාපනයට ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන වෙන් නොකරන නිසා විශ්වවිද්‍යාලවල හා පාසල්වල අර්බුද රැසක් මතුවී ඇති බවත් ආණ්ඩුව රාජ්‍ය අධ්‍යාපනය බිඳවට්ටවමින් හා අධ්‍යාපනය විකුණීමට කටයුතු කරමින් සිටින බවත් ප්‍රකාශ කළ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා ඊට එරෙහිව ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය සමඟ එක්ව ඉදිරි මාසය පුරා ජනතා දැනුවත් කිරීම්, උද්ඝෝෂණ සිදුකිරීමට සමාජවාදී ශිෂ්‍ය සංගමය බලාපොරොත්තු වන බව කියා සිටියේය.

ඔහු මේ බව ප්‍රකාශ කර සිටියේ පසුගිය 27වැනිදා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ මාධ්‍ය හමුවකදීය. වැඩිදුරටත් අදහස් දක්වමින් රංගන දේවප්‍රිය සහෝදරයා මෙසේද කීය.

"තව මාසයකින් පාර්ලිමේන්තුවට අයවැය ඉදිරිපත්වීමට නියමිතයි. නමුත් අපි දකිනවා පහුගිය අයවැයේදී මේ ආණ්ඩුව දුන් පොරොන්දු ගණනාවක් ඉෂ්ට කරන්න සමත්වෙලා නැති බව. ඒවගේම ආණ්ඩුව මේ වනවිට රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ උපාධි විකිණීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමින් යනවා. පසුගිය දශක කිහිපය පුරාම අපේ රටේ ආණ්ඩුවේ මූලික වුවමනාව වුණේ නිදහස් අධ්‍යාපනය රැකගන්නවා වෙනුවට අධ්‍යාපනය පුද්ගලීකරණය කරන එක. විශේෂයෙන්ම 1977 පස්සෙ ආණ්ඩු නිදහස් අධ්‍යාපනයට වෙන්කළ ප්‍රතිපාදන කප්පාදු කරමින් ඒ සඳහා වූ බර දෙමාපියන් හා ශිෂ්‍යයන් මත පටවමින් තිබෙනවා. ඕනෑම රටකදී ජනතාවට අධ්‍යාපනය ලබාදීම රාජ්‍ය



වගකීමක්. නමුත් ලංකාවේදී අධ්‍යාපනය ලබාගැනීම ජනතාවගේ වගකීමක් බවට පත්කර නිදහස් වෙන්න ආණ්ඩුව උත්සාහ කරනවා.

මෙම මාධ්‍ය හමුවට සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික කමිටු සාමාජිකයින් වන ජීවන හරිස්චන්ද්‍ර සහෝදරයා සහ දසුන් උදාර සහෝදරයාද සම්බන්ධ විය.


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.